අඛණ්ඩවම 15 වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත ★★★



# ලංකාදීප

30 වැනි කාණ්ඩය | 178 වැනි පත්‍රය | පිටු 22 යි කොටස් 2 යි | විජය ප්‍රකාශනයකි | 2021 අප්‍රේල් මස 2 වැනිදා සිකුරාදා | අන්තර්ජාල ලිපිනය - www.lankadeepa.lk | මිල රුපියල් 30.00යි

## අනාගත රාජ්‍ය බලය ඇල්ලීම අරමුණයි
## ශ්‍රීලනිප ඓතිහාසික මාතලේ ප්‍රකාශය නිකුත් කරයි

## සහරාන්ගේ මත අන්තර්ජාලයෙන් ප්‍රචාරය කළාට-දේශන තිබ්බාට 4 ක් අත්අඩංගුවට

10 වැනි පිටුව බලන්න

# පොල්තෙලේ විස තෙවැනි පරීක්ෂණයෙනුත් තහවුරුයි



(යොහාන් හාසුර)

පෞද්ගලික සමාගම් හතරකින් ආනයනය කර එම සමාගම්වලට අයත් ගුදම්වල ගබඩා කර ඇති පොල්තෙල්වල 'ඇෆ්ලටොක්සීන්' නමැති පිළිකා කාරකය අඩංගු බවට තෙවැනි පරීක්ෂණයෙන් ද තහවුරු වී තිබේ.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර ආරක්ෂණ ඒකකය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මීට පෙර කළ පරීක්ෂණවලින් එම පොල්තෙල්වල 'ඇෆ්ලටොක්සීන්' නමැති පිළිකාකාරකය අඩංගු බවට තහවුරු වූ අතර පසුව කාර්මික තාක්ෂණ ආයතනය කළ තත්ව පරීක්ෂණවලින් ද එය තහවුරු වී ඇත.

6 වැනි පිටුවට

# රවි ඇතුළු අටදෙනාට නඩු දෙකෙන්ම ඇප

## දැඩි කොන්දේසි: රට ගමන් තහනම්



(මනෝප්‍රිය ගුණසේකර)

මහ බැංකුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ අවස්ථා දෙකක දී රජයට රුපියල් කෝටි 5200 ක පමණ පාඩු සිදුකිරීමේ චෝදනා මත දින 14ක කාලයක් රිමාන්ඩ් බාරයේ රඳවාගෙන සිටි හිටපු මුදල් අමාත්‍ය රවී කරුණානායක මහතා ඇතුළු විත්තිකරුවන් 08 දෙනා නඩු දෙකෙන්ම දැඩි කොන්දේසි සහිත ඇප මත මුදා හැරීමට ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුලු දෙකකින්ම ඊයේ (01) නියම කෙරිණි.

6 වැනි පිටුවට

# අවුරුදු සමයේ සෞඛ්‍ය නීති කැඩුවොත් තුන්වැනි රැල්ලක අවදානමක්



සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

10 වැනි පිටුව බලන්න

# පොල්තෙල් තවත් කන්ටේනරයක් දඹුල්ලෙන් අල්ලයි

16 වැනි පිටුව බලන්න

## දෙවැනි මාත්‍රාවට එන්නත් ලෑස්තියි

10 වැනි පිටුව බලන්න

# ලොරියක් හඟගලදී ත්‍රීරෝදය මත පෙරළී කාන්තාවෝ 3 ක් මරුට

නුවරඑළිය වැලිමඩ මාර්ගයේ හඟගල ලොකු වංගුව ප්‍රදේශයේ දී ඊයේ (1) දහවල් ධාවනය වෙමින් තිබූ ත්‍රිරෝද රථයක් මතට භාණ්ඩ ප්‍රවාහන ලොරි රථයක් පෙරළීමෙන් ත්‍රිරෝද රථයේ ගමන් ගත් කාන්තාවන් තිදෙනකු මියගිය බව නුවරඑළිය පොලිසිය කියයි.

ත්‍රිරෝද රථය පැදවූ රියැදුරු සිද්ධියෙන් බරපතළ තුවාල ලබා නුවරඑළිය රෝහලට ඇතුළත් කර ඇති බව ද පොලිසිය පවසයි.



ලක්ෂ්මී ලියනගේ (මව)



කවීශා සෙව්වන්දි (දුව)



මිලිනා වෛද්‍යරත්න

6 වැනි පිටුවට



කුඩුපට්ටම් වී ගිය ත්‍රිරෝද රථය
(ඡායාරූපය - ෂෙල්ටන් හෙට්ටිආරච්චි)

## මහ සිකුරාදා අදයි



ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ඇණ ගසා මරණයට පත් කරනු ලැබීමේ දුක්ඛප්‍රාප්තිය සිදුවූ මහ සිකුරාදා දිනය අදට යෙදී ඇත.

දේව පුත්‍රයාණන් අනුස්මරණය කරමින් ලොව පුරා කිතුනු බැතිමත්හු දේවස්ථානවලදී අද ආගමික වතාවත්වල යෙදෙති.

(විශේෂ ලිපියක් 05 පිටුවේ)

*නිමල් ජයශාන්ත - ලංකාදීප ග්‍රැෆික්*

## අවුරුදු උත්සව සංගීත ප්‍රසංග තහනම්

10 වැනි පිටුව බලන්න






## පණ්කජ රුවින්දගේ සරදම




රවිලට ඇප ලැබිලා !
මහේන්ද්‍රනුත් ආවා නම් ඉවරයිනේ !

## අක්ෂිදන සංගමයේ ලක්ෂ 60 ක අවුරුදු දීමනා ගෙව්වාට විමර්ශනයක්

10 වැනි පිටුව බලන්න

## ප්‍රා.ලේකම්-පරිපාලන සේවා පුටු 450 ක් හිස්

## කොවිකොඩිත්තාල් රක්ෂිතය ඩෝසර් කර හේනක් හදද්දී මාට්ටු


Call us and we will tell you why

Enrolling now for Australian qualifications in

- Business
- Bio Medical Science
- Engineering
- Computer Science
- Design

23 years in Sri Lanka, managed by one of the largest education companies in the world Navitas Limited

Hotline : 077 3000 900
Colombo | Kandy | www.acbt.net
acbt

Keells Deals

මේ අවුරුදු සමයේ තෝරාගත් අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා 30% දක්වා වට්ටම්



Nexus Member Deals 30% Off
රු. 154
ඉතිරිය රු.66
සාමාන්‍ය මිල රු.220
එලිෆන්ට් හවුස් ජින්ජර් බියර් ලී.1.5



35% Off
රු. 78
ඉතිරිය රු.42
සාමාන්‍ය මිල රු.120
මන්චි ලෙමන් පෆ් ග්‍රෑම් 200



මෙම දීමනා 2021 අප්‍රේල් 2 සිට අප්‍රේල් 8 දක්වා වලංගු වේ.
*කොන්දේසි සහිතයි.

ඔබට සැමදා වැඩි ඉතිරියක්

Keells

# ඊ.ටී.අයි අධ්‍යක්ෂ සිවුදෙනාට ඇප

(නිමන්ති රණසිංහ)

**මුදල් විශුද්ධිකරණ පනත ප්‍රකාරව වරදක් සිදුකළැයි රක්ෂිත බන්ධනාගාර ගත කර සිටි ඊ.ටී.අයි. සහ ස්වර්ණමහල් ජුවලර්ස් (පුද්ගලික) සමාගමේ හිටපු අධ්‍යක්ෂවරුන් සිවුදෙනා එක් අයකුට රුපියල් ලක්ෂ 10 බැගින් වූ ශරීර ඇප දෙකක් මත මුදාහැරීමට කොළඹ කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ (01) නියෝග කළේය.**

මෙලෙස ඇපමත මුදාහැරුණේ ජීවික එදිරිසිංහ, නාලක එදිරිසිංහ, අසංක එදිරිසිංහ සහ දීපා එදිරිසිංහ යන අයවලුන්ය.

සැකකරුවන් සම්බන්ධයෙන් වූ ඇප නියෝගය දෙමින් මහේස්ත්‍රාත්වරයා සඳහන් කළේ ඇප පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව සැකකරුවන්ට එරෙහිව ප්‍රබල නඩුවක් තිබීම පමණක් සලකා බැලීම ප්‍රමාණවත් නොවන බවය.

පැමිණිල්ල වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුව මහේස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලා සිටියේ මේ සම්බන්ධයෙන් අදාළ ලියකියවිලි තවමත් ලබාගෙන නොමැති බැවින් සැකකරුවන් තවදුරටත් රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස ය.

කෙසේ වෙතත් ඇප පනත ප්‍රකාරව සැකකරුවන් තවදුරටත් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට එය ප්‍රමාණවත් හේතුවක් නොවන බව මහේස්ත්‍රාත්වරයා සඳහන් කළේය.

සැකකරුවන් වෙනුවෙන් අධිකරණයේ පෙනීසිටි ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න මහතා සඳහන් කර සිටියේ ඇප පනතේ 14 වන වගන්තියට අදාළව කරුණු ඉදිරිපත් කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව අපොහොසත් වී ඇති බවය.

තුන්වන සැකකරු වෙනුවෙන් අධිකරණයේ පෙනීසිටි නීතිඥවරුන් සඳහන් කර සිටියේ තම සේවාදායකයාට එරෙහිව ක්ෂණිකව මුදල් විශුද්ධිකරණ කිරීමේ නඩුවක් ගොනුකර තිබීම ගැටලු සහගත වන බවය.

එසේම සැකකරුවන් රක්ෂිත බන්ධනාගාර ගත කර තැබීමම පමණක් ඉලක්ක කරගනිමින් මුදල් විශුද්ධිකරණ පනත පැමිණිල්ල විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති බවද නීතිඥවරු අධිකරණයට පැවසූහ.

මෙම විමර්ශනයට අදාළ අධිකරණ විගණන වාර්තාව අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට භාරදීමට සැකකරුවන් තවමත් අපොහොසත් වී ඇතැයි නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් අධිකරණයේ පෙනීසිටි රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ ලක්මිණි ගිරිහාගම මෙනෙවිය සඳහන් කළාය.

සැකකරුවන් වෙනුවෙන් ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න, නීතිඥ අසේල රැකව, නීතිඥ රාමලිංගම් රන්ජන්, නීතිපති නිර්මාල් කොඩිතුවක්කු සහ නීතිඥ ෂෙහාන් සිල්වා යන මහත්වරු අධිකරණය හමුවේ පෙනී සිටියහ.

# කුඩු-ගිනිඅවි එක්ක ඉන්දියාවේදී ඇල්ලූ ධීවරයන් සම්බන්ධ පරීක්ෂණ ඇරඹෙයි

(ඉන්දිකා රාමනායක)

හෙරොයින් කිලෝ 300 ක් හා ඒ කේ 47 වර්ගයේ ස්වයංක්‍රීය ගිනි අවි 5ක් සමග ඉන්දියාවේ දී අත්අඩංගුවට ගත් මෙරට ධීවරයන් සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවය, ශ්‍රී ලංකාවේ පිහිටි ජාත්‍යන්තර පොලිස් (ඉන්ටර්පෝල්) ශාඛාව, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය ඉන්දීය බලධාරීන් සමග එක්ව පරීක්ෂණ ආරම්භ කර ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පැවසීය.

අත්අඩංගුවට ගත් මෙම පිරිස කවුද? ඔවුන් ජාත්‍යන්තර ජාවාරම්කරුවන්ගෙන් මෙම මත්ද්‍රව්‍ය තොග ලබාගත්තේ කෙසේද?, ශ්‍රී ලංකාවට මේවා එවීමට කටයුතු කළ ජාවාරම්කරුවන් කව්ද? යන්න හෙළි කර ගැනීමට එරට බලධාරීන් සමග එක්ව පරීක්ෂණ කටයුතු සිදුකර කරන බව ද ඒ මහතා කීය.

ඉකුත් පස්වැනිද සහ 15 වැනිද දකුණු ඉන්දියාවේ මිනිකෝයි දූපත ආසන්නයේ දී ඉන්දීය වෙරළ ආරක්ෂක බළකාය යාත්‍රා හතරක් සමග ධීවරයන් 25 දෙනකු අත්අඩංගුවට ගත් බව ඉන්දීය බලධාරීන් නිල වශයෙන් දැනුම් දී ඇති බව ද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

ඉකුත් 5 වැනිද හෙරොයින් කිලෝ 200 ක් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් හලාවතින් මුහුදු ගිය බෝට්ටුවක් සමග ධීවරයන් හයදෙනකු අත්අඩංගුවට ගෙන තිබිණි.

වෙරළ ආරක්ෂක බළකායේ නිලධාරීන් එම බෝට්ටුව අත්අඩංගුවට ගැනීමට යෑමේ දී එහි සිටි පිරිසක් බෝට්ටුවේ තිබූ මත්කුඩු තොගය මුහුදට දමා ඇති බවට ඉන්දියාවේ නිල නිවේදනයේ සඳහන් වන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කීය.

ඉකුත් 15වැනි දින ධීවර යාත්‍රා 3 ක් සමග 19 දෙනකු අත්අඩංගුවට ගෙන ඇති බවත් ඉන් "රවි හංසි" නමැති යාත්‍රාවෙන් හෙරොයින් කිලෝ 300 ක්, ඒ.කේ. 47 ස්වයංක්‍රීය වර්ගයේ ගිනි අවි 5 ක් අත්අඩංගුවට ගත් බවත් ඔවුන් නිලවශයෙන් දැනුම් දුන් බව ද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

මේවා තංගල්ල හා දකුණු ප්‍රදේශයෙන් ධීවර කටයුතු සඳහා ගිය බෝට්ටු බව ද හෙතෙම සඳහන් කළේය.

# රනිල්ගේ පරිසර දේශනය ඉරිදා

(අංජුල මහික වීරරත්න)

ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරය ඇතුළු වැසි වනාන්තරයත් රැම්සාර් තෙත් භූමි ඇතුළත් වනාන්තර සහ පරිසරයත් ආරක්ෂා කර ගැනීමේ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ හිටපු අග්‍රාමාත්‍ය සහ එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා ඉරිදා (04) විශේෂ ප්‍රකාශය කරනු ලබයි.

සිංහරාජයේ රකින හරිත වසර වැඩපිළිවෙළ ද මෙහිදී ඉදිරිපත් කිරීමට නියමිතය.

එක්සත් ජාතික පක්ෂයේද වර්ණය වන කොළ පැහැය යොදා ගනිමින් ඉදිරියේ දී රට පුරා වනාන්තර ඇතුළු පරිසර ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති සැලසුම් ද අනාගත එජාප රජයක් යටතේ කිසිවකුටත් බලපෑම් කළ නොහැකි පරිසර ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම පිළිබඳව ද රනිල් වික්‍රමසිංහ මහතා සිය විශේෂ ප්‍රකාශයේ දී සඳහන් කරනු ඇතැයි අපේක්ෂිතය.

# 'වන සංහාරයට එරෙහිව පෙළගැසෙමු' සිතුවම් ඇඳීම සිරිකොතදී අද

(අංජුල මහික වීරරත්න)

'දැවැන්ත වන සංහාරයට එරෙහිව පෙළ ගැසෙමු' තේමාවෙන් සිතුවම් ඇඳීමේ වැඩ සටහනක් සිරිකොත එක්සත් ජාතික පක්ෂ මූලස්ථානය ඉදිරිපිට දී අද (2) උදේ 9.30ට පැවැත්වෙයි.

පරිසරයට ආදරය කිරීම සම්බන්ධයෙන් අනාගත පරපුර දැනුවත් කරලීම අරමුණු කර ගනිමින් මෙම සිතුවම් නිර්මාණය කරන බවත්, අනතුරුව සිරිකොත පක්ෂ මූලස්ථානය ඉදිරිපිට ඒ සිතුවම් ප්‍රදර්ශනය කිරීමට නියමිත බවත් එජාප සභාපති වජිර අබේවර්ධන මහතා පැවසීය.

එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහලේකම් පාලිත රංගෙ බණ්ඩාර, සභාපති වජිර අබේවර්ධන යන මහත්වරු ද මේ අවස්ථාවට සහභාගී වෙති.

# කළුතර අධිකරණය ළඟ සුදු ඉර මතදී කොස්තාපල් යටකළ යතුරුපැදිකරු පළාගිහින්

(පානදුර සුමිත් ප්‍රේමතිලක)

කළුතර දකුණ පොලිසියේ රථවාහන අංශ නිලධාරියකු ඊයේ (01) දහවල් පදික මාරුව මතදී යටකර යතුරුපැදිකරුවකු පලාගොස් ඇතැයි කළුතර දකුණ පොලිසිය කියයි.

අනතුරෙන් තුවාල ලබා ඇත්තේ කළුතර පොලිසියේ රථවාහන අංශ කොස්තාපල් දිසානායක (6063) යන නිලධාරියා බව පොලිසිය කියයි.

# යතිවර ප්‍රණාම උළෙලක් මහර ජයසුමනාරාමයේදී

මහර විහාරාධිපති සංගමය සංවිධානය කරන යතිවර ප්‍රණාම සහ ගිහි ගෞරව නාම තිළිණ ප්‍රදානෝත්සවය මහර සිරි ජයසුමනාරාමයේ දී ඉරිදා (4) පස්වරු 3.00ට පැවැත්වේ.

රටට ශාසනයට මහත් කැපවීමෙන් කටයුතු කළ යතිවරයාණන් වහන්සේලාට සහ සංගමයේ විහාරස්ථාන දායක සභාවල දායක දායිකාවන්ට ගෞරවනාම එහිදී පිරිනැමේ.

විහාරස්ථාන 30 ක අධිපති හිමිවරුන්ගේ සහභාගිත්වයෙන් මෙම උළෙල සිදුකෙරේ.

# 'දිවියට අත්වැලක්' වෙළෙඳ ප්‍රදර්ශනය බණ්ඩාරගමදී

(බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ)

"දිවියට අත්වැලක්" වෙළෙඳපොළ ප්‍රදර්ශනය හෙට 3 දින සිට මෙම මස 11 දක්වා බණ්ඩාරගම මෛත්‍රී ශාලා භූමියේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇතැයි බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සභාපති දේවේන්ද්‍ර පෙරේරා මහතා පැවසීය.

ප්‍රදේශයේ සුළු හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයන්ගේ නිර්මාණ, ආහාර වර්ග, රෙදිපිළි, ආදී සියලු දේ මෙම වෙළෙඳ ප්‍රදර්ශනය භූමියෙන් මිලදී ගත හැකි බව සභාපතිවරයා පැවසීය.

සභාපතිවරයා ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලයේ සංකල්පයක් මත ක්‍රියාත්මක වෙළඳ ප්‍රදර්ශනය දිනපතා සවස 2 සිට රාත්‍රී 10 දක්වා පැවැත්වීමට කටයුතු යොදා ඇත.


## ප්‍රසිද්ධ වෙන්දේසිය

වැලිබල් ෆිනෑන්ස් වෙතින් ලබාගත් ණය මුදල් ගිවිසගත් පරිදි නොගෙවීම හේතුවෙන් එකී ණය පහසුකම් සඳහා සුරැකුම් ලෙස උකස් තබන ලද රන් භාණ්ඩ 2021 අප්‍රේල් 30 දින නො: 310, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ දී පෙ.ව. 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**කිසිදු දැනුම්දීමකින් තොරව වෙන්දේසි කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය වැලිබල් ෆිනෑන්ස් සතු වේ.**

**කළමනාකරු - රන් ණය අංශය, වැලිබල් ෆිනෑන්ස්**
නො: 310, ගාලු පාර, කොළඹ 03.

වැලිබල් ෆිනෑන්ස්


# ජ'පුර වොයිස් විවාද තරගය 3-4 දෙදින

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නිල විකාශන ඒකකය වන 'ජපුර වොයිස්' හි විවාද අංශය සංවිධානය කරන අන්තර් විශ්වවිද්‍යාල තරගාවලිය 'ප්ලෑෂ් ඔෆ් මයින්ඩ් - 2021' තරගාවලිය ලබන අප්‍රේල් මස 03 සහ 04 දෙදින සූම් තාක්ෂණය ඔස්සේ පැවැත්වේ.

එහි අවසන් මහ තරගය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී අප්‍රේල් මස 10 වැනිදා පැවැත්වීමට නියමිතය.

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන මෙම තරගාවලියට රාජ්‍ය සහ පෞද්ගලික විශ්වවිද්‍යාල 11 ක් නියෝජනය කරමින් විවාද කණ්ඩායම් 43 ක් සහභාගි වෙයි.

මෙවර තරගාවලියේ ප්‍රධානතම අනුග්‍රාහක ලෙස ටයින් ලංකා ස්ටීල් සමාගම කටයුතු කරයි.

# බොක්සිං ශූරයන්ට ශිෂ්‍යත්ව දෙකක්

(මහින්ද නිස්සංක)

තායි බොක්සිං ක්‍රීඩාවෙන් අන්තර්ජාතික පදක්කම් දිනාගත් හඟුරන්කෙත, පල්ලෙබෝවල ද්විතීක විද්‍යාලයේ කසුන් කේ. ගුණවර්ධන ශිෂ්‍යයාට සහ ඩබ්ලිව්. ඩබ්ලිව්. නිමේෂා එල්. කුමාරි ශිෂ්‍යාවට ශිෂ්‍යත්ව දෙකක් මිල්කෝ සමාගම විසින් පිරිනමනු ලැබ ඇත.

ජාත්‍යන්තර පදක්කම් දෙකක් දිනාගත් මෙම සිසුන් දෙදෙනා රටට අත්කර දුන් කීර්තිය අගය කරමින් එම ක්‍රීඩාව ඉදිරියට කරගෙන යෑම සඳහා මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කරන බව මිල්කෝ සමාගමේ සාමාන්‍යාධිකාරී පී. අයි. ඕ. ප්‍රනාන්දු මහතා පැවසීය.

මෙම සිසුන් දෙදෙනාට ශිෂ්‍යත්ව පිරිනැමීමේ උත්සවය මිල්කෝ සමාගමේ සභාපති ලසන්ත වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී අද (02) පෙරවරු 10.00 පැවැත්වේ.

# දිස්ත්‍රික්ක හයක අද දැඩි උණුසුම්

(ඩයනා උදයංගනී)

දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයකට අද (2) දැඩි උණුසුම් කාලගුණ තත්ත්වයක් අපේක්ෂා කරන බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පවසයි.

ඒ අනුව පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, මොනරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල වැඩි උණුසුමක් පවතිනු ඇතැයි එම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශකයෙක් පැවසීය.

මේ හේතුවෙන් එම දිස්ත්‍රික්කවල ජනතාව ප්‍රමාණවත් තරම් ජලය පානය කිරීමත්, එළිමහනේ සිදුකරන අධික වෙහෙසකාරී කටයුතුවලින් වැළකී සිටීමත් කළ යුතු බව එම ප්‍රකාශකයා සඳහන් කළේය.

හැකි පමණ සෙවණ ඇති ස්ථානවල ගත කිරීම කළ යුතු අතර වැඩිහිටියන් සහ රෝගීන් සම්බන්ධයෙන් විමසිලිමත් විය යුතු බව ද ඔහු කීවේය.

එමෙන්ම අද (2) දිනයේදී දිවයිනේ බොහෝ පළාත්වලට වැසි රහිත කාලගුණ තත්ත්වයක් අපේක්ෂා කරන බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පවසයි.

# පදනම් ආයතනය මැලේසියාවේ ලින්කන් විශ්ව විද්‍යාලය සමග ගිවිසුමක්

ශ්‍රී ලංකා පදනම් ආයතනය උසස් අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම සඳහා මැලේසියාවේ ලින්කන් විශ්වවිද්‍යාලය සමග පසුගියද ගිවිසුම්ගත විය. විවිධ ක්ෂේත්‍රවලට අයත් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාඨමාලා මෙහෙයවීම සඳහා ආයතන 25ක සහභාගිත්වය ලබාගැනීමට ද මෙහිදී ක්ෂේත්‍ර කිහිපයකට අදළ ජාත්‍යන්තර උපාධි පිරිනැමීමට මැලේසියාවේ ලින්කන් විශ්වවිද්‍යාලය කටයුතු යොදා ඇත.

දෙපාර්ශ්වය අතර ගිවිසුම් අතර අත්සන් කිරීම පසුගියද සිදු වූ අතර එම අවස්ථාවට මැලේසියා විශ්වවිද්‍යාලයේ නියෝජිතයන් පදනම් ආයතනයේ නියෝජිතයන් ඇතුළු උසස් අධ්‍යාපන ආයතන නියෝජිතයෝ ද සහභාගි වූහ.

# ඉංජිනේරු ආයතනයේ වාර්ෂික සැසිය 8දා

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ 114 වැනි වාර්ෂික සැසිවාරය මෙම 8 ද පෙරවරු 8.00ට කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ හිටපු පීඨාධිපති මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාස මහතා මෙහි ප්‍රධාන දේශනය පවත්වන අතර මහාචාර්ය එස්.බී.එස්. අභයකෝන් හිටපු අභියාචනාධිකරණ විනිසුරු ආචාර්ය රංජිත් රණරාජා විශ්‍රාමික කර්නල් නිශ්ශංක එන්. විජේරත්න යන මහත්වරු සභාව ඇමතීමට නියමිතය.


ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ හිටපු සභාපති ඉංජිනේරු මහාචාර්ය ටී.එම්. පල්ලෙවත්ත මහතාට සම්මාන හා සහතික ප්‍රදානයක් සිදු කිරීමට ද නියමිතය.


ගිරිඋල්ල
පන්නල ප්‍රධාන බස්පාරට නුදුරින් බෝපිටියේ පර්චස් 15.5 යි. පර්චසය රු.80,000/- යි.
ගල්ගමුව
නගර සීමාවේ ඔට්ටුකුලම වැවට මායිම්ව නළ ජලය-විදුලිය සහිත තැනිතලා බිම් කොටස් 10 ක්. පර්චසය රු.22,500/- සිට
සම්පත් - 077 306 55 70

PETS AVAILABLE FOR SALE NOW AT







HitAd.lk
www.hitad.lk






ගලේවෙල ලංකා බැංකු ශාඛාව
ඩිජිටල් පහසුකම් සමගින්
අපේම නව නිවහනකට

වඩාත් කාර්යක්ෂම සේවාවක් සමග නූතන බැංකුකරණ අත්දැකීම් ඔබ වෙත සමීප කරමින්,
සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුගතව,
**ගලේවෙල ලංකා බැංකු ශාඛාව, අද දින පෙ.ව. 9.05ට යෙදෙන සුබ මොහොතින්**
අපේම නව නිවහනක දී විවෘත වන වගයි.

**නොමඳ සේවයක් ලබන්නට අපෙන් සුහද ඇරයුම්!**

ලංකා බැංකු ගොඩනැගිල්ල, කුරුණෑගල පාර, ගලේවෙල.
දුරකථන: 0662 288 258 ෆැක්ස්: 0662 289 262

1975 BOC CALL CENTRE
www.boc.lk
ප්‍රධාන කාර්යාලය, "ලංකා බැංකු චතුරස්‍රය", අංක 01.
ලංකා බැංකු මාවත, කොළඹ 01.
ලංකා බැංකුව BOC
ජාතියේ මහා පහන් ටැඹ

| ලොතරැයිය | විස්තර | ප්‍රතිඵල |
|---|---|---|
| ශනිදා වාසනාව | 3570 වැනි වාරය, අප්‍රේල්: 01 වැනිදා, ඉංග්‍රීසි අකුර - V | 11-28-44-69 |
| වාසනා සම්පත | 1672 වැනි වාරය, මාර්තු : 22 වැනිදා, ඉංග්‍රීසි අකුර - M | 02-58-62-84 |
| අද කෝටිපති | 1240 වැනි වාරය, අප්‍රේල්: 01 වැනිදා, ඉංග්‍රීසි අකුර - D | 01-02-08-29 |
| ලග්න වාසනාව | 3121 වැනි වාරය, අප්‍රේල්: 01 වැනිදා, ලග්නය: වෘශ්චික | 07-16-50-58 |
| ජාතික සම්පත | 1105 වැනි වාරය, මාර්තු : 17 වැනිදා, ජයග්‍රාහී ලග්නය - වෘෂභ | 5-0-8-1-3-5 |
| මහජන සම්පත | 4438 වැනි වාරය, මාර්තු 26 වැනිදා, ඉංග්‍රීසි අකුර - G | 1-7-3-5-7-8 |
| සංවර්ධන වාසනාව | 423 වැනි වාරය, අප්‍රේල්: 01 වැනිදා, දෛව අංකය - 07, ඉංග්‍රීසි අකුර - H | 29-33-44 |
| කෝටිපති කප්රුක | 708 වැනි වාරය, මාර්තු: 28 වැනිදා, ඉංග්‍රීසි අකුර - L | 27-41-61-69 |
| දරු දිරි සම්පත | 30 වැනි වාරය, මාර්තු: 14 වැනිදා, ඉංග්‍රීසි අකුර - M | 30-53-56-83 |
| සුපර් බෝල් | 1414 වැනි වාරය, අප්‍රේල්: 01 වැනිදා, ඉංග්‍රීසි අකුර - V | 25-52-61-72 |
| ජයෝදා | 1746 වැනි වාරය, මාර්තු: 31 වැනිදා, ඉංග්‍රීසි අකුර - B | 18-47-53-69 |
| සුපිරි වාසනා | 1586 වැනි වාරය, මාර්තු 26 වැනිදා, සුපිරි අංකය - 13 | 03-21-31-52 |
| සසිරි | 065 වැනි වාරය, මාර්තු: 31 වැනිදා | 02-05-31 |
| මෙගා පවර් | 800 වැනි වාරය, මාර්තු 26 වැනිදා, සුපිරි අංකය: 16, ඉංග්‍රීසි අකුර - A | 31-39-77-78 |
| සෙවණ | 320 වැනි වාරය, මාර්තු: 07 වැනිදා, ඉංග්‍රීසි අකුර- F | 31-46-51-61 |
| ධන නිධානය | 475 වැනි වාරය, මාර්තු 26 වැනිදා, ජයග්‍රාහී අක්ෂරය - L | 49-61-73-75 |
| ගොවිසෙත | 2733 වැනි වාරය, මාර්තු 26 වැනිදා, ඉංග්‍රීසි අකුර- D | 08-16-44-61 |
| සම්පත ලග්න වරම | 01 වැනි වාරය පෙබ: 25 | E-9-4-9-4-6-8; ලග්න වරම: කටක 42-64-76 |

# වයස පහළොවේ සිසුවිය ගැබිනියක කළැයි
# දහතරේ සිසු පෙම්වතා අත්අඩංගුවට

(ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය)

**නාත්තන්ඩිය අධ්‍යාපන කලාපයට අයත් කනිෂ්ඨ විද්‍යාලයක ඉගෙනුම ලබන 15 හැවිරිදි සිසුවියක ගැබිනියක් කළ බව කියන 14 හැවිරිදි සිසුවකු පෙරේදා (30) අත්අඩංගුවට ගත් බව මාරවිල මූලස්ථාන පොලිසිය කියයි.**

මෙම සිසුවා 15 හැවිරිදි සිසුවියගේ පෙම්වතා බවද කියති.

මාරවිල මූලස්ථාන පොලිසියේ ළමා හා කාන්තා කාර්යාංශයේ කණ්ඩායමක් මාරවිල පොලිස් වසමේ පිහිටි සිසුවියගේ නිවසට ගොස් ඇය පොලිස් බාරයට ගෙන ඇත.

පොලිස් කණ්ඩායම නිවසට ගොස් ඇයගේ මවුපියන්ට මේ බව දැනුම් දෙන තෙක් තම දියණිය ගැබිනියක බව ඔවුන් දැන නැති බවත් සිසුවියද මෙය රහසක්ව තබාගෙන ඇති බවත් පොලිසිය කියයි.

මෙම සිසුවිය ඉගෙනීමට දක්ෂ බවත් ඇය පාසලේ ශිෂ්‍ය නායිකාවක බවත් සඳහන්ය.

පාසල් සිසුවිය ගැබිනියක වීම සම්බන්ධයෙන් ඇය ඉගෙනුම ලබන පාසලේම ඉගෙනුම ලබන 14 හැවිරිදි සිසුවකු සැකපිට අත්අඩංගුවට ගත් බව පොලිසිය සඳහන් කරයි.

මෙම සිසුවා සමග 15 හැවිරිදි සිසුවිය ප්‍රේම සම්බන්ධයක් පවත්වාගෙන ගොස් ඇති බවද පොලිසිය කීය.

වෛද්‍ය පරීක්ෂණයක් සඳහා සිසුවිය රෝහල්ගතකර ඇත.

සිසුවිය ගැබිනියක කළේ ඇයගේ පෙම්වතා බව කියන 14 හැවිරිදි සැකකාර සිසුවාද කියා තහවුරු කර ගැනීමට සිසුවිය දරුවා ප්‍රසූත කිරීමෙන් පසුව ඩී.එන්.ඒ. පරීක්ෂණයක් සිදුකිරීමට පොලිසිය කටයුතු යොදා ඇත.

සැකකාර සිසුවා මාරවිල මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

වයඹ සහ උතුරුමැද පළාත් බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ සහ පුත්තලම දිසා බාර නියෝජ්‍ය පොලිස්පති නිමල් පෙරේරා යන මහත්වරුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ හලාවත කොට්ඨාසය බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ලලිත් රෝහණ ගමගේ සහ නාත්තන්ඩිය සහකාර පොලිස් අධිකාරි පර්සි මයිකල් යන මහත්වරුන්ගේ විශේෂ උපදෙස් මත මාරවිල මූලස්ථාන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ධම්මික විජේසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති කාන්තා පොලිස් පරීක්ෂිකා අයිරංගනී මහත්මිය ඇතුළු පොලිස් කණ්ඩායමක් මේ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ පවත්වාගෙන යයි.

# වාහන 4 ක් එකට හැපී හය දෙනෙක් රෝහලේ



(ආරච්චිකට්ටුව ලලිත් නවරත්න)

**හලාවත-පුත්තලම ප්‍රධාන මාර්ගයේ ආරච්චිකට්ටුව ප්‍රධාන නගරය ආසන්නයේදී පෙරේදා (31)දා පස්වරුවේදි සිදුවූ රිය අනතුරෙන් තුවාල ලබා හය දෙනෙකු හලාවත රෝහලට ඇතුළත් කළ බව ආරච්චිකට්ටුව පොලිසිය පවසයි.**

තුවාල ලැබූ පිරිසෙන් එක් අයෙකුගේ තත්ත්වය බරපතළ බව රෝහල් ආරංචිමාර්ග කියයි.

පුත්තලම සිට හලාවත ගමන් කළ වෑන් රථයක් හලාවත සිට පුත්තලම දෙසට ගමන් කළ ත්‍රිරෝද රියක් හා යතුරු පැදියක් මෙලෙස අනතුරට ලක්ව ඇති බව පොලිසිය කියයි.

ප්‍රදේශවාසීන්ගේ මැදිහත්වීමෙන් තුවාලකරුවන් රෝහලට ගෙන ගොස් ඇත. වෑන් රථයේ දෙදෙනකු ගමන්කර ඇති අතර ත්‍රීරෝද රථයේ තිදෙනකු සහ යතුරුපැදියේ දරුවකු ඇතුළු තිදෙනෙකු ගමන් කර ඇති බවද පොලිසිය කියයි.

වෑන් රථය මාර්ගයෙන් ඉවතට පැන පෙරළී ගොස් මාර්ගය අසල නවතා තිබූ පාපැදියක ගැටී ඇත.

එම අවස්ථාවේදී පාපැදියේ සිටි අඹුසැමි යුවළක් පැන දිවි ගලවාගන ඇති බවත් පාපැදිය එම වෑන් රථයට යටවී ඇති බවත් පොලිසිය පවසයි.

ආරච්චිකට්ටුව පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අනුරාධ හේරත් මහතාගේ උපදෙස් මත රථවාහන අංශයේ ස්ථානාධිපති උපපොලිස් පරීක්ෂක මංගල මහතාගේ ප්‍රධානත්වයෙන් පොලිස් සැරයන් 41360 ඥානරත්න, ගුණසේකර 60582 යන නිලධාරීහු අනතුර සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වති.

# මාරක රිය අනතුරේ පරීක්ෂණ සාධාරණ නෑ
# මිනිය පාර මැද තබා ඥාතීහු උද්ඝෝෂණ

(ත්‍රිකුණාමලය අමදෝරු අමරජීව)

**මෝටර් රථ අනතුරකින් මියගිය පුද්ගලයකුගේ මරණය සම්බන්ධයෙන් පැවැත්වූ පරීක්ෂණය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව පවසා එයට සාධාරණයක් කරන්නැයි ඉල්ලා මියගිය අයගේ දේහය සර්ධාපුර ප්‍රදේශයේ මහා මාර්ගයේ තබා ඊයේ (1) ඥාතීහු උද්ඝෝෂණ කළහ.**

මේ නිසා ත්‍රිකුණාමලය-මහනුවර ප්‍රධාන මාර්ගය පැය කිහිපයක් ගමනාගමන කටයුතු සඳහා අවහිර වී තිබුණි.



සිරුර සහිත පෙට්ටිය මහා මාර්ගයේ තබා

මෙම අනතුරෙන් මියගොස් ඇත්තේ ත්‍රිකුණාමලය - මහනුවර පාරේ, කප්පල්තුරෙයි පදිංචි ඒ.එම්.අන්තෝනි සාමි නමැත්තකු බව පොලිසිය කියයි.

පසුගිය මාර්තු 30 වැනිදා මීගමුව සිට ත්‍රිකුණාමලය බලා ධාවනය වෙමින් තිබූ මෝටර් රථයකින් මෙම අනතුර සිදුවී ඇතැයි පොලිසිය කියයි.

සැකකරු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ඇපමත මුදාහැර ඇති බව පොලිසිය කීය.

මෙම උද්ඝෝෂණය හේතුවෙන් පිට ප්‍රදේශවලින් මහනුවර පාර ඔස්සේ ත්‍රිකුණාමලයට පැමිණෙන වාහන මගී ප්‍රවාහන සේවා හා ත්‍රිකුණාමලයෙන් නුවර පාර ඔස්සේ පිටවන වාහන පැය කිහිපයකට මෙලෙස ධාවනය නොවීය. මගී ජනතාවට පැය කිහිපයක් යනතෙක් මහමග සිටීමට සිදුවිය.

ත්‍රිකුණාමල මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක දුමින්ද රාජපක්ෂ, උප්පුවේලි පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ගයාන් ප්‍රසන්න මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් මාර්ගයේ ආරක්ෂාවට පොලිස් කණ්ඩායම් කිහිපයක් යොදවා තිබුණි.

උද්ඝෝෂණය අතරට පැමිණි ත්‍රිකුණාමලය පොලිස් අධිකාරි I ප්‍රසන්න බ්‍රාහ්මනගේ මහතා මෙසේ කීය. අපේ පැත්තෙන් සැකකරුට එරෙහිව සියලු චෝදනා අධිකරණයට ඉදිරිපත් කළා. සැකකරුගේ පාර්ශ්වයෙන් නීතිඥයන් ඇප ඉල්ලුවා. ඒ අනුව ගරු අධිකරණය ඇප ලබාදුන්නා. පොලිසියේ අය මෙහිදී ඔය අය කියන විදිහේ වරදක් කරලා තියනවා නම් ඒ සඳහා විමර්ශනයක් කරලා දඬුවම් දෙන්නත් කටයුතු කරනවා යැයි කී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා එම අවස්ථාවේ කතා කරද්දී ඇතැම් අය ඔය බොරු බයිලා යනුවෙන් බාධා කිරීමද සිදුවිය.

## තිස්ස හේවාවිස්සගේ හිනා වැස්ස



හෝ හෝ හඬ ගෙන දෙන පුරයකලු. විශාලැති මුල්ලක්ලු. අන්සතු මගක හිසට නිවසක් සලසන වැඩක්ලු. සෙවිල්ලට දහසකුත් පහෙන් එකකට වැඩි ගණනක් ගෙනත් දුන්නේ හිසට සෙවණ සලසන අධිකාරිලු. නගරයේ කතිරයකට ඩෝං ගිහින්ලු. ආවාලු. ගෝරනාඩු කළාලු. සියල්ල අරගෙන ගියාලු. ඒ බලය පාමින්ලු. දැන් වහලට හුළංලු. තවත් කතිරයක් මේ අවනඩුව දම්සක් ලේනාට වගේම තව තවත් තැන්වලට දන්වලාලු.

(පුෂ්පකුමාර මල්ලවආරච්චි)

# කොරෝනා නීතියෙන් බේරෙන්න දවස් 6 ක්ම මඟුල් කාලා

(තිහගොඩ උපසේන ලියනගම)

දකුණු පළාතේ ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයකු වූ ඔහුට සිටියේ එකම දියණියකි. ඇය ඔහුගේම ආයතනයක ගිණුම් ලිපිකාරිණියක ලෙස සේවය කළාය.

රූමත් අයට පසුගියදා විවාහ යෝජනාවක් ඉදිරිපත් වූයේද ව්‍යාපාරික පවුලකිනි. දෙපාර්ශ්වයේ සෝදිසි කිරීම් මත විවාහයට දින යෝජනා වූ අතර විවාහ මංගල්‍යයට ආරාධිතයන් කැඳවීම ගැටලුවක් විය.

දෙයියෝ සාක්කි

ඒ ඔහුගේ සැලසුමට අනුව මංගල්‍යයට කැඳවිය යුතු පිරිස තුන්සියයක් පමණ වුවත් කොරෝනා වසංගත නීතිය අනුව එය පනහකට අඩුකළ යුතු වීමයි. ඒත් ඉන් එක් නමක්වත් ඉවත් කළ නොහැකි බව ඔහුට වැටහින. මේ පිළිබඳව තම බිරිඳට කී විට වාණිජ විෂය උගන්වන ගුරුවරියක වූ බිරිඳ කීවේ මංගල්‍ය දින හයක් පවත්වා එක දිනකට පනහ බැගින් කැඳවන ලෙසය.

ඇයගේ උපදේශනයෙන් දිරිමත්වූ ඔහු දින හයක් මංගල්‍ය පැවත්වෙන බවට දින යොදා හිතවතුන්, සේවකයන් ඥතීන් කැඳවූ අතර මැද දිනයක පෝරුවේ චාරිත්‍ර ආදිය යොදා ගත්තේය.

මෙසේ දින පහක්ම මනාලයා මනාලියගේ නිවෙස් රැඳී සිටි අතර ඔවුන් මධුසමය සඳහා ගියේ දින පහකට පසුවලු.

Rs.120සිට



Rs.250සිට

ටයිටස් ස්ටෝර්ස්

0777384671



Dialog අවුරුදු

නව Dialog Television පෙරගෙවුම් සම්බන්ධතා සමග

චැනල් 40කටත් වඩා වැඩියෙන් දෙන

දවසටම රු.8/-*

පෙරළිකාර පැකේජය

නව සම්බන්ධතාවය රු. 5,990/-

දිවයින පුරා පිහිටි ඕනෑම Dialog නියෝජිත වෙළඳසලකින් ලබාගත හැක.

මෙම දීමනාව අප්‍රේල් 30 දක්වා පමණි.

*බදු සහ කොන්දේසි අදාළ වේ.

ශ්‍රී ලංකාවේ අංක 1 ටෙලිවිෂන් රසාස්වාදය

Dialog TELEVISION

# ආපනශාලාවල හොර මගඩි වැළැක්වීමට අවදියෙන් සිටිමු

ලංකාදීප
2021 අප්‍රේල් මස 2 වැනිදා සිකුරාදා
කර්තෘ මණ්ඩලය : 2448321, 2423919, 5383237 ෆැක්ස් : 2438039, 2479240, 5383240 බෙදාහැරීම් : 2479625 ෆැක්ස් : 2479650
දැන්වීම් :2479540, 5383383, 5330330, ෆැක්ස් : 2314864, 2479595

අන්තර්ජාලයේ ප්‍රථම සිංහල පුවත්පත
වෙබ් අඩවි- -: වෙබ්.ලංකාදීප.ලංකා-
www.lankadeepa.lk

ආහාර නිෂ්පාදනයේදී එකම පොල්තෙල් කිහිප වරක් භාවිත කිරීම වැළැක්වීමේ අරමුණෙන් කළුතර දිස්ත්‍රික්කයේ ආපන ශාලා වැටලීමේ මෙහෙයුමක් දියත් කළ බව කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය උදය රත්නායක මහතා ප්‍රකාශ කළ බව සඳහන් පුවතක් අප පුවත්පත ඉකුත් ද වාර්තා කළේය.

කළුතර දිස්ත්‍රික්කයේ පමණක් නොව මුළු රටේම දියත් කළ යුතු මෙහෙයුමකි. 'ආරෝග්‍යා පරමා ලාභා' හෙවත් නිරෝගි බව උතුම්ම ලාභය යැයි අදහන සංස්කෘතියක් ඇති රටක් වුවද අපගේ ආහාර සංස්කෘතිය මිනිසුන් රෝගීන් කරන තත්ත්වයට පත් කර ඇති බව සත්‍යයකි. හෝටල්වල ඉතිරි වන මස්, මාළු හා එළවළු, මාළු පාන්, එළවළු රොටි බවට පත්ව යළිත් හෝටලයේ ෂෝකේස් එකට එන බව නොරහසකි. කන බොන කෑමෙන් පවා ගසා වඩා ගැනීමක් නොකරනු ඇතැයි මෙරට අහිංසක ජනතාව විශ්වාස කරති. එහෙයින් සැකයකින් බියකින් තොරව එම ආහාර අනුභව කරති. වැළඳුණ රෝගය කුමක් දැයි නොදැනම මිය යාමේ ඉරණම රටේ පුරවැසියාට බාර ගැනීමට සිදු වී තිබේ.

ආහාර නිෂ්පාදනයේදී එකම පොල් තෙල් කිහිප වරක් භාවිත කිරීම වැළැක්වීමේ අරමුණෙන් කළුතර දිස්ත්‍රික්කයේ ආපන ශාලා වැටලීමේ මෙහෙයුම කාලීන අවශ්‍යතාවක් ඉටු කිරීමක් ලෙස අර්ථ දැක්විය යුත්තේ ඉහත පරිසරය තුළය. ආහාර නිෂ්පාදනයේදී එකම පොල් තෙල් කිහිප වතාවක් භාවිත කිරීමෙන් එහි දිගු මේද ද්‍රව ඇති විය හැකි බවත් එය පිළිකා, හෘද රෝග, බෝ නොවන රෝග ඇති වීමට ඇති හැකියාව වැඩි බවත් කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කර තිබිණි.

ඒ අනුව මෙරට ජනයා කොතරම් අනාරක්ෂිත පරිසරයක දිවි ගෙවන්නේ ද යන්න වටහාගත හැකිය.

වෙළෙන්දගේ අරමුණ ලාභ ලැබීම වේ. ලාභ නොලබන්නේ නම් ඕනෑම ව්‍යාපාරයක් පවත්වාගෙන යා නොහැකිය. එහෙත් ලාභ ඉපයිය යුත්තේ දැහැමින් සෙමින්ය. සාධාරණවය. එසේ නොමැතිව මහ ජනයා සෙමින් සෙමින් වළපල්ලට දක්කමින් එමගින් තම මඩිය තර කර ගන්නේ නම් ඒවා නීතියෙන් වැළැක්විය යුතුය.

ආහාර නිෂ්පාදනයේදී එකම පොල් තෙල් කිහිප වරක් පාවිච්චි කිරීමේ හැකියාව තිබේ. ඒ බවත් සාමාන්‍ය ජනයාට පහසුවෙන් හඳුනා ගැනීමට ද නොහැකිවීම සාමාන්‍ය තත්ත්වයකි. තමන් මේ කන්නේ, බොන්නේ පිළිකා රෝගය තමන් තුළ ඇති කිරීමට සමත් භයානක විසක් බව බොහෝ දෙනා නොදනිති. එමෙන්ම මෙම ආහාර ගැනීමෙන් තමන් හෘද රෝගියකු බවට පත් වන බව බොහෝ දෙනෙක් නොදනිති. බෝ නොවන රෝගවල පහසු ගොදුරක් බවට පත් වන බව නොදැන සාමාන්‍ය ජනයා ආහාර අනුභව කරති. මෙය ශාපලත් ඉරණමකි. එහෙත් තම මඩිය තර කර ගැනීමේ නොතිත් ආශාවෙන් මඩනා ලද සිත් ඇති චෞර වෙළෙන්දන් නිසා එම ශාපලත් ඉරණම නොදැනුවත්වම තමන්ගේ ඉරණම ලෙස බාර ගැනීමට රටේ ජනතාවට සිදු වී තිබේ.

රටක් සංවර්ධනය කිරීමේදී අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ එම රට තුළ නිරෝගී මිනිස් පරපුරක් සිටීමය. ජනයා විවිධ ලෙඩ රෝගවලින් පෙළෙන්නේ නම්, එම රෝගවලින් නැගෙන වේදනාවන්ගෙන් යුතුව දිවි ගෙවන්නේ නම් එය සංවර්ධනයට බාධාවකි. මන්දයත් සංවර්ධන ව්‍යාපෘති වල යෙදවිය යුතු ධනය ලෙඩ රෝග සුවපත් කිරීම සඳහා යෙදවීමට සිදු වන හෙයිනි. අවධානය ඒ දෙසට යොමු කිරීමට සිදු වන හෙයිනි. නිරෝගි බව පරම ලාභයක් බවට අර්ථ දැක්වෙන්නේ ඒ අනුවය. රෝගී නොවී සිටින්නේ නම් රෝග සුවපත් කිරීමට මුදල් යෙදවිය යුතු නැත.

ජගත් පරිමාණයෙන් ගත් කල්හිද ලෝකය පාලනය කරනු ලබන්නේ බහුජාතික සමාගම් දෙකක් මගිනි. එක් බහුජාතික සමාගමක් වන්නේ ආහාර නිෂ්පාදන සමාගම්ය. අනෙක් බහුජාතික සමාගම් වන්නේ ඖෂධ නිෂ්පාදන සමාගම්ය. මෙම සමාගම් එකිනෙකා මත පදනම් වෙමින් තම පැවැත්ම සරිකර ගනිති. ගමේ පුංචි හෝටලය දක්වා පැතිර ඇත්තේ මෙම විෂම චක්‍රය ම වේ.

එළැඹෙමින් තිබෙන්නේ උත්සව සමය වේ. කොරෝනා අනතුර තුළ ද සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත්වලට යටත්ව බොහෝ දෙනෙකු නගර වෙත පැමිණිය හැකියි.

එය බලාපොරොත්තු විය යුතු තත්ත්වයකි. මජර වෙළෙන්ද ඉලක්ක කරනු ලබන්නේ එම ජනතාවය. ඒ අනුව ආහාර නිෂ්පාදනයේදී එක් වරක් නොව සිය දහස් වාරයක් වුවත් තම එකම තෙල් තාච්චිය පාවිච්චි කිරීමට ඉඩ තිබේ. කළුතර දිස්ත්‍රික් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා පවසන්නේ එබඳු ස්ථාන සොයා වැටලීම් සිදු කරන බවය. අපගේ ඉල්ලීම වන්නේ ජනතාවගේ නාමයෙන් මුළු රටේම මෙම වැටලීම් සිදුකරන ලෙසය.

# කිව්ද දැක්ම

# රාජ්‍යයේ වෙළෙඳපොළ අර්බුදය

**අප වෙළෙඳපොළට ලබා දිය යුතු වැදගත්කම කොපමණක් ද සහ රාජ්‍යයට ලබා දිය යුතු වැදගත්කම කොපමණක් ද යන්න අපේ රටේ දේශපාලනයේ මතුවන විශේෂ ගැටලුවක් බව ඉතාමත් පැහැදිලිය. මේ ගැටලුව මේ ආකාරයෙන් මතුවුණේ 1977 අලුත් ආර්ථික ක්‍රමයක් මේ රටේ ඇතිවීමත් සමගය. මෙහිදී ඉදිරිපත් වෙන කාරණය වන්නේ වෙළෙඳපොළ ස්වාධීන ආකාරයෙන් ක්‍රියාත්මකවීමට ඉඩ ලබා දිය යුතු ද එසේත් නැතහොත් රාජ්‍යයේ භාරකාරිත්වය සෑම ක්ෂේත්‍රයකටම විසිර විය යුතු ද යන්නයි. එකල අපේ රටේ වාමාංශික ව්‍යාපාරය යම් තරමකින් අදට වඩා ශක්තිමත් තත්ත්වයක සිටි නිසා රාජ්‍යයේ ආධිපත්‍ය සහ පංගුකාරිත්වය පිළිබඳව විශාල සාකච්ඡාවක් 80 දශකයේ අධ්‍යයන ක්ෂේත්‍රයේ මතුවී තිබුණ බව ද සත්‍යයක්ය. මගේ මිතුරන් වන සුමනසිරි ලියනගේ සහ ධම්ම දිසානායක වැනි අය අදටත් රසබර අයුරින් දේශනා කරන්නේ මේ වාමාංශිකවාදයේ තිබූ පැරැණි උත්තේජනයන්ය. එහෙත් ඒ උත්තේජනයෙන් රටක ආර්ථිකය කළමනාකරණය කළ හැකි ද යන්න මෙහිදී අපේ සාකච්ඡාවට භාජන විය යුතු වැදගත්ම කාරණයය.**

මෙවර කිව්ද දැක්මෙන් මා සාකච්ඡා කරන්නේ රාජ්‍යයේ සහ වෙළෙඳපොළේ වර්තමානයේ මතුවී තිබෙන ගැටලුකාරිත්වයන් කීපයක් පිළිබඳවය.

මේ දවස්වල මාධ්‍ය අවකාශයේ මතුවී ඇති පොල්තෙල් පිළිබඳ ගැටලුව, හාල් පිළිබඳ ගැටලුව, සීනි පිළිබඳ ගැටලුව වැනි ගැටලු ගණනාවක්ම පදනම් වෙන්නේ මා මුලින් සඳහන් කළ රාජ්‍යයේ භූමිකාව සහ වෙළෙඳපොළේ භූමිකාව පිළිබඳවය. නිදහස් වෙළෙඳාම මගින් සමාජයට බරපතළ අනර්ථයක් ගොඩනැගෙන බව සමහරු තර්ක කරන්නේ මාධ්‍ය අවකාශයේ ඉහත සඳහන් සිද්ධි පිළිබඳව ඉදිරිපත් වෙන කතා ඇසූ විටය. වෙළෙඳපොළ නිසි පරිදි කළමනාකරණයක් සිදු කළ නොහැකි නම් මේ ගැටලුකාරිත්ව මගින් රටේ ජනතාවට විශාල ව්‍යසනයක් ඇතිවිය හැකි බව මේ බොහෝ කතාවලින් පෙන්නුම් කරන පිළිතුරය. එහෙත් මේවායේ සැබෑ තත්ත්වය කුමක්ද යන කාරණය පිළිබඳ නිසි තක්සේරුවක් මේ ගැටලු ගැන සමාජ මාධ්‍යයේ කතා කරන අයට තිබේද යන්න ගැන විමසිය යුතු බව මගේ අදහසය.

තවත් පැත්තකින් ප්‍රමිති ආයතනය පාරිභෝගික අධිකාරිය ශ්‍රී ලංකා රේගුව වැනි ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳව පසුගිය දවස්වල මතු වූ සමහර සංවාද සම්බන්ධ වෙන්නේ ද මේ කියන රාජ්‍යයේ වගකීම සහ වපසරිය යන ක්ෂේත්‍රයටය. මේ කාරණා දෙකට අමතරව තවත් සමහරුන් සිතන්නේ වෙළෙඳපොළ යනු රාජ්‍යයේ බරපතළ පාලනයට ලක් කළ යුතු ක්ෂේත්‍රයක් කියාය.

වෙළෙඳාම කියන්නේම යම් ආකාරයක අපුලක් ඇති දෙයක් ලෙසින් අපේ රටේ සමහරුන් සිතන බවත් සත්‍යයක්ය. ඒ කියන්නේ වෙළෙන්ද කියන්නේ යම් ආකාරයක නොකළ යුත්තක් කරන තැනැත්තෙක් වගේ හැඟීමක් සමහරුන් තුළ ඉතිහාසයේ සිටම පැවති බවය. ඒ අය සිතන්නේ වෙළෙන්ද යනු හැම විටම 'මංපහරන්නෙකු' වගේ කල්පනාවක්ය. මේ නිසාම අපේ සමාජයේ තිබෙන මුල් බැසගත් අදහසක් ලෙසින් මේ කියන වෙළෙඳපොළට එරෙහිවීමේ තර්කය පදනම් වන බව පැහැදිලිය.

## ජාතිකවාදයට එක්වුණු වෙළෙඳපොළ විරෝධය

වෙළෙඳපොළ මගින් සමාජයේ නිෂ්පාදන සහ සේවා බෙදීයාම සහ සෑම සාමාජිකයකුටම ස්වකීය හැකියා සමගින් එයට (වෙළෙඳපොළට) සම්බන්ධවීමේ ඉඩ පවතින බව ද මෙහිදී මතුවෙන ප්‍රතිතර්කය. එහෙත් අපේ සමාජයේ සාම්ප්‍රදායිකව පිළිගැනී ඇති වෙළෙඳාම නුසුදුසු වැඩක් වේ යැයි මතය සමාජයේ විශාල කලාපයක විසිරී පවතින අදහසක් බව ඉතාමත් පැහැදිලිය.

වෙළෙඳපොළ සහ රාජ්‍යය පිළිබඳව මේ දිනවල මතුවී තිබෙන සංවාදය ද තරමක් විමර්ශනයට භාජන කළ යුතු බව මගේ අදහසය. එසේ විමර්ශනශීලි විය යුත්තේ මේ කාරණය පිළිබඳව සමාජයේ තිබෙන යටි අදහස් බරපතළ ආකාරයේ මිථ්‍යා දෘෂ්ටීන් රාශියක් නිර්මාණය කිරීමේ හැකියාව තිබෙන නිසාය. තවත් පැත්තකින් මේ වෙළෙඳපොළ විරෝධය සහ රාජ්‍ය ආරක්ෂණවාදය සමහර අවස්ථාවල ජාතිකවාදය සමගින් සම්බන්ධ වෙන අවස්ථා නිතරම පෙන්නුම් කෙරෙමින් තිබේ. තත්ත්වය එසේ වූ විට එවැනි ජාතිකවාදී කෝණයකින් වෙළෙඳපොළ දෙස බැලීමෙන් සිදු කරන බලපෑම ද ඉතාමත් බරපතළ බව අප හොඳින් අත් දැක ඇති කාරණයක්ය. මේ නිසාම මේ ගැටලුව (රාජ්‍යයේ සහ වෙළෙඳපොළේ භූමිකාව) පිළිබඳව සාකච්ඡා කිරීම ඉතාමත් වැදගත්ය.

මේ සම්බන්ධව මතුවී ඇති පළමු වැදගත් කාරණයක් වන්නේ රජයේ සමහර ආයතන මගින් සිදුවිය යුතු නියාමනය මීට වඩා ශක්තිමත් කළ යුතු බවය. ඒ මතය ඉදිරිපත් කරන අයට අනුව රජයේ නියාමනය සිදුකරන ආයතනවල ශක්තිමත්භාවය නොමැතිවීම නිසා අද වන විට බරපතළ ආකාරයේ පරිසර හා ආර්ථික හානි සිදුවෙමින් පවතින බව ඉදිරිපත් වී ඇත. මේ අදහස පළල් අර්ථයෙන් සලකා බැලීමේ දී යම් සත්‍යයක් ඒ තුළ තිබෙන බව ද පැහැදිලිය. එහෙත් රාජ්‍ය නියාමනය මගින් පමණක් වෙළෙඳපොළ සම්බන්ධයෙන් සිදුකළ හැකි බලපෑම කොපමණක් ද යන්න පැහැදිලිව තවමත් අප කවුරුවත් දන්නේ නැත" නියාමනය කියන්නේ සම්පූර්ණයෙන්ම වෙළෙඳපොළ ආකෘති කඩා වැටෙන්නට ඉඩ හරින ආකාරයෙන් තද පාලනයක් ඒ ඒ ක්ෂේත්‍රවල ගොඩනැගීම යැයි සමහරුන් කල්පනා කරන බව ද සත්‍යයක්ය. ජනතාවගේ ජීවන අවශ්‍යතා අතරින් පරිසර සාධකයට විශේෂ තැනක් ලබා දිය යුතු බව සත්‍යයක්ය. එහෙත් මෙහිදී අවධානයට ගත යුතු කාරණය වන්නේ ඒ පරිසර සාධකය ආරක්ෂා කිරීම ඌනතිවාදයක් ලෙසින් එක් අන්තයකට පමණක් තල්ලුවීමෙන් සිදුවෙන්නේ සියලු ආකාරයේ සංවර්ධන උත්සාහයන් අඩපණවීම බවය. මානව ශිෂ්ටාචාරය පුරා පෙන්නුම් කෙරෙන මිනිසා සහ පරිසරය අතර පවතින සම්බන්ධතාව ස්ථානගත කළ යුතු ඉසව්ව පිළිබඳ ගැටලුකාරිත්වය මේ ප්‍රශ්නය සමගින් ගැට ගැසී ඇති බව පැහැදිලිය.



**ඇතැමෙක් කියන්නේ වෙළෙඳපොළ යනු සම්පූර්ණයෙන්ම රාජ්‍යයේ පාලනය තුළ තබා ගත යුතු දෙයක් කියාය. විශේෂයෙන්ම මා මුලින් කියූ වාමාංශික ව්‍යාපාරයේ දැනට ශේෂවී ඇති බුද්ධිමතුන් පිරිසක් මේ අදහස ඉදිරිපත් කරන බව පෙනී යන කාරණයකි. ඔවුන් අදහස් කරන්නේ රටේ සම්පත් ආරක්ෂා කරගනිමින් රාජ්‍යයේ පාලනය යටතේ සිදුකරන මධ්‍යගත පාලනයක් මිස වෙළෙඳපොළට නිදහසේ සැරිසරන්නට ඉඩ ලබා දීම වැරදි ක්‍රියාවක් බවය. මේ අදහස දේශපාලනයක් ලෙසින් 70 දශකයේ රට තුළ විශාල ආන්දෝලනයක් ඇති කළ බව ඉතාමත් ප්‍රසිද්ධ කාරණයක්ය.**

මීළඟට මෙහිදී මතුවී ඇති කාරණය වන්නේ රේගුව වැනි ආයතනවල ඇති අනුමැතිය දීමේ ක්‍රමවේද තවත් ශක්තිමත් කළ යුතු ද යන ප්‍රශ්නයයි. ඒ මගින් පෙන්නුම් කරන්නේ රට තුළට පැමිණෙන භාණ්ඩ නිසි ආකාරයෙන් නියාමනයවීමක් රේගුව වැනි ආයතනවලින් සිදු නොවෙන බවය. මේ අදහස නිසා සමහරුන් කරන්නේ රේගුවේ බලය වැඩිවන ආකාරයට අවශ්‍ය නෛතික තත්ත්වය වර්ධනය කිරීමට යෝජනා කිරීමය. මේ නෛතික ප්‍රතිපාදන තර්කයේ ඇති නොපෙනෙන පැත්තක් වන්නේ ඒ මගින් රටේ වෙළෙඳපොළට සිදුකරන බලපෑම පිළිබඳව පාලනයක් රටට නොමැතිවීමේ අනතුරයි. මේ තත්ත්වය හේතුවෙන් සමහර අවස්ථාවල මතුවී ඇති තත්ත්වය වන්නේ අවශ්‍ය කරන පාරිභෝජන භාණ්ඩ සහ අත්‍යාවශ්‍ය භාණ්ඩ රටට පැමිණීමේ හිඟයක් නිර්මාණය වීමය. තවත් පැත්තකින් මේ රේගුව මගින් පාලනය කිරීමේ ක්‍රමය මගින් මුදාහරින නෛතික බලය නිදහස් වෙළඳාමේ යෙදී සිටින සමහරුන් ඒ ඒ ක්ෂේත්‍ර තුළින් ඉවත් කිරීමටත් හේතු විය හැකි බව මගේ අදහසය.

## ආයෝජන අවස්ථා වර්ධනය කිරීම

තුන්වෙනුව වැදගත් වෙන කාරණය වන්නේ රාජ්‍යයේ නියාමන අධිකාරිත්වයක් නොමැතිව වෙළෙඳපොළක් ගමන් කිරීම ඉතාමත් භයානක බව පිළිගනිමින්ම මේ කියන රාජ්‍යයේ නියාමනය පදනම් කරගත යුතු ක්ෂේත්‍ර කවරේ ද යන්න විමසා බැලීමය. වෙළෙඳාම සම්බන්ධයෙන් සිදුවන මූලික නියාමන ආකෘතියෙන් ඔබ්බට ගොසින් සිදුකරන සමහර සීමා කිරීම් සමහර අවස්ථාවල ඉදිරිපත් වෙන්නේ විදේශ මුදල් රටින් එළියට ගමන් කිරීම පාලනය කිරීමේ පැත්තෙන්ය. එවැනි අවස්ථාවල ඒ ක්‍රියාමාර්ගයේ යම් සාධාරණත්වයක් ඇති බව නිවැරැදිය.


ඇතැමෙක් කියන්නේ වෙළෙඳපොළ යනු සම්පූර්ණයෙන්ම රාජ්‍යයේ පාලනය තුළ තබා ගත යුතු දෙයක් කියාය. විශේෂයෙන්ම මා මුලින් කියූ වාමාංශික ව්‍යාපාරයේ දැනට ශේෂවී ඇති බුද්ධිමතුන් පිරිසක් මේ අදහස ඉදිරිපත් කරන බව පෙනී යන කාරණයකි. ඔවුන් අදහස් කරන්නේ රටේ සම්පත් ආරක්ෂා කරගනිමින් රාජ්‍යයේ පාලනය යටතේ සිදුකරන මධ්‍යගත පාලනයක් මිස වෙළෙඳපොළට නිදහසේ සැරිසරන්නට ඉඩ ලබා දීම වැරදි ක්‍රියාවක් බවය. මේ අදහස දේශපාලනයක් ලෙසින් 70 දශකයේ රට තුළ විශාල ආන්දෝලනයක් ඇති කළ බව ඉතාමත් ප්‍රසිද්ධ කාරණයක්ය. මධ්‍යගතව වෙළෙඳපොළ පාලනය කිරීමේ හැකියාවක් මේ නිදහස් වෙළෙඳපොළ ක්‍රමය තුළ ලෝක පරිමාණව ගත්තත් කළ හැකි දෙයක් නොවන බව මගේ මතයය.

වෙළෙඳපොළ ද එසේත් නැතිනම් රාජ්‍යයේ බරපතළ මධ්‍යගත පාලනය ද යන මේ බෙදීම හුදු වෙළෙඳපොළ ඍජු කාරණාවලින් ඔබ්බට යන අවස්ථාද දකින්නට තිබෙන බව මෙහිදී අපේ අවධානයට ගැනීම මෙහිදී වැදගත්ය. ආයෝජන අවස්ථා වර්ධනය කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා දීමේ අරමුණෙන් ඇති කරන සමහර නෛතික පහසුකම් පවා මේ වෙළෙඳපොළට එරෙහි බලවේග විසින් ප්‍රශ්නයට ලක් කරන අවස්ථා තිබෙන බව මෙහිදී පෙන්නා දිය යුතු කාරණයක්ය. මේ දිනවල සාකච්ඡා මට්ටමින් පවතින වරාය නගරය සඳහා වූ නෛතික පනත් කෙටුම්පත වැනි දේවල් මෙහිදී සමහරුන්ගේ විවේචනයට ලක් වෙන්නේ ඉහත සඳහන් රාජ්‍ය කේන්ද්‍රියවාදයේ බරපතළකම හේතුවෙන්ය.



අපි වෙළෙඳපොළට ලබාදෙන ඉඩ සහ රාජ්‍යයේ වපසරිය පිළිබඳව ඇති මේ පරස්පරය පිළිබඳව පළල් ආකාරයෙන් සිතීම අපේ වැනි රටක ආර්ථික ජයග්‍රහණ වෙනුවෙන් අත්‍යවශ්‍ය බව මගේ යෝජනාවය.

මහාචාර්ය
**චරිත හේරත්**




| පෝය ලබන ගෙවෙන වේලාවන් | | | |
|---|---|---|---|
| දිනය | පෝය | පෝය ලබන වේලාව | පෝය ගෙවෙන වේලාව |
| අප්‍රේ: 04 | අව අටවක | පෙ.ව 4.12 | 05 දා පෙ.ව. 2.59 |
| අප්‍රේ: 11 | අමාවක | පෙ.ව 6.03 | 12 දා පෙ.ව. 8.00 |
| අප්‍රේ: 20 | පුර අටවක | පෙ.ව 00.01 | 21 දා පෙ.ව. 00.43 |
| අප්‍රේ: 26 | පසළොස්වක | ප.ව 12.44 | 27 දා පෙ.ව. 09.01 |

# ජේසුස් වහන්සේගේ කුරුස පූජාව සිහි කරන 'මහ සිකුරාදා'

**කිතුනු ජනවන්දනා ලිතෙහි සුවිශේෂිත දිනයක් වන ජේසුස් වහන්සේගේ කුරුස පත්වීම සිහි කරන මහ සිකුරාදා අදයි. (02) එසේම ජේසුස් වහන්සේ මරණය පරදා උත්ථානය වීම සිහි ගන්වන පාස්කු ඉරිදා මේ මස 04 වැනිදට යෙදී ඇත. පහත ලිපිය පළ වන්නේ ඒ නිමිත්තෙනි.**


**මරණය යන වදන ඇසූ සැණින් අපට සිහිවන්නේ අවසානයක් පිළිබඳව ය. එහෙත් කිතුනු අප එය, සදාතන දෙරටුවට ඇතුළු වන දෙරටුව ලෙස හැඳින්වීම නිවැරැදි ය. පොදුවේ ගත් කල, මරණය වූ කලී, භීතිය ගෙන දෙන්නාවූ වචනයක් මිස, අපගේ සිතට සැනසීමක් ගෙන දෙන්නක් බවට ප්‍රායෝගිකව හැඳින්වීම මගේ අදහසට අනුව නම් කළ නොහැක්කකි. ඒ මන්දයත්, ඕනෑම මිනිසෙකු කැමති වන්නේ තමන්ගේ ආයු කාලය තත්පරයකින් හෝ වැඩිකර ගැනීමට යි. මරණය එනතුරු කිසිවෙක් ආශාවෙන් බලා සිටින්නේ නැත. මෙය මිනිස් ස්වභාවය ලෙස අපි පිළිගත යුත්තෙමු.**

මිනිසාගේ උවමනාවන් අසීමිතය. ඊට සාපේක්ෂව ඔහුට ඇති සම්පත් ප්‍රමාණයත්, කාලයත් සීමිතය. මේ කරුණ නිසාම ඕනෑම මිනිසෙකු තම මරණ මොහොතේදී මෙලොවින් සමුගෙන යන්නේ, ජීවිතයේ කරන්නට තිබුණු තවත් බොහෝ දේ ඉතිරි කරමින්ය. "මම නම් කරන්න ඕන හැම යුතුකමක් ම කළා. දැන් නම් ඉතින් මැරුණත් කමක් නෑ" බොහෝ දෙනෙක් මෙසේ කීව ද, ඒ තුළ පවතින සත්‍යතාවත්, සැබෑ අරුතත් ඊට වඩා වෙනස් එකක් වන්නට බොහෝ දුරට ඉඩ ඇත. මේ ආකාරයෙන් ගත් කල පැහැදිලි වන කරුණක් වන්නේ මරණය මිනිස් මනස තුළ අසුබවාදී සිතුවමක් සිත්තම් කරන බව යි.

මෙසේ "මරණය" යන සංකල්පය ගැන මානුෂික ඇසින් අප විමසා බලද්දී, අප ගැලවුම්කරුවාණන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ, ඔවුන් වහන්සේගේ ඝාතනය විජයග්‍රහණයක් සේ සැලකූ සේක. ''ඔවුන් වහන්සේ, දෙවියන් වහන්සේගේ ස්වරූපය දරූ නමුත්, දෙවියන් වහන්සේ හා සමානත්වය තමන් විසින් බදාගෙනම තබා ගත යුතු වස්තුවකැයි නොසිතා, එය ඉවතලා, සේවකයකුගේ ස්වරූපයක් 'ගෙන, අප හා සමාන මිනිස් කෙනෙක් වූ සේක. මනුෂ්‍යාකාරයෙන් සිටිමින්, ඔවුන් වහන්සේ මරණය, එනම් කුරුසියේ මරණය දක්වා, පහත් වී කීකරු වූ සේක" (පිලිප්පි 2:6-8).

ගොයම් කරල පැසී පහතට බර වන්නේ යම් සේ ද, එසේම ජේසුතුමා, පියාණන් වහන්සේගේ කැමැත්ත උදෙසා, සරලව ම පවසන්නේ නම්, අපට ඇති අසීමිත වූ ආදරය උදෙසා මරණය දක්වා ම පහත් වූයේ ද එසේම ය. ජේසු සමිඳුන්ගේ මරණය ඉතිහාසය වෙනස් කළේ ය. එය පරාජයක් නොව සැබෑ ජයග්‍රහණයකි. මරණය පරදා ලැබූ ජයකි. අප ආදි මවුපියන්ට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව ඉටු කිරීමකි. වඩා ගැඹුරින් සලකා බලන කල, එය "මරණය" යන්නට නව අරුතක් ලබා දීමකි. ඔවුන් වහන්සේ උසස් තැනට පමුණුවනු ලැබුවේ, පහත් වීම තුළ මරණය වැළඳගත් නිසා ය.

ගොයම් කරල පැසී පහතට බර වන්නේ යම් සේ ද, එසේම ජේසුතුමා, පියාණන් වහන්සේගේ කැමැත්ත උදෙසා, සරලව ම පවසන්නේ නම්, අපට ඇති අසීමිත වූ ආදරය උදෙසා මරණය දක්වා ම පහත් වූයේ ද එසේම ය. ජේසු සමිඳුන්ගේ මරණය ඉතිහාසය වෙනස් කළේ ය. එය පරාජයක් නොව සැබෑ ජයග්‍රහණයකි. මරණය පරදා ලැබූ ජයකි. අප ආදි මවුපියන්ට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව ඉටු කිරීමකි. වඩා ගැඹුරින් සලකා බලන කල, එය "මරණය" යන්නට නව අරුතක් ලබා දීමකි. ඔවුන් වහන්සේ උසස් තැනට පමුණුවනු ලැබුවේ, පහත් වීම තුළ මරණය වැළඳගත් නිසා ය.



පාස්කු අභිරහස, කිතුනු අපගේ විශ්වාසයේ කේන්ද්‍රස්ථානය යි. ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය පිළිබඳව අප විශ්වාස කරන්නේ නැතිනම්, අපගේ කිතුනුකමේ කිසිදු හරයක් නැත. ජේසු සමිඳාණෝ උත්ථාන වූයේ නැතිනම්, එතුමාණන් කෙරෙහි විශ්වාසය තැබීමෙන් හෝ කිතු දහම තුළ කියැවෙන සත්‍යතාව පිළිගැනීමේ කිසිදු අරුතක් නැත.

කෙටියෙන්ම පැවසුවහොත්, ජේසු සමිඳුන් උත්ථාන නොවූයේ නම්, කිතු දහමක් අද දක්වා පවතින්නට හැකියාවක් නොමැත. එය හුදෙක් තවත් එක් ඝාතනයක් පමණක් වනු ඇත. එම ඉගැන්වීම් තවත් එක් ජීවිත දර්ශනයක් පමණක් වනු ඇත. ක්‍රිස්තුන් වහන්සේ තවත් එක් දර්ශනිකයෙකු පමණක් වනු ඇත.

අද අපි මෙම අභිරහස දිව්‍ය පූජා යාගය තුළ සමරන්නෙමු. ඔවුන් වහන්සේගේ උත්ථානය කෙරෙහි අපි අදහන බව අප ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්නෙමු. එසේ නම්, මෙලොව අපගේ පැවැත්මේ හරය ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය බව මොනවට පැහැදිලි වේ.

''බිය නොවන්න; ඔබ සොයන්නේ කුරුසියෙහි ඇණ ගසනු ලැබූ නාසරෙත්හි ජේසුස් වහන්සේය; ඔවුන් වහන්සේ උත්ථාන වූ සේක; ඔවුන් වහන්සේ මෙහි නැත" (ශු. මාක් 16:6). ජේසුස් වහන්සේ අප වෙනුවෙන් තම ජීවිතය පූජා කළ සේක. අප උදෙසා උත්ථාන වූ සේක. එපමණක් නොව තමන් ජීවත්ව සිටියදීම තමන්ගේ මරණය පිළිබඳවත්, උත්ථානය පිළිබඳවත් තම ගෝලයින් දැනුම්වත් කළ සේක.

"එවිට ඔවුන් වහන්සේ මනුෂ්‍ය පුත්‍රයාණන් බොහෝ දුක් වේදනා විඳින්නටත්, ප්‍රජා මූලිකයන් ද නායක පූජකයන් ද විනයධරයන් ද විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නටත් මරනු ලබන්නටත්, තෙදිනකට පසු නැවත නැඟිටින්නටත් නියම බව ඔවුන්ට උගන්වන්න පටන් ගත් සේක (ශු.මාක් 8:31).

උත්ථානය තුළ ඔවුන් වහන්සේ, මරණය පරාජය කළ සේක. ඔවුන් වහන්සේ මරණයෙන් පරාජය නොවූ සේක. නමුත් තමන්ගේ මරණයෙන්, "මරණය" පරාජය කළ සේක. මෙම උත්ථානය අපගේ ජීවිතවලට බලපාන්නේ කෙසේ ද? අපගේ දෛනික වැඩකටයුතුවලදී මෙම අභිරහසට සාක්ෂි දරන්නේ කෙසේ ද? එය එතරම් පහසු කාර්යයක් නොවේ. එය ඉතා ගැඹුරු අභියෝගයකි.

එදා ඔවුන් වහන්සේගේ ගෝලයන්ට පවා ඔවුන් වහන්සේගේ උත්ථානය විශ්වාස කිරීම එතරම් පහසු කාර්යයක් වූයේ නැත. සතියේ පළමු වනදා අලුයම... ඔවුන් වහන්සේ ජීවමානව සිටින බව ද, ඇයට දර්ශනය වූ බව ද ඇසූ විට ඔවුහු එය විශ්වාස නොකළහ (ශු. මාක් 16:9...11).

"මෙපුවත ඔවුන්ට ප්‍රලාපයක් සේ පෙනී ගියෙන්, ඔවුහු ඔවුන්ගේ කීම විශ්වාස නොකළහ" (ශු. ලූක් 24:11).

තත්ත්වය එසේ තිබිය දී, එම සත්‍යතාව තුළ ජීවත් වීම මානුෂික මට්ටමින් සලකා බලන කල අරුමයක් නොවේ.

කිතුදහම තුළ කැටිවී ඇති මූලික සාරය වන්නේ ආදරයයි". ඔවුන් වහන්සේ මියගියේ මිනිස් අපට ඇති අසීමිත වූ ආදරය නිසාම ය. ජේසු තුමන්ගේ මරණය, සැබෑ ලෙස ම ආදරයේ පරිත්‍යාගයකි. ආදරයේ තිළිණයකි. ඒ තුළ ඔවුන් වහන්සේ තමන් ඉගැන්වූ දහමට සාක්ෂි දුන් සේක.

පමුණුගම මීසම් සේවක
ශාන්ත සාගර
හෙට්ටිආරච්චි පියතුමා

''යමෙකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවෙකුට නැත (ශු. ජොහන් 15:13).

එදා, තත්ත්වය එසේ තිබියදී, අද අපට කෙරෙන ඒ අභියෝගාත්මක ඇරයුම පිළිබඳව සැලකිලිමත් වීම වැදගත් වේ. ඒ අභියෝගයට අද ඔබත් මාත් මුහුණදීමට නම්, 'දුක්විඳීම" අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්වී ඇත.

ජීවිතයේ පැනනගින බාධක හා ප්‍රශ්න හමුවේ බිඳවැටෙන හදවතින් යුතුව අපි බොහෝ විට උත්ථාන වූ කිතු සමිඳුන් අදහා ගනු වෙනුවට, අපගේ විශ්වාසයේ සත්‍යතාවන් පිළිබඳව ප්‍රශ්න කරන්නෙමු. දෙවියන් වහන්සේගේ වැඩසිටීම පිළිබඳවත්, උන් වහන්සේගේ දිව්‍ය සංරක්ෂණය පිළිබඳවත් අපි ප්‍රශ්න කරන්නෙමු. ඒ වෙනුවට අප අපගේ විශ්වාසයේ මදකම පිළිබඳව සිතා බලන්නේ නම්, මාගේ අදහසට අනුව වැදගත්ම වන්නේ එම කරුණයි.

සියල්ල සිදුවන්නේ දෙවියන් වහන්සේගේ කැමැත්ත අනුව බවත්, සියල්ල පසුපස දේව හස්තය ක්‍රියාත්මක වන බවත් අප අදහා ගන්නේ නම්, අපගේ විශ්වාසයේ ජීවිතය ඉහත සඳහන් කළ අභියෝග හමුවේ ස්ථිරව පවත්වා ගත හැකි වනු ඇත. කිතුනුවෙකු ලෙස අප ගමන් කළ යුත්තේ ක්‍රිස්තුන් වහන්සේ ගමන් කළ මාර්ගයෙහි ය. අප ජීවත් විය යුත්තේ ඔවුන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව ය. ඔවුන් වහන්සේ දරා ගත් කුරුසිය දරා ගන්නට අප සැම දෙනාටම පොදු ආරාධනයක් ඇත.

එහෙත් යමෙක් කිතුනුවෙකු මෙන් දුක් විඳී නම්, ඒ ගැන ලැජ්ජා නොවී, ඔබ කිතුනු නාමය දරන බැවින් දෙවියන් වහන්සේට ගෞරව කරන්න" (1 පේදුරු 4:16). කිතුනුවන් වශයෙන් අපට විඳින්නට සිදුවන දුක්, බය ගැන ලැජ්ජා නොවී, ඒ ගැන සතුටු විය යුතු ය. මන්ද, ජේසුස් වහන්සේ කුරුසිය දරා ගත්තේ දුකින් හෝ කලකිරීමෙන් නොවන බැවිනි. ඒ අපට ඇති ආදරයේ නාමයෙනි.

එහෙත් එක සිතින් ඔවුන් වහන්සේ අදහාගන්නා තැනැත්තා, කිසිදු අයුරකින් විනාශ වන්නේවත්, අතරමං වන්නේවත් නැත. ඒ බව ඔවුන් වහන්සේ විසින් මරණය වැළඳ ගනු ලැබීමට පෙරදීම අපට පොරොන්දු වූ සේක.

මා අදහන්නා මා කරන ක්‍රියාද කරන්නේ ය... පුත්‍රයා තුළ පියාණන් වහන්සේ මහිමයට පමුණුවනු ලබන පිණිස, ඔබ මාගේ නාමයෙන් අයදින කවර දෙයක් වුවද මම ඉටුකරන්නෙමි" (ශු. ජොහාන් 14:12-13).

මේ මරණය ජයගත් ජීවිතය පාස්කු ඉරිදා තුළින් විජයග්‍රාහීව දෝංකාර දෙන්නේ උත්ථානයද අපට දනය කරමිනි. පාස්කුව කිතුනු අපට සැබැවින්ම ජීවිතය සිහිකැඳවන දිනයකි. පාස්කුව කිතුනුවාට උත්ථානය උදම් අනමින් සිහිපත් කරන්නට වරප්‍රසාදය දෙන දිනයකි.

ශ්‍රී ලාංකීය කිතුනු මෑත කාලීන දෙවසරක ඉතිහාසය තුළ පාස්කුව යන වදන තුළ සැඟවී ඇති කඳුළු කතාවල තවම නිමාවක් නොමැත. අහිංසකයින්ගේ ජීවිතය පැහැර ගන්නට ආ මුළා වූ අන්තවාදීන් ඒ ජීවිත ඩැහැගත්තද අද මියගිය ඒ සියලු දෙනා ප්‍රාණපරිත්‍යාගීන් සේ පාස්කුවේ උත්ථානය ජීවත්වන අපට කියාදෙන බව අපගේ විශ්වාසයයි. තවදුරටත් කිතුනුවන්ගේ ජීවිතය අකාලේ ඩැහැගන්නට කිසි අන්තවාදියෙකුට නොපිළිවන් අතර පාස්කුවේ විජයග්‍රාහී මරණයේ දෝංකාරය මෑත කාලීන ශ්‍රී ලංකාවේ ප්‍රාණපරිත්‍යාගීන් විහිදා ඇති ආකාරය යුක්තිය, සාධාරණත්වය තුළ කිසිම බලවතෙකුට හෑල්ලු කරන්නට නොහැකි බව මරණය මරමින් ජයගත් මරණය තුළින්ම පවසන්නෙමු.

**(ඡායාරූපය අන්තර්ජාලයෙනි)**

# දැදුරුඔය විදුලි බලාගාරය සුබ මොහොතින් විවෘත කළ වගයි...

# මොන බාධක ආවත් රට සංවර්ධනයට පසුබහින්නේ නෑ

## ඇමැති චමල් රාජපක්ෂ කියයි



වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම යන මහත්වරුන් 'දැදුරුඔය විදුලි බලාගාරය' විවෘත කළ අවස්ථාව.

(ඩයනා උදයංගනී සහ කුරුණෑගල අධිකරණ රවීන්ද්‍ර ප්‍රභාත් නෙත්තසිංහ)

සංවර්ධන ව්‍යාපෘති කඩාකප්පල් කිරීමට විරුද්ධවාදීන් ගන්නා උත්සාහය පරයමින් රට සංවර්ධනය කරාගෙන යන බව වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා ඊයේ (1) වැනිදා පැවසීය.

ආණ්ඩුව සද්භාවයෙන් ක්‍රියාවට නංවන ව්‍යාපෘතිවලට එරෙහිව විරුද්ධවාදීන් ක්‍රියා කරමින් සිටින බව ද ඇමැතිවරයා සඳහන් කළේය.

අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා මේ බව පැවසුවේ ඓතිහාසික ඇතුගල්පුරවරයේ ඉදිකළ 'දැදුරුඔය විදුලි බලාගාරය' විවෘත කිරීමේ අවස්ථාවට ඊයේ (01) වැනිදා පෙරවරුවේ සහභාගි වෙමිනි.

දැදුරුඔය ජලාශ ව්‍යාපෘතිය 2008 වසරේ දී ආරම්භ වූ අතර එහි ජලාශය ඉදිකිරීම වෙනුවෙන් රුපියල් මිලියන 11,000 ක් පමණ වැයකර ඇත. මෙහි සියලුම සැලසුම් හා ඉදිකිරීම් ශ්‍රී ලාංකික ඉංජිනේරුවන් අතින් සිදුකර ඇති අතර මෙම බලාගාරය මගින් කිලෝවොට් 1300 ක විදුලි ධාරිතාවක් ජාතික විදුලිබල පද්ධතියට එක්කිරීමට නියමිතය. වසරකට ගිගාවොට් 4.8 ක් ජාතික පද්ධතියට එක්කිරීමට නියමිත මෙහි ඉදිකිරීම් කටයුතු ලංකා එනජිස් ආයතනය මගින් සිදු කෙරිණි. 2019 වසරේ ඉදිකිරීම් ආරම්භ කළ දැදුරුඔය බලාගාරය වසරකින් නිමකර ඇත.

එහිදී අදහස් දැක්වූ චමල් රාජපක්ෂ මහතා මෙසේ ද කීවේය.

" දැදුරුඔය ව්‍යාපෘතිය, මුල්ගල් තැබීමක්, උත්සවයක් නොමැතිව වැඩ ආරම්භ කළ ව්‍යාපෘතියක්. එකම වැවකින් ක්ෂේත්‍ර ගණනාවක් අස්වද්දමින්, දැදුරුඔය ජාතියට විශාල මෙහෙවරක් ඉටුකරනවා. අපි ආණ්ඩුවක් වශයෙන් සෑම දෙයක්ම සිදුකරන්නේ සත්භාවයෙන් යුතුවයි. එම කටයුතු කඩාකප්පල් කිරීමට විරුද්ධවාදීන් උත්සාහ කරනවා.

එම විරුද්ධවාදී බලවේගන් පරයමින් රටේ සංවර්ධනය සඳහා කටයුතු කිරීම අපේ අරමුණයි. විදුලිය නොමැතිව කිසිදු කටයුත්තක් සිදුකළ නොහැකියි. සංවර්ධනයේ මූලික අඩිතාලම වන්නේ විදුලියයි. ඒ නිසා මෙම ව්‍යාපෘතිය රටට ඉතා වැදගත් වෙනවා." යැයි ඇමතිවරයා පැවසීය.

## මේ මාසය ඉවර වෙන්න කලින් අඩු ආදායම් පවුල් 2256 කට විදුලිය නොමිලේ

## ඇමැති ඩලස් අලහප්පෙරුම

විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා අදහස් දක්වමින් මෙසේ පැවැසීය.

"මල්වතු ඔයෙන් ගලා ආ අපේ මානව ශිෂ්ටාචාරයේ නූතන සෞභාග්‍යයේ හරිත බලශක්ති වංශ කතාවට අද දැදුරු ඔයෙන් එක් වන්නේ විශ්ව හිතකාමී සොඳුරු ආලෝකයක්. සාමාන්‍යයෙන් අප්‍රේල් 01වැනිදට අපට අසන්නට ලැබෙන්නේ සත්‍ය හෝ හොඳ ආරංචි නෙවෙයි. ඒ විශ්වීය කැලැන්ඩරය වෙනස් කරමින් ඇත්ත පැළ කරන්න අද අපට හැකි වුණා. මෙය ගෝඨාභය රාජපක්ෂ මහතා නායකත්වය පත්ව ආරම්භ කළ ව්‍යාපෘතියක්. ජනතා අයිතියට කැප කරන අවස්ථාවක් මෙන්ම රටේ ඉතිහාසයේ වාරිමාර්ග, විදුලිබල, වංශ කතාවේ තවත් එක් පරිච්ඡේදයක්.


මේ අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස චමල් රාජපක්ෂ මහතා කැඳවන්න තීරණය කළේ, මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩු සමයේ වාරිමාර්ග අමාත්‍යවරයා ලෙස දැඩි විරෝධතාවට මුහුණදීලා මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න ලබාදුන් විශිෂ්ට නායකත්වයට කෘතගුණ සලකන්නයි.



වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ සහ විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම යන මහත්වරුන් සුහද කතාබහක යෙදී සිටි අයුරු.

මෙතෙක් කලක් තුළ සූර්ය බලයෙන් ජාතික විදුලිබල පද්ධතියට එකතු වී ඇත්තේ මෙගාවොට් 412 ක් පමණයි. අපි මේ වනවිට දියත් කර ඇති ගමට බලාගාරයක් ව්‍යාපෘතිය යටතේ සූර්ය බලාගාර 7000ක් තුළින් මෙගාවොට් 600ක් ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීමට අපි සූදනම්. මෙම මාසය අවසන් වීමට පෙර අපි මේ තුළින් අඩුආදායම් ලාභීන් 2256 කට නොමිලයේ විදුලිය ලබාදෙනවා." යැයි ද ඇමැතිවරයා කීවේය.

රාජ්‍ය අමාත්‍ය ඩී.බී. හේරත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අනුර ප්‍රියදර්ශන යාපා, මංජුලා දිසානායක, එස්.බී. නාවින්න, ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති ඉංජිනේරු විජිත හේරත්, ලංකා එනර්ජීස් සමාගමේ සභාපති නන්දික පතිරගේ යන මහත්වරුන් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට, එක්ව සිටියහ.



# මරදානේ නිවෙසකින් කෝටියක් වටිනා 'කුඩු' අත්අඩංගුවට

(යොහාන් භාසුර)

**මරදාන ලොකට් පාරේ අතහැර දමා තිබූ නිවසක තිබී රුපියල් කෝටියකට අධික වටිනාකමින් යුත් හෙරොයින් මත්ද්‍රව්‍ය කිලෝ එකයි ග්‍රෑම් 78 ක් කොළඹ මධ්‍යම කොට්ඨාස දූෂණ මර්දන ඒකකය විසින් ඊයේ (01) අලුයම අත්අඩංගුවට ගනු ලැබීය.**

මෙම හෙරොයින් තොගය කුඩා පාර්සල් ලෙස සකස් කර අදාළ නිවසේ සඟවා තිබූ බවත් මත්ද්‍රව්‍ය තොගය සමඟ කිසිදු සැකකරුවකු අත්අඩංගුවට නොගත් බවත් පොලිසිය සඳහන් කරයි.

පොලිසියට ලද තොරතුරක් මත මෙම වැටලීම කළ බවත් රාත්‍රී දුරගමන් බස් රථයකින් හෙරොයින් තොගය ප්‍රවාහනය කිරීමට සූදානම්ව සිට ඇති බවට සැක කරන බවද පොලිසිය කියයි.

මත්ද්‍රව්‍ය තොගය වැඩිදුර පරීක්ෂණ සඳහා බාර දී ඇත.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන් වන නිලන්ත චන්ද්‍රසේකර සහ සමරකෝන් බණ්ඩා යන මහත්වරුන්ගේ අධීක්ෂණයෙන්, කොළඹ මධ්‍යම කොට්ඨාස දූෂණ මර්දන ඒකකයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ධම්මික පෙරේරා මහතා මෙහෙය වූ මෙම වැටලීමට උප පොලිස් පරීක්ෂකවරුන් වන අසේල පොන්නම්පෙරුම සහ ප්‍රසන්න වීරකෝන්, පොලිස් සැරයන්වරු වන රංජිත් (27387) සහ මල්ලිකාරච්චි (358), කොස්තාපල්වරු වන රංගන (37339) සහ ලක්ෂාන් (90447) පොලිස් කොස්තාපල් රියැදුරු ඉඳුමිණ (80810) යන නිලධාරීහු ද සහභාගි වූහ.



අත්අඩංගුවට ගත් හෙරොයින් තොගය

## දෙයියන්දර ඉන්ද්‍රසාර නාහිමි අපවත්වෙති




**දෙයියන්දර, කලුගල පුරාණ විහාරාධිපති කන්දබඩපත්තුව ඇතුළු මාතර පළාතේ ප්‍රධාන සංඝනායක දෙයියන්දර ඉන්දසාර නාහිමියෝ ඊයේ (01) අලුයම අපවත් වූහ.**

දෙයියන්දර කලුගල පුරාණ විහාරාධිකාරී රත්ගම විද්‍යාඥාන පරිවේණාධිපති දේවාලේගම මහින්දසාර හා අතපත්තුකන්දේ ඥානසාර යන හිමිවරුන් ඇතුළු ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා දෙළොස් නමකගේ ගුරු දේවයන් වූද මාතර මධ්‍ය මහා විද්‍යාලයේ හිටපු විදුහල්පති සෝමපාල කන්නන්ගොඩ, විශ්‍රාමික විදුහල්පති නන්දසේන කන්නන්ගොඩ යන මහත්වරුන් ඇතුළු සොයුරු සොයුරියන් එකොළොස් දෙනෙකුගේ සහෝදරයකු වූ ද උන්වහන්සේ අපවත් වන විට 83 වැනි වියේ පසුවූහ.

දේහය දෙයියන්දර, කලුගල පුරාණ විහාරස්ථ ධර්ම ශාලාවේ තැන්පත් කර ඇති අතර ආදාහන පූජෝත්සවය හෙට (03) සවස 3.00 ට දෙයියන්දර ජාතික පාසල් ක්‍රීඩාංගණයේ දී සිදු කිරීමට නියමිත ය.

## ජනාධිපති නීතිඥ කරුණාරත්න හේරත් කලුරිය කරයි



**ජනාධිපති නීතිඥ කරුණාරත්න හේරත් මහතා පෙරේද (31) සවස හදිසියේ අභාවප්‍රාප්ත විය.**

අනුරාධපුරයෙන් බිහිවූ පළමු ජනාධිපති නීතිඥවරයාවූ ඒ මහතා මියයන විට 69 වන වියෙහි පසුවිය.

දක්ෂ නීතිඥවරයෙකු ලෙස මෙන්ම ලේඛකයකු හා ග්‍රන්ථ රචකයෙකු ලෙසද ඒ මහතා ප්‍රසිද්ධියක් ඉසිලීය. බොහෝමයක් පාඨකයින්ගේ අවධානය දිනාගත් කාලීන හා දේශපාලන ලිපි රැසක් ලංකාදීප පත්‍රයට සැපයූ ලේඛකයෙකුද වන හේරත් මහතා නීති ක්ෂේත්‍රයේ අවධානයට යොමුවූ මානව හිමිකම් සංකල්පය හා නීතිය, බලය බෙදීම හා පළාත් සභා සහ රජයේ ඉඩම් නීතිය, පරිසර නීතිය, මුස්ලිම් නීතිය යන ග්‍රන්ථ ගණනාවක්ද රචනා කළේය.

රජරට මාධ්‍යවේදියෝ සංවිධානයේ අනුශාසකවරයා ලෙසද අනුරාධපුර නීතිඥ සංගමයේ සභාපතිවරයා ලෙසද ඒ මහතා කටයුතු කළේය.

පසුගිය රජය පැවැති සමයේ එප්පාවල පොස්පේට් සමාගමේ සභාපතිවරයා ලෙසද හෙතෙම කටයුතු කළේය. ඔහු සිවුදරු පියෙකි.

දේහය මහජන ගෞරවය සඳහා ඒ මහතා පදිංචිව සිටි අනුරාධපුර නගරයේ දෙවන පියවරේ අංක 741/13 නිවසේ තැන්පත් කර ඇති අතර අවසන් කටයුතු අනුරාධපුර නිසල නිම්නය පොදු සුසාන භූමියේදී හෙට (03) සවස 3.30 ට සිදු කෙරේ.

## රායප්පු ජෝශප් මන්නාරම හිටපු රදගුරුතුමෝ ස්වර්ගස්ථ වෙති



**රායප්පු ජෝශප් මන්නාරම හිටපු රදගුරුතුමන් යාපනය රෝහලේ දී ඊයේ (1) අලුයම ස්වර්ගස්ථ විය.**

දින කිහිපයක් යාපනය රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි රායප්පු ජෝසප් හිටපු රදගුරුතුමන් ස්වර්ගස්ථ වනවිට 81වැනි වියෙහි පසු විය.

1940 වසරේ අප්‍රේල් 16 වැනිද යාපනය නෙදුන්තීව් හිදී උපත ලැබූ රායප්පු ජෝශප් රදගුරුතුමන් පූජක දිවියට ඇතුළත් වීමට පෙර පාසල් අධ්‍යාපනය ලැබුවේ යාපනයේ ශාන්ත පැට්‍රික් විද්‍යාලයෙනි. පසුව රදගුරුතුමන් ඉතාලියේ පොන්ටිෆිකල් නාගරික විශ්වවිද්‍යාලයෙන් නීති උපාධියක් ද ලැබීය.

1967 දෙසැම්බර් මාසයේ දී කතෝලික පූජකවරය ලබාගත් රදගුරුතුමන් යාපනයේ ශාන්ත සේවියර්ස් සෙමනේරියේ මහාචාර්යවරයකු ලෙස ද කටයුතු කළේය. 1992 ජූලි මාසයේදී ඔහු මන්නාරම රදගුරු පදවියට පත් වූහ.

එල්ටීටීඊ ත්‍රස්තවාදයට එරෙහිව පැවති යුද්ධයේ දී හිටපු රදගුරු තුමා තම අදහස් ඉතා විවෘතව ප්‍රකාශ කළ අතර බොහෝ විට දක්නට ලැබුණේ යුද්ධය පැවති කාලයේ රජයේ හමුදාවේ හැසිරීම විවේචනය කරන්නකු ලෙසය.

එසේම යුද ගැටුම් පැවති සමයේ මන්නාරම මරද මඩු කතෝලික දේවස්ථානය ආරක්ෂා කර ගැනීම සඳහා ද හිටපු රදගුරුතුමෝ දැඩි වෙහෙසක් ගත්හ.

රායප්පු ජෝශප් හිටපු රදගුරුතුමන්ගේ ස්වර්ගස්ථවීම සම්බන්ධයෙන් ශෝකය පළකරන බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය පැවසුවේ ශ්‍රී ලංකාවේ රෝමානු කතෝලික සමාජය වෙනුවෙන් සහ උතුරේ හා දකුණේ ආගමික සහජීවනයට රදගුරුතුමන් මහගු සේවයක් ඉටු කළ බවය.

(තිළිණි ද සිල්වා)

## පාකිස්තාන-ශ්‍රී ලංකා හමුද පුහුණු අභ්‍යාසයක්



**'ෂේක් හෑන්ඩ්ස් - 1' පාකිස්ථාන - ශ්‍රී ලංකා ඒකාබද්ධ යුද හමුදා ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාසය සාලියපුර ගජබා රෙජිමේන්තු හමුදා කඳවුරේදී දින 15 ක් පුරා පැවැති අතර එහි සමාප්ති උත්සවය පාකිස්ථාන මහ කොමසාරිස් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) මුහම්මද් සාද් ඛට්ටක් සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් 30 වැනිදා පැවැත්විණි.**

**පාකිස්තාන හමුදා නිලධාරීන් සමග ගජබා රෙජිමේන්තුව විසින් මෙහෙයවනු ලැබූ මෙම ඒකාබද්ධ ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාසය සඳහා පාකිස්ථාන හමුදාවේ නිලධාරීන් සහ ශ්‍රී ලංකා යුද හමුදාවේ නිලධාරීන් සහභාගී වූ අතර එම පිරිස පාකිස්ථාන මහ කොමසාරිස් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) මුහම්මද් සාද් ඛට්ටක් සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා යන මහත්වරුන් සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු මෙහි දැක්වේ.**

## කොරෝනා 92,706 ට නගී: 89,251 කට සුව

### අලුතෙන් 125 ක්

(රංජන් කස්තුරි)

**කොරෝනා ආසාදිත රෝගීන් තවත් 125ක් අලුතෙන් හමුවීමත් සමග මෙරටින් වාර්තාවන කොරෝනා රෝගීන්ගේ මුළු සංඛ්‍යාව 92,706 දක්වා ඊයේ (1) ඉහළ ගිය බව සෞඛ්‍ය අංශ පවසයි.**

රෝහල්වල ප්‍රතිකාර ලබමින් සිටින කොරෝනා රෝගීන්ගේ සංඛ්‍යාව ඊයේ වන විට 3012 ක් බවත් සැකසහිත 353 ක් රෝහල්වල වෛද්‍ය අධීක්ෂණය යටතේ පසුවන බවත් එම වර්තා සඳහන් කරයි. කොරෝනා ආසාදිතව ප්‍රතිකාර ලැබූ තවත් රෝගීන් 156 ක් රෝහල්වල වෛද්‍ය අධීක්ෂණය යටතේ පසුවෙති. සුවය ලැබූ කොරෝනා රෝගීන්ගේ මුළු සංඛ්‍යාව මේ වන විට 89251ක් දක්වා ඉහළ ගොස් ඇත.

## නලීන් බණ්ඩාර සී.අයි.ඩියට ඇවිත් නෑ

(ඉන්දිකා රාමනායක)

**රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානී මේජර් ජෙනරාල් සුරේෂ් සලේ මහතා පිළිබඳව මාධ්‍ය හමුවක් පවත්වමින් කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් ප්‍රකාශයක් ගැනීමට කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නලීන් බණ්ඩාර මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඊයේ (1) කැඳවා තිබුණ ද ඒ මහතා නොපැමිණි බව පොලිසිය පවසයි.**

ඒ මහතා වෙනුවෙන් නීතිඥවරුන් කිහිප දෙනකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණ කරුණු ඉදිරිපත් කරමින් වෙනත් දිනයක් ඉල්ලා සිටි බවද පොලිස් ආරංචි මාර්ග කියයි.

මන්ත්‍රීවරයා ඉකුත් 17 වැනිද මාධ්‍ය හමුවක් පවත්වමින් මේජර් ජෙනරාල් සුරේෂ් සලේ මහතා සම්බන්ධයෙන් කළ ප්‍රකාශයට එරෙහිව සුරේෂ් සලේ මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කළ පැමිණිල්ලක් අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ කර තිබිණි. මේ සම්බන්ධයෙන් ප්‍රකාශ ලබා ගැනීමට ඉදිරි දිනෙක නලීන් බණ්ඩාර මහතා යළි කැඳවන බවද පොලිස් ආරංචි මාර්ග පැවසීය.

## ලොරියක් හග්ගලදී ත්‍රිරෝදය මත පෙරළී කාන්තාවෝ 3 ක් මරුට 1 වැනි පිටුවෙන්

සිද්ධියෙන් මියගොස් ඇත්තේ ඇල්ල කරඳගොඩ පදිංචි මිලිනා වෛද්‍යරත්න (51) ලක්ෂ්මි ලියනගේ (52) සහ කවීෂා සෙව්වන්දි (20) නමැති තිදෙනෙකි.

ලක්ෂ්මි ලියනගේ සහ කවිෂා සෙව්වන්දි මව සහ දියණිය වන බවත් අනෙක් කාන්තාව ඔවුන්ගේ ඥාතිවරියකගේ බවත් උසස් පොලිස් නිලධාරියෙක් පැවැසීය.

ත්‍රිරෝද රථය පැද වූ ඩබ්ලිව්.එම්. නිශාන්ත 43 නමැත්තා සිද්ධියෙන් බරපතළ තුවාල ලබා ඇත.

ඔවුන් ඊයේ පෙරවරුවේ මහනුවර දළදා මාලිගාවේ පූජාවකට සහභාගි වී නුවරඑළිය හග්ගල මාර්ගය හරහා ඇල්ල බලා ගමන් කරමින් සිටිය දී දහවල් 12.30 ට පමණ මෙම අනතුර සිදුවී ඇති බවද පොලිසිය කියයි.

ත්‍රිරෝද රථය හග්ගල මාර්ගයේ ඇල්ල බලා ධාවනය වෙමින් තිබිය දී එයට පිටුපසින් සබන් පැටවූ ලොරි රථය ද වැලිමඩ දක්වා ධාවනය වී තිබී ඇති බව පොලිස් ආරංචි මාර්ග පවසයි.

ත්‍රිරෝද රථය පිටුපසින් ධාවනය වෙමින් තිබූ ලොරි රථය එකවරම ඉස්සර කිරීමට යාමේ දී ත්‍රිරෝද රථය මතට පෙරළීමෙන් මෙම අනතුර සිදුවී ඇති බව ද පොලිසිය කියයි.

අනතුරින් ත්‍රිරෝද රථය පිටුපස කොටසට දැඩි හානි සිදුවී ඇති අතර එහි ගමන්ගත් කාන්තාවන් තිදෙනාගෙන් එක් කාන්තාවක් එම ස්ථානයේ දීම මියගොස් ඇත. අවට පිරිස් අනෙක් කාන්තාවන් දෙදෙනා සහ ත්‍රිරෝද රථයේ රියදුරු නුවරඑළිය රෝහලට රැගෙන ගිය අවස්ථාවේ කාන්තාවන් දෙදෙනා ද මග දී මියගොස් තිබේ.

ලොරි රථය ත්‍රිරෝද රථය මතට පෙරළීමෙන් එහි ගමන් ගත් පිරිස එයට යට වී සිට ඇති බවත් අවට පිරිස් ත්‍රිරෝද රථය මත වැටී තිබූ ලොරි රථය ඉවතට තල්ලුකර ත්‍රිරෝද රථයේ පිටුපස සිරවී සිටි පිරිස ඉවතට ගෙන ඇති බවත් පොලිසිය කියයි.

සිද්ධියෙන් පසුව ලොරි රථයේ රියැදුරු ලොරි රථය එම ස්ථානයේදීම දමා පළා ගොස් ඇති අතර ලොරි සහායක පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබ ඇත.

මියගිය රියදුරු හඳුනාගෙන ඇති අතර ඔහු අත්අඩංගුවට ගැනීමට පරීක්ෂණ ආරම්භ කර තිබේ.

ලොරි රථයේ තිරිංග ක්‍රියා විරහිත වීම හේතුවෙන් එය ත්‍රිරෝද රථය මතට පෙරළී මෙම අනතුර සිදුවී ඇති බවට සිදුකළ පරීක්ෂණයේ දී හෙළි වූ බව ද පොලිසිය පවසයි.

නුවරඑළිය මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක චන්දන විජේසේකර මහතාගේ උපදෙස් මත පරීක්ෂණ පැවැත් වේ.

**(නුවරඑළිය ෂෙල්ටන් හෙට්ටිආරච්චි, නෝවුඩ් රංජිත් රාජපක්ෂ සහ ඉන්දිකා රාමනායක)**

**ඡායාරූප සැපයුම වැල්ලවාය අයි.ආර්. ඉන්දික**

## පොල්තෙල් විස තෙවැනි පරීක්ෂණයෙනුත් තහවුරුයි 1 වැනි පිටුවෙන්

එම ගුදම්වලින් ලබාගත් පොල්තෙල් සාම්පලවල පරීක්ෂණ ප්‍රතිඵල කාර්මික තාක්ෂණ ආයතනය විසින් පාරිභෝගික සේවා අධිකාරියට ඊයේ (01) යොමු බාර දෙනු ලැබීය.

මේ සම්බන්ධයෙන් ලංකාදීපය කළ විමසුමකදී අදහස් දැක්වූ සමුපකාර සේවා අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මහතා ප්‍රශ්නගත පොල්තෙල් තොගවල 'ඇෆ්ලටොක්සීන්' නමැති පිළිකාකාරකය අඩංගු බව කාර්මික තාක්ෂණ ආයතනයේ පරීක්ෂණයෙන්ද තහවුරු වී ඇති බව කීවේය.

මෙම ආයතනවලින් ගෙන්වා තිබෙන පොල්තෙල්වල පිළිකාකාරක අඩංගු බව සෞඛ්‍ය අමාත්‍යාංශය, ප්‍රමිති ආයතනය සහ කාර්මික තාක්ෂණ ආයතනය යන ආයතන තුනෙන්ම තහවුරු කර ඇති බැවින් පසුව ලැබෙන වාර්තා කුමක් වුවත් අදාළ පොල්තෙල් ප්‍රතිඅපනයන කළ යුතු බව ඔහු කීවේය.

රේගු දෙපාර්තමේන්තුව සමාගම්වල ගුදම්වලට නිකුත් කළ පොල්තෙල් ප්‍රමාණ එම ගුදම්වල නියමිත පරිදි තිබේදැයි මේ වන විට පරීක්ෂා කරන බවත් එහිදී වෙනසක් ඇති වුවහොත් එම පොල්තෙල් ප්‍රමාණය ද සොයා විනාශ කරන බවත් රාජ්‍ය අමාත්‍යවරයා කීය.

මෙම ප්‍රශ්නගත පොල් තෙල් තොග ගබඩා කර ඇති එම ආයතනවලට අයත් ගුදම්වලට රේගුව විසින් පසුගියද සීල් තබනු ලැබීය.

## රවි ඇතුළු අටදෙනාට නඩු දෙකෙන්ම ඇප 1 වැනි පිටුවෙන්

මහ බැංකුව විසින් 2016 මාර්තු 31 වනදා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ දී රජයට රුපියල් කෝටි 1500 ක පමණ පාඩුවක් සිදුකළ බවට හා මහබැංකුව විසින් 2016 මාර්තු 29 වනදා සිදු කළ බැඳුම්කර වෙන්දේසියේ දී රුපියල් බිලියන 36.89 ක් බැඳුම්කර සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීම මඟින් රජයට පාඩු සිදුකිරීම යටතේ පවරා තිබූ නඩු දෙකටම හිටපු මුදල් අමාත්‍ය රවී කරුණානායක මහතා ඇතුළු විත්තිකරුවන්ට මෙලෙස ඇප නියම කළ විනිසුරු මඩුලු නඩු විභාගයන් අවසන් වනතුරු විත්තිකරුවන්ට විදේශගතවීම තහනම් කෙරිණි.

හිටපු මුදල් අමාත්‍ය රවී කරුණානායක මහතාට අමතරව මෙලෙස ඇප නියම වූයේ පර්පචුවල් ට්‍රෙෂරීස් සමාගමේ සභාපති ජෙෆ්රි ඇලෝසියස් එහි අධ්‍යක්ෂ අර්ජුන් ජෝශප් ඇලෝසියස්, එහි ප්‍රධාන විධායක නිලධාරී කසුන් ඕෂධී පළිසේන, එම සමාගමේ සේවකයන් වන, චිත්‍රා රංජන් හුලුගල්ල, මුත්තුරාජා සුරේන්ද්‍රන් මහ බැංකු නිලධාරීන් වන එස්. පදුමනාභන් සහ ඉන්දික සමන් කුමාර නමැත්තන්ටය.

2016 මාර්තු 31 වනදා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ දී රජයට රුපියල් කෝටි 1500 ක පමණ පාඩුවක් සිදුකළ බවට විත්තිකරුවන්ට එරෙහි නඩුව ඊයේ පෙරවරුවේ අමල් රණරාජා (සභාපති) නාමල් බලල්ලේ සහ ආදිත්‍ය පටබැඳි යන මහත්වරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල විශේෂ මහාධිකරණයේ විනිසුරු මඩුල්ල හමුවේ කැඳවනු ලැබූ අවස්ථාවේදී මුලින්ම විත්තිකරුවන්ට ඇප නියම කෙරිණි.

2016 මාර්තු 29 වනදා සිදුකළ බැඳුම්කර වෙන්දේසියේ දී රුපියල් බිලියන 36.89 ක් බැඳුම්කර සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීම මඟින් රජයට පාඩු සිදු කිරීම යටතේ පවරා තිබූ නඩුව ඊයේ පස්වරුවේ දමිත් තොටවත්ත (සභාපති) මංජුල තිලකරත්න සහ මොහොමඩ් ඉර්ෂඩීන් යන මහත්වරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල විශේෂ මහාධිකරණයේ විනිසුරු මඩුල්ල හමුවේ කැඳවනු ලැබූ අවස්ථාවේ දී දෙවන වතාවට විත්තිකරුවන්ට ඇප නියම කෙරිණි.

2016 මාර්තු මස 12 වැනිදත් මාර්තු මස 03 වැනිදත් අතර කාලයේ කොළඹදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවේ දී භාණ්ඩාගාර බැඳුම්කර වංචා කිරීම සඳහා පොදු අරමුණක් සහිතව කටයුතු කිරීම ඒ අනුව 2016 මාර්තු 31 වනදා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කළ බැඳුම්කර වෙන්දේසියේ දී රුපියල් බිලියන 15 ක් බැඳුම්කර සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීම, එමගින් රජයට පාඩු සිදු කිරීම, ඒ සඳහා අධාර අනුබලදීම ඇතුළු චෝදනා යටතේ විත්තිකරුවන්ට එරෙහිව නීතිපතිවරයා විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුලු දෙකක වෙන වෙනම නඩු පවරා ඇත.

එම නඩුවල දී විත්තිකරුවන්ට ඇප නියම කරන ලෙස ඔවුන්ගේ නීතීඥවරුන් වෙන වෙනම දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කළ අතර පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක හා නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරු කරුණු ඉදිරිපත් කරමින් විත්තිකරුවන්ට ඇප නොදෙන ලෙස ඉල්ලීම් කළහ.

2016 මාර්තු 31 වනදා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ දී රජයට රුපියල් කෝටි 1500 ක පමණ පාඩුවක් සිදුකළ බවට විත්තිකරුවන්ට එරෙහි නඩුවේ දෙපාර්ශ්වය දීර්ඝ වශයෙන් ඉදිරිපත් කළ කරුණු සලකා බැලූ අමල් රණරාජා (සභාපති) නාමල් බලල්ලේ සහ ආදිත්‍ය පටබැඳි යන මහත්වරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල විශේෂ මහාධිකරණ විනිසුරු මඩුල්ල විත්තිකරුවන් ඇප මත මුදාහැරීමට ඒකමතිව තීරණය කළහ.

ඒ අනුව රුපියල් ලක්ෂ 10 බැගින් වන මුදල් හා රුපියල් ලක්ෂ 100 බැගින් වන ඇපකරුවන් දෙදෙනකුගෙන් සමන්විත ඇප මත විත්තිකරුවන් මුදාහැරීමට නියම කළ විනිසුරු මඩුල්ල නඩු විභාගය අවසන් වනතුරු විත්තිකරුවන්ට විදේශ ගතවීම තහනම් කරමින් ඔවුන්ගේ විදේශ ගමන් බලපත්‍ර අධිකරණයට බාරදීමට ද ඔවුන්ට නියම කෙරිණි.

මෙම සංකීර්ණ නඩු කටයුත්ත සඳහා සූදානම් වීමට මෙන්ම සාධාරණ නඩු විභාගයක් ලබා ගැනීමට විත්තිකරුවන්ට ඇති අයිතිය සුවිශේෂි කරුණු වශයෙන් සැළකිල්ලට ගත් විනිසුරු මඩුල්ල ඔවුන්ට ඇප නියම කළේය.

2016 මාර්තු 29 වනදා සිදුකළ බැඳුම්කර වෙන්දේසියේ දී රුපියල් බිලියන 36.89 ක් බැඳුම්කර සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීම මඟින් රජයට පාඩු සිදුකිරීම යටතේ පවරා තිබූ නඩුව ඊයේ පස්වරුවේ දමිත් තොටවත්ත (සභාපති) මංජුල තිලකරත්න සහ මොහොමඩ් ඉර්ෂඩීන් යන මහත්වරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල විශේෂ මහාධිකරණයේ විනිසුරු මඩුල්ල විත්තිකරුවන් ඇප මත මුදාහැරීමට බහුතර තීන්දුවෙන් තීරණය කළහ.

ඒ අනුව රුපියල් ලක්ෂ 10 බැගින් වන මුදල් හා රුපියල් ලක්ෂ 50 බැගින් වන ඇපකරුවන් දෙදෙනකුගෙන් සමන්විත ඇප මත විත්තිකරුවන් මුදාහැරීමට නියම කළ විනිසුරු මඩුල්ල නඩු විභාගය අවසන් වනතුරු විත්තිකරුවන්ට විදේශ ගතවීම තහනම් කරමින් ඔවුන්ගේ විදේශ ගමන් බලපත්‍ර අධිකරණයට බාරදීමට ද ඔවුන්ට නියම කෙරිණි.

ඇප කොන්දේසි කඩ කළ බවට හෝ පැමිණිල්ලේ සාක්කිකරුවන්ට බලපෑම් කළ බවට පැමිණිලි ලැබුණහොත් විත්තිකරුවන්ගේ ඇප අවලංගු කර රිමාන්ඩ් බාරයේ රඳවා තැබීමට ද විනිසුරු මඩුලු දෙකෙන්ම නියම කෙරිණි.

දමිත් තොටවත්ත, මංජුල තිලකරත්න සහ මොහොමඩ් ඉර්ෂඩීන් යන විනිසුරුවරුන් තිදෙනා වෙන වෙනම තීන්දු තුනක් ප්‍රකාශයට පත් කළ අතර මහාධිකරණ විනිසුරු මංජුල තිලකරත්න මහතා සිය තීන්දුව ප්‍රකාශයට පත් කරමින් අපරාධ නඩු විධාන සංග්‍රයේ 450 (6) වගන්තිය යටතේ විත්තිකරුවන්ට ඇප නියම කිරීමට මෙම අධිකරණයට බලයක් නොමැති හෙයින් ඔවුන් රිමාන්ඩ් බාරයට පත් කළ යුතු යැයි සඳහන් කළේය.

දමිත් තොටවත්ත සහ මොහොමඩ් ඉර්ෂඩීන් යන විනිසුරුවරු දෙදෙනා වෙන වෙනම සිය තීන්දු ප්‍රකාශයට පත් කරමින් විත්තිකරුවන්ගේ ඇප ඉල්ලීම් සලකා බැලීමට මෙම අධිකරණයට බලය ඇතැයි සඳහන් කළහ.

මහාධිකරණ විනිසුරු දමිත් තොටවත්ත මහතා විත්තිකරුවන් අධිකරණයේ පෙනී සිටීම සුවිශේෂි කරුණක් වශයෙන් සිය තීන්දුවේ සඳහන් කළ අතර මහාධිකරණ විනිසුරු මොහොමඩ් ඉර්ෂඩීන් මහතා මෙතෙක් නඩු විභාගය ආරම්භ නොවීම හා මෙම නඩුවේ ඇති විශාල ලේඛන තොගය සුවිශේෂි කරුණක් වශයෙන් සිය තීන්දුවේ සඳහන් කරමින් විත්තිකරුවන්ට ඇප නියම කිරීමට තීරණය කළේය.

ඒ අනුව විත්තිකරුවන්ට නඩු දෙකෙන්ම ඇප නියම වූ අතර මෙම නඩු අප්‍රේල් 29 හා මැයි 11 වැනි දිනවල කැඳවීමට නියම කෙරිණි.

විත්තිකරුවන් වෙනුවෙන් ජනාධිපති නීතීඥ ෆායිස් මුස්තාපා මහතා, ජනාධිපති නීතීඥ ශ්‍රවේන්ද්‍ර ප්‍රනාන්දු, ජනාධිපති නීතීඥ ගාමිණී මාරපන, ජනාධිපති නීතීඥ නවීන් මාරපන, ජනාධිපති නීතීඥ අනිල් සිල්වා, ජනාධිපති නීතීඥ සම්පත් මෙන්ඩිස් යන මහත්වරු පෙනී සිටියහ.

පැමිණිල්ල වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ රජයේ නීතීඥ ලක්මිණි ගිරිහාගම මහත්මිය, රජයේ නීතීඥ උදර කරුණාතිලක මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් හරිප්‍රියා ජයසුන්දර මහත්මිය සමග අතිරේක සොලිසිටර් ජනරාල් ප්‍රියන්ත නාවාන මහතා පෙනී සිටියේය.



රිමාන්ඩ් බාරයේ සිටි හිටපු මුදල් අමාත්‍ය රවී කරුණානායක ඇතුළු අට දෙනා ඇප ලබා ගැනීමෙන් අනතුරුව අධිකරණයෙන් පිටව ගිය අයුරු ඡායාරූපයේ දැක්වේ. (ඡායාරූප - ළහිරු හර්ෂණ)

## දෙදරු පියකුගේ ජීවිතය බේරාගන්න බී නෙගටිව් වකුගඩුවක් ඉක්මනින් ඕනෑ



**කඩවත කිරිල්ලවල 5 වනපටුමග මංගල මාවත, අංක 109/ඒ/3 දරන ලිපිනයේ පදිංචි දෙදරු පියකු වන සෝමරත්න අත්තනායක මහතා දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බැවින් බී නෙගටිව් වර්ගයේ වකුගඩුවක් ඉතා ඉක්මණින් බද්ධ කළ යුතු යැයි විශේෂඥ වෛද්‍ය චූලා හේරත් මහතා නිර්දේශ කර ඇත.**

පරිත්‍යාගශීලීන් වෙතොත් 0773004483 දුරකතන අංකයට අමතන මෙන් ඉල්ලීමක් කෙරේ.

# 'අලුත් පියාපත්' සංවිධානය ජනතාව දැනුම්වත් කරමින්



මහබැංකු බැඳුම්කර වංචාව සහ සීනි වංචාව සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා අලුත් පියාපත් සංවිධානය 'තව පෙරළමුද එකම කාසිය' යන තේමාව යටතේ පැවැත් වූ වැඩසටහනක් කොටුව දුම්රිය ස්ථානය ඉදිරිපිටදී ඊයේ (1) පැවැත්විණි. එහි අවස්ථාවක් ඡායාරූපයේ දැක්වේ. (ඡායාරූපය - ගයාන් අමරසේකර)

# හෝටල් සේවක මධ්‍යස්ථානය විරෝධතාවක



සියලුම හෝටල් සේවකයන්ට කොරෝනා මර්දන එන්නත් හා රුපියල් 15,000ක අන්තර් දීමනාවක් ලබාදෙන ලෙස සහ හෝටල් සේවකයන්ගේ බැංකු ණය ගෙවීමේ කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා හෝටල් සේවක මධ්‍යස්ථානය සංවිධානය කළ විරෝධතාවක් කොටුව දුම්රිය ස්ථානය ඉදිරිපිට දී ඊයේ (1) පැවැත්විණි. එම විරෝධතාවයේ අවස්ථාවක්.

(ඡායාරූප - ගයාන් අමරසේකර)

## සිසුවියකට කොරෝනා

# රාවතාවත්ත මෙතෝදිස්ත විදුහලේ පහේ පන්තිය වසයි

(මොරටුව රේබා තරංගනී ෆොන්සේකා)

**මොරටුව රාවතාවත්ත මෙතෝදිස්ස විද්‍යාලයේ පහ වසරේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවකට කොරෝනා ආසාදිත වීමේ හේතුවෙන් එම පන්තිය වසා දමා ශිෂ්‍ය ශිෂ්‍යාවන් තිස් දෙනකුට සහ පන්තිභාර ගුරුවරුන් ඊයේ (1) නිරෝධායනයට සඳහා යොමුකළ බව සෞඛ්‍ය අංශ පවසයි.**

සිසුවියගේ මිත්තණිය ඉකුත් සෙනසුරාද දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ සැත්කමකට භාජනය වීමට නියමිත හෙයින් ඉරිද ඇයට සිදු කළ පීසීආර් පරීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව ඇය කොවිඩ් ආසාදිත රෝගියකු ලෙස හඳුනාගෙන ඇත.

ඒ අනුව ඇයව ප්‍රතිකාර සඳහා නෙවිල් ප්‍රනාන්දු රෝහලට යොමු කොට ඇත.

දැරියගේ මිත්තණියගේ පළමුපෙළ ආශ්‍රිතයන් වන මෙම පාසල් සිසුවිය ඇතුළු ඇයගේ පවුලේ පිරිස සඳහා ද මොරටුව සෞඛ්‍ය අංශ විසින් පීසීආර් පරීක්ෂණ සිදුකර ඇති අතර එහිදී සෙම්ප්‍රතිශ්‍යාව වැනි රෝග තත්ත්වයක් පෙන්නුම් කළ මෙම සිසුවිය කොවිඩ් ආසාදිතයකු ලෙස හඳුනාගෙන ඇත.

පසුව සිසුවිය ද ප්‍රතිකාර සඳහා යොමු කොට ඇති අතර ඇය අධ්‍යාපනය ලැබූ රාවතාවත්ත මෙතෝදිස්ත විද්‍යාලයේ පස් වන වසරේ පන්තිය දින දහතරක් වසා දැමීමට සෞඛ්‍ය අංශ විසින් තීරණය කොට තිබේ.

නිරෝධායනය සඳහා යොමු කළ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද පීසීආර් පරීක්ෂණ සඳහා යොමු කිරීමට බලාපොරොත්තු වන බව ද සෞඛ්‍ය අංශ පැවසීය.




# කොස්තාපල්ගේ රියේ ගැටුණ පදිකයාට තුවාල

(බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ)

**පානදුර උතුර කෙසෙල්වත්ත ප්‍රදේශයේ පදික මාරුව හරහා ගමන් ගත් පුද්ගලයකු පොලිස් කොස්තාපල්වරයකු පැදවූ මෝටර් රථයේ ගැටීමෙන් තුවාල ලබා රෝහල් ගත කළ බව පානදුර උතුර පොලිසිය කියයි.**

මෙලෙස තුවාල ලබා ඇත්තේ පානදුර ගාලු පාර සරික්කමුල්ල ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකි.

කොස්තාපල්වරයා පානදුර දෙස සිට මොරටුව දෙසට මෝටර් රථය ධාවනය කිරීමේදී මෙම අනතුර වී තිබූ බව පොලිස් නිලධාරියෙක් පැවැසීය.









# කම්කරු අයිතිවාසිකම් සවිමත් කිරීමටත් අලුත් ක්‍රමයක්

# වෘත්තීය සමිති රටේ සංවර්ධනයට යොදා ගන්නවා

## ඇමැති නිමල් සිරිපාල ද සිල්වා



කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා දඹුල්ල නගර මධ්‍යයේ අභිනවයෙන් ඉදිකෙරුණු කම්කරු කාර්යාල ගොඩනැගිල්ල විවෘත කළ අවස්ථාව. රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතාද මෙහි වේ.

(දඹුල්ල කාංචන කුමාර ආරියදාස)

වෘත්තීය සමිති සියල්ල නියාමනයට ලක් කිරීමටත් කම්කරුවාගේ අයිතිවාසිකම් ශක්තිමත් කිරීමටත් අවශ්‍ය යාන්ත්‍රණයක් සකස් කරන බව කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා පැවැසීය.

වෘත්තීය සමිතිවල දායකත්වය රටේ සංවර්ධනය වෙනුවෙන් යොදාගැනීම රජයේ අරමුණ බවත් අමාත්‍යවරයා සඳහන් කළේය.

දඹුල්ල නගර මධ්‍යයේ අභිනවයෙන් ඉදිකෙරුණු කම්කරු කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීමේ අවස්ථාවට ඊයේ (27 වැනිදා) එක්වෙමින් ඔහු මේ බව පැවැසීය.

රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් මෙම ගොඩනැගිල්ල විවෘත කෙරිණ.

රුපියල් ලක්ෂ 60 කට අධික මුදලක වියදමින් මෙම කම්කරු දෙමහල් කාර්යාලය ඉදිකර ඇත.

විවිධ අනතුරුවලට පත් වූ සේවකයන්ගේ දුවා දරුවන්ට අවශ්‍ය ඉගෙනීම් අධ්‍යාපන කට්ටල පරිත්‍යාග කිරීම ද මෙහිදී සිදු කෙරිණ.

**එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා මෙසේද කීය.**

"මෙරට කම්කරුවගේ අයිතිවාසිකම් වෙනුවෙන් විශාල වශයෙන් රජය මැදිහත් වී තිබෙනවා. කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, කම්කරුවන් රැකගැනීම, එම අයගේ සුබසාධන වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම ආදී වැඩසටහන් රැසක් මේ වනවිටත් රජය ආරම්භ කර තිබෙනවා.

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වා දෙන අවස්ථාවක වෘත්තීය සමිති සඳහා 35% ක කාන්තා නියෝජනයක් එක් කිරීමටත් රජයේ අවධානය යොමු වී තිබෙනවා.

කම්කරුවන්ගේ නීති අණපනත් සියල්ල වෙනස් කර ඔවුන්ට පහසුවක් සලසා දීමට අපි කටයුතු කළා. එමෙන්ම කම්කරුවන්ගේ ප්‍රශ්න ගැටලු පිළිබඳව නඩු විශාල වශයෙන් ප්‍රමාදවනවා. එම නඩු ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා මින් ඉදිරියට කම්කරු විනිශ්චය සභා හරහා කම්කරුවන්ගේ ගැටලු විසඳීමට ක්‍රියා කරනවා.

ලොවම කොරෝනා වසංගතයට නතු වී ඇති අවස්ථාවක මෙරට කොවිඩ් මර්දන ව්‍යාපෘතිය සාර්ථකව සිදුකෙරෙමින් යනවා. එමෙන්ම විදේශීය රටවල සිට පැමිණෙන ශ්‍රමිකයන් හට දින හතක කාලයක් නොමිලයේ නිරෝධායනය ලබාදීම සඳහා රජය අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. විපක්ෂය එය නොදැන බොරු ප්‍රචාර යවනවා.

**මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා :**

"වත්මන් රජය මේ වන විට දේශීය නිෂ්පාදන වැඩි කිරීමේ දැවැන්ත ක්‍රියාවලියක නිරතව සිටිනවා. එහිදී කෘෂිකර්මාන්තය ඉහළ නැංවීමට විශාල වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වනවා. අද දේශීය කෘෂිකර්ම නිෂ්පාදනවලට ඉහළ මිලක් ගොවීන්ට ලැබෙමින් පවතිනවා. අපි රටේ ගොවිජනතාවට ශක්තිමත් ආර්ථිකයක් ලබාදීමට කැපවෙනවා" යැයිද ඔහු එහිදී පැවසීය.

කම්කරු කොමසාරිස් ජනරාල් ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතාද මෙහිදී අදහස් දැක්වීය.

# 'මේඩ් ඉන් ශ්‍රී ලංකා' ජය ලබන්නේ නූතන ජූනියස්ලාත්-ෆීලික්ස්ලාත් හඳුනාගත්තොත් විතරයි

## සිය රට දේ සිරි සැපදේ වැටුණේ විවෘත ආර්ථිකයෙන්

## විමල් වීරවංශ



කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතා අතින් සුළු හා මධ්‍ය පරිමාණ දේශීය නිෂ්පාදකයන් වෙත 'මේඩ් ඉන් ශ්‍රී ලංකා' සන්නාමය ප්‍රදානය කෙරුණු අයුරු.

(ඩයනා උදයංගනී)

**දේශීය නිෂ්පාදකයන් බලගැන්වීමේ අරමුණෙන් ක්‍රියාත්මක 'මේඩ් ඉන් ශ්‍රී ලංකා' වැඩපිළිවෙළ ජයග්‍රාහී අනාගතයක් කරා ගෙන යා හැක්කේ නූතන දේශපාලනයේ සිටින ජූනියස් රිචඩ් ජයවර්ධනලා සහ ෆීලික්ස් ඩයස්ලා හඳුනාගෙන ඉදිරියට ගියොත් පමණක් යැයි කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතා පෙරේද (31) පැවසීය.**

දේශීය නිෂ්පාදකයා සුන්නද්ධූලි කරමින් විදේශ නිෂ්පාදකයාට වෙළඳපොළ අත්පත් කරදුන් ජූනියස් රිචඩ් ජයවර්ධන ජනාධිපතිවරයාට එම පාර කපා දුන්නේ එවක පැවති සමගි පෙරමුණු ආණ්ඩුවේ සමගිය බිඳ දැමූ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා යැයි ද අමාත්‍යවරයා සඳහන් කළේය.

විමල් වීරවංශ මහතා මේ බව පැවැසුවේ කොළඹ හිල්ටන් රෙසිඩන්සීස් හෝටලයේ දී ඉකුත්ද (30 වැනිදා) පැවැති 'මේඩ් ඉන් ශ්‍රී ලංකා' සන්නාමය ප්‍රදානය කිරීමේ දෙවැනි අදියරට සහභාගී වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා මෙසේද පැවසීය.

අපේ දේශීය නිෂ්පාදකයන්ට 1977ට පෙර ඉතා ඉහළ වටිනාකමක් තිබුණා. එද උපාලි විජේවර්ධන මහතාගේ උපාලි ෆියට් කාර් එක, යුනික් රේඩියෝව මෙන්ම දේශීය නිෂ්පාදකයන් අතින් ට්‍රැක්ටර් ඇතුළු යන්ත්‍ර සූත්‍ර බිහිවුණා. 'සිය රට දේ සිරි සැප දේ' යන්න එද තේමා පාඨයක් වුණා. 1977දී ඒ ගමන බිඳ වැටුණා.

විවෘත ආර්ථිකයේ මුල් කාලය ඉතා ආස්වාදජනක ලෙස පෙනුණත් දැන් ඇවිත් තිබෙන්නේ අමාරු කාලයයි. දැන් අපට රුපියල් බිලියන ගණනාවක ණය වාරික ගෙවීමටත් ණය ගන්න සිදුව තිබෙනවා. ඩොලරයට සාපේක්ෂව රුපියල අර්බුදයට ගොස් තිබෙනවා. දැරිය නොහැකි විනිමය ප්‍රමාණයක් පිටරටට ඇදී යනවා. අපි මේ අවස්ථාවේදී හෝ ස්වදේශීය නිෂ්පාදන බලගන්වමින් පිටරටට ඇදී යන මුදල් අවම කළ යුතුයි.

පිළිකා කාරක සහිත පොල් තෙල් එන්න කලින් පිළිකා කාරක සහිත පාම් ඔයිල් වෙළඳපොළේ තිබුණා. 'එළවළු තෙල්' කියා විකුණුවාට එහි ඇති එළවළුවක් නැහැ. ඌරු තෙල් තිබෙන පිටි වර්ග, පිළිකා කාරක සහිත පාම් ඔයිල් දරුවන්ට කවමින් ගියොත් අපට සියල්ල අහිමි වේවි. පොල් තෙල්වල පිළිකාකාරක ඇති බවට හඬ නගන්නේ පාම් ඔයිල් මෙරටට ගෙන්වූ පිරිසයි. ඒ අපි පාම් ඔයිල්වලට වැට බැන්ද නිසයි. මේ සියල්ල පිටුපස වෙළඳ න්‍යාය පත්‍රයක් තිබෙනවා. එය නිවැරදිව කියවා ගත යුතුයි.

මෙරට 1970-77 කාලයේ පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සමගි පෙරමුණු ආණ්ඩුව ස්වදේශිකත්වයට පණ දුන්නා. ඒ ආණ්ඩුවේ සිටි 'ෆීලික්ස් ඩයස්' මහත්තයා ශ්‍රී.ල.නි.ප තනි පාලනයක් ගන්න හිතාගෙන ලංකා සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය එළියට දැමූ නිසා 1977 දී 'ජූනියස් රිචඩ් ජයවර්ධන' ජයග්‍රහණය කළා. නිදහස් පක්ෂය ආසන අටට බැස්සා. මේඩ් ඉන් ශ්‍රී ලංකා ගමන වෙනුවට, පිටරටින් දේවල් ගෙනත් කාලා බීලා, බල්ලො මරලා හරි සල්ලි හොයන කෙටි ගමන ආරම්භ වුණා. එයට ෆීලික්ස් ඩයස්ගේ උද්දච්ච, නොමේරූ මනස ඉවහල් වුණා. එද සමගි පෙරමුණු ආණ්ඩුවේ සමගිය රැකුණා නම්, ජූනියස් රිචඩ් පරිච්ඡේදයක් ආරම්භ වෙන්නේ නැහැ. ස්වදේශික නිෂ්පාදකයා සුන්නද්ධූලි කර විදේශ නිෂ්පාදන වෙළෙඳපොළ අත් කර ගත්තේ ඒ දේශපාලන වරද නිසයි. මේ තත්ත්වය ඇති වුණේ ජූනියස් රිචඩ් ජයවර්ධන මෙන්ම එතැනට පාර කැපූ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායකලාත් නිසයි.

නූතන දේශපාලනයේත් ජූනියස් රිචඩ් ජයවර්ධනලා වගේම ෆීලික්ස් ඩයස්ලා ඇති. 'මේඩ් ඉන් ශ්‍රී ලංකා' වැඩපිළිවෙළ ජයග්‍රාහී අනාගතයක් කරා ගෙන යා හැක්කේ ඒ අය හරියට හඳුනාගෙන ගමන ගියොත් පමණයි." යැයි ද ඇමතිවරයා කීවේය.

වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ප්‍රසන්න රණවීර, කර්මාන්ත අමාත්‍ය උපදේශක සුනිල් හෙට්ටිආරච්චි, අතිරේක ලේකම් චාමින්ද පතිරාජ, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති අනුෂ්ක ගුණසිංහ යන මහත්වරුන් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

# කලවම් වෙච්ච ආණ්ඩුවක් හදන්න අපි ලෑස්ති නෑ

## විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස කියයි





විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා සභාව ඇමතූ අයුරු

(අලුත්ගම තුසිත කුමාර ද සිල්වා)

**සමගි ජනබලවේගය ඉදිරියේ දී බිහි කරන්නේ මිශ්‍ර රජයක් නොවන බවත් රටේ ජන කොට්ඨාස නියෝජනය වන සංස්කෘතියද සමග වන දේශපාලන ගමනක් බවත් සමගි ජනබලවේගය නායක හා විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා බේරුවලදී පැවසීය.**

ප්‍රේමදාස මහතා මේ අදහස් පළ කළේ සමගි ජනබලවේගය බේරුවල මොරගල්ල කාර්යාල පරිශ්‍රයේ පැවැති 'ජන දුක විමසන විපක්ෂනායක ජංගම සත්කාරය' ජනහමුව අමතමිනි.

තවදුරටත් සජිත් ප්‍රේමදාස මහතා මෙසේද පැවසීය.

අපේ අනාගත රජය මිශ්‍ර රජයක් නොවෙයි. තනි ශුද්ධ පිරිසිදු සමගි ජනබලවේග ආණ්ඩුවක්. හැබැයි සමගි ජනබලවේග ආණ්ඩුව පිහිටුවීම සඳහා පාර්ලිමේන්තුවේ බහුතරය ගෙන ඒ බහුතරයට අමතර කොට්ඨාස අපි සංවිධානගත කරනවා. රටේ විවිධ ජන කොට්ඨාස සමග එකට ඒකාබද්ධ වෙලා රටේ සංස්කෘතිය නියෝජනය වන ආකාරයට දේශපාලන ගමනක් යාම බොහොම වැදගත් වෙනවා.

රජයේ සීනි මගඩියෙන් පසු පොල් තෙල් මගඩිය ක්‍රියාත්මක වෙලා. සීනි මගඩියටත් වඩා භයානක මගඩියක් දැන් සීනි මගඩියෙන් රටට කෝටි 1590 ක් අහිමි වුණා. පොල්තෙල් මගඩියෙන් අහිමි වන දේවල් මුදලින් තක්සේරු කරන්නට බැහැ. ඒවායින් අහිමි වන්නේ මිනිස් ජීවිත. පිරිපහදු නොකරපු පොල් තෙල් ගෙන්නපු සමාගම් තුනෙන් එක සමාගමක් පළමුවැනි වතාවට ෆේල් වෙලා, දෙවැනි වරටත් ෆේල් වෙලා. ආහාරවල තිබෙන ගුණාත්මකභාවය පිළිබඳව පරීක්ෂණ කර මේවා ජනතා පරිභෝජනයට සුදුසුද නැද්ද කියන කාරණාව රටට හෙළිදරව් කිරීම පිළිබඳව මා සෞඛ්‍ය නිලධාරීන්ට විශේෂ ස්තුතියක් කරනවා.

ප්‍රමිතිකරණ ආයතනයේ මෙයට අදාළ නිලධාරීන් රේගුවේ නිලධාරීන් රට ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නේ නැතුව විවිධ බලපෑම් මත සමාගම්වල බලපෑම්වලට යටත් වෙලා දැයි කියා සැක හිතෙනවා.

වෙළෙඳ ඇමැති බොහොම විහිළු සපයනවා. එතුමා කියන්නේ ජනතාවට හොඳම පොල් තෙල් පිළිබඳව හොයා බලා පරිහරණය කරන්නලු. 69 ලක්ෂයක් ජනාධිපතිවරණයේදී 68 ලක්ෂයක් මහ මැතිවරණයේදී මේ ආණ්ඩුව පත්කර ගන්නට කටයුතු කළේ ඔය වගේ උත්තර ගන්නද? එක පැත්තකින් පොල් තෙල් මගඩිය නිසා ජනතාවගේ ජීවිත අනතුරේ. තවත් පැත්තකින් මොකක්ද කරන්නේ. තවත් පැත්තකින් පරිසර හානිය.

එක ක්‍රමයකින් පොල්තෙල් ජාවාරම් කර කුට්ටි පිටින් ඩොලර් උපයා ජනතාවගේ ජීවිත අනතුරට පත් කරනවා. තවත් පැත්තකින් රටේ පරිසරය විනාශ කරලා. මා පැහැදිලිව කියන්න කැමතියි සමගි ජනබලවේගයේ අපි පරිසර හිතකාමී මේ රටේ පළමුවැනි හරිත පක්ෂයත් අපේ පක්ෂයයි. පරිසරයට මුල්තැන දී කටයුතු කරනවා විතරක් නොවෙයි අනාගතයේදී ජනතාවගේ සෞඛ්‍ය සම්පන්නභාවය ශක්තිමත් කරන්න අනිවාර්යයෙන්ම කටයුතු කරනවා.

රෝහල්ගතව සිටින රෝගීන්ට පිට ෆාමසිවලින් මුදලට ඖෂධ ගන්නැයි කියා චිට් එක දෙන යුගයක් අද රටේ නිර්මාණය වෙලා. ඒ වගේම ආරම්භ කරන සෞඛ්‍ය සංවර්ධන ක්‍රියාදම සියල්ලක්ම ජනතාවට අහිමි කර තිබෙනවා. හොඳට මතක තියා ගන්න සමගි ජන බලවේගය කියන්නේ පොදු ජනවාදී පොදු ජන හිතකාමී පරිසරයට ඇලුම් කරන ජනතාව ජීවත් කරවන අපේම පොදු ජන ආණ්ඩුවක්.

එය කලවම් වෙච්ච ආණ්ඩුවක් නෙවෙයි. ආණ්ඩුවක් බිහි කිරීමේ අරමුණින් පමණක් නිර්මාණය වන ආණ්ඩුවකුත් නෙවෙයි. ප්‍රතිපත්ති මත විද්‍යාර්ථික තාක්ෂණික වැඩපිළිවෙළක් මත සැලැස්මක් මත අප ජනතාවට පැහැදිලි පොරොන්දුවක් දෙනවා. අපේ රට නව සංවර්ධිත යුගයක් කරා අප ගෙන යනවා. ඒ ගෙන යන ගමනේදී මානුෂීයත්වයට මුල් තැන දෙමින් ශක්තිමත් කරනවා යැයිද පැවසීය.

හිටපු සෞඛ්‍ය අමාත්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී දෙස්තර රාජිත සේනාරත්න සහ බේරුවල සමගි ජනබලවේගයේ සම සංවිධායක ඉෆ්තිකාර් ජෙමීල් යන මහත්වරු ද මේ අවස්ථාවට එක් වී සිටියහ.

### අනේද කියන්නෙ ! – තලන්

| | |
|---|---|
| තේ-පොල්-රබර් මතකද සුද්දගෙ | කාලේ |
| ආදයම රටේ සවිමත් කළ | තාලේ |
| පොල්තෙල් රටට එයි දැන් පිටරට | මෝලේ |
| පැටලී සිටී රට පිළිකා පඹ | ගාලේ |

# ජනතාවට වසවිස දෙන ආණ්ඩුවකට රටක් හැටියට ඉදිරියට යන්න පුළුවන්ද?

## සමන් රත්නප්‍රිය කියයි



(අංජුල මහික වීරරත්න)

**ඡන්දය දුන් ජනතාවටවත් ගරු කර ඔවුනට වස විස කවන්නේ නැතිව සහ වනාන්තර කපා හුස්ම ගැනීමේ අයිතිය පවා අහිමි නොකර රට පාලනය කරන්නැයි ආණ්ඩුවෙන් ඉල්ලා සිටින බව රජයේ හෙද නිලධාරීන්ගේ සංගමයේ සභාපති සිවිල් සංවිධාන එකමුතුවේ කැඳවුම්කරු සමන් රත්නප්‍රිය මහතා පැවැසීය.**

ජනතාවට විස කවන ආණ්ඩුවකට රටක් ඉදිරියට ගෙනියන්න පුළුවන්දැයි සමන් රත්නප්‍රිය මහතා එහිදී ප්‍රශ්න කළේය.

පුංචි බොරැල්ල හෙද සංගම් මූලස්ථානයේ ඉකුත් 30 වැනිද පැවැති මාධ්‍ය හමුවේදී සමන් රත්නප්‍රිය මහතා මෙසේද කීවේය.

වත්මන් ආණ්ඩුව සීගිරිය ආසන්නයේත් හෝටලයක් ඉදි කරන්නට මාන බලමින් සිටිනවා. එමෙන්ම දේවි බාලිකා විද්‍යාලයේ ඉඩම පරිසර විනාශ කරන අයට දී එහි දැවමය වටිනාකම තම ගෝල බාලයන්ට දෙන තත්ත්වයකට පත්ව සිටිනවා.

අද වෙන විට සමාගම් තුනක් පිළිකා කාරක සහිත පොල් තෙල් ගෙන්වා තිබෙනවා. මෙලෙස ගෙන්වූ පොල් තෙල්වල පිළිකා කාරක අඩංගු බවත් මේ වන විට සොයාගෙන තිබෙනවා.

ආණ්ඩුව මේ වන විට පොල්තෙල් ආනයනය කළ සමාගම් තුනකට අයත් කන්ටේනර් 13ක් සීල් තබා තිබෙනවා. වරායේ තිබූ කන්ටේනර් පිටවුණා ද නැද්ද යන කාරණය ආණ්ඩුවට ඉතා පහසුවෙන් සොයා ගත හැකියි.

ඒත් ආණ්ඩුවේ ඇමතිවරුන් කළ යුතු දේ නොකර විහිළු කතා සපයමින් සිටිනවා. මේ පිළිකා කාරක පොල් තෙල් ගෙන්වූයේ කවුරුද යන කාරණය ආණ්ඩුවට ඉතා පහසුවෙන් විනිශ්චය කළ හැකියි. එසේ නොකර ආණ්ඩුව තම ගෝල බාලයන් ගෙන්වූ පොල් තෙල් පිළිබඳ ප්‍රශ්නයෙන් පැන යන්නට උත්සාහ කරනවා නම් එය ජනතාවට කරන බරපතළ අපරාධයක් බව පැහැදිලිවම කිව යුතුයි.


ආණ්ඩුව ජනතාව අමාරුවේ දැමීම සඳහා බයිලා කියමින් සිටිනවා. වත්මන් ආණ්ඩුව සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙන් ජනතාවට විස පොල් තෙල් කවා ඇති බව ඉතාම පැහැදිලියි. මුලින්ම බදු අඩුකිරීමේ පට්ටපල් බොරුවක් කර සීනිවලිනුත් ගසා කෑවා.

මේ වගේ ආණ්ඩුවකින් රටට එලක් තිබෙනවාද? ජනතාව මේ ගැන නැවත කල්පනා කළ යුතුව තිබෙනවා.

පාස්කු ප්‍රහාරයට මේ වන විට දෙවසරක් ගතවී තිබෙනවා. ජනාධිපතිවරයා බලයට පත්වී වසර එක හමාරක් පමණ වෙනවා. ඔහු ඒ කාලය තුළ පාස්කු ප්‍රහාරයේ මොළකරුවන් හෙළිදරව් කර ගන්න කළේ මොනවාද? කිසිම දෙයක් කර නැහැ.

තෙල් මිල වැඩි කිරීමට ආණ්ඩුව උත්සාහ කරනවා. තෙල් මිල වැඩි කිරීමට වේවි වැනි ප්‍රකාශ කරමින් සිටිනවා. මෙය තනිකරම වංචාවක්. ආණ්ඩුව බලයට පත්වී පසුගිය වසරේ මාර්තු සිට නොවැම්බර් දක්වාම බොර තෙල් බැරලයක මිල පැවතුණේ ඩොලර් 40කටයි. මේ අඩුවීම හමුවේ රටේ තෙල් මිල අඩු කළේ නැහැ.

ජනතාවට විස කවන ආණ්ඩුවකට රටක් ඉදිරියට ගෙන යන්න පුළුවන් ද? අඩු තරමින් ඡන්දය දුන් ජනතාවටවත් ගරු කර ඒ අයට වස විස කවන්නේ නැතුව, ජනතාවට අයත් වනාන්තර කපන්නේ නැතිව ජනතාවගේ හුස්ම ගැනීමේ අයිතිය නැති කරන්නේ නැතිව රට පාලනය කරන්නැයි ආණ්ඩුවට පවසනවා යැයිද කීය.



# ඉන්දියාවේ 45 ට වැඩි සැමට එන්නත්



නවදිල්ලියේදීය (රොයිටර්)

**ඉන්දියාවේ අවුරුදු 45 ට වැඩි සියලු දෙනාට එන්නත් ලබා දීම, ඊයේ (1) සිට ආරම්භ විය.**

ඉන්දියාවේ පූනේ නුවර 'සේරම්' ඖෂධ නිෂ්පාදන සමාගම නිපදවන, 'ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනකා කොවිෂීල්ඩ්' එන්නත අපනයනය තාවකාලිකව නවතා දැමීමට ඉන්දීය රජය තීරණය කළේ, එම එන්නත ඉන්දියානුවන්ට ලබා දෙන බැවිනි.

ඉන්දීය රජය, එරට අවුරුදු 45 ට වැඩි සැමට එන්නත ලබා දීමට තීරණය කළේ එරට දෛනික ආසාදිතයන් දිනෙන් දින වැඩිවීම සැලකිල්ලට ගනිමිනි. ඉන්දියාව ඔවුන්ගේ එන්නත්කරණ වැඩසටහන ආරම්භ කළේ පසුගිය ජනවාරි 16 වැනිදාය. එන්නත්කරණ වැඩසටහන යටතේ එන්නත් මාත්‍රා කෝටි 6.43 ක් මේ වනවිට ලබා දී අවසන්ය.

ඉන්දියාවේ 'භාරත් බයෝටෙක්' ඖෂධ නිෂ්පාදන සමාගම නිපදවා ඇති 'කොරෝනාවැක්' නමැති එන්නත ද ඉන්දියානුවන්ට හිමිවෙයි. මෙය සියයට සියයක් ඉන්දීය තාක්ෂණයෙන් නිපද වූ එන්නතකි. ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි ඇතුළු ඉන්දීය මැති ඇමැතිවරුන් ලබාගෙන ඇත්තේ ද මෙම එන්නතය. කෙසේ නමුත් මෙම 'කොවැක්සින්' ප්‍රතිශක්තිකරණ එන්නත බ්‍රසීලය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ තිබේ.

'කොවැක්සින්' එන්නත් මිලියන දෙකක් මිලදී ගැනීමට බ්‍රසීල රජය සූදානම් විය. කෙසේ නමුත් බ්‍රසීල ඖෂධ නියාමන අධිකාරිය එන්නත සුදුසු නැති බව තීරණය කළේය. ඒ අනුව, ලබා දුන් ඇණවුම අවලංගු කෙරුණු බව වාර්තා වේ.

ඊයේ (1) වනවිට ලෝකයේ සමස්ත 'කොවිඩ් 19' ආසාදිතයන් ගණන 1,29,495,677 තෙක් ඉහළ ගියේය. කොරෝනා මරණ වාර්තා වූයේ 2,828,629 ක් ලෙසය. 'කොවිඩ් 19' වයිරසය ආසාදනය වී පූර්ණ සුවය ලැබූ ගණන 104,436,543 පසු කර තිබේ.

කොරෝනා ආසාදිතයන් සහ මරණ අතින් ලොව තෙවැනි ස්ථානයේ පසුවන්නේ ඉන්දියාවය. ඉන්දියාවෙන් වාර්තා වන 'කොවිඩ් 19' ආසාදිතයන් ගණන 12,221,665 කි. ඊයේ (1) වනවිට මරණ වාර්තා වූයේ 1,62,960 ක් ලෙසය.

ඉන්දියාවේ කොරෝනා ආසාදිතයන් හිටිහැටියේ ඉහළ යෑමට පටන් ගත්තේ ඉන්දුයානුවන් නිසි සෞඛ්‍ය උපදෙස් පිළිනොපැදීම සහ විකෘති කොරෝනා වයිරස ප්‍රභේද ව්‍යාප්තවීම නිසා යැයි එරට සෞඛ්‍ය අංශ පවසයි.

## ඇමෙරිකාවේ තවත් වෙඩි තැබීමක්

## 4 ක් මරුට

ලොස් ඇන්ජලීස්හිදීය (රොයිටර්)

**ඇමෙරිකාවේ කැලිෆෝනියා ප්‍රාන්තයේ, ඔරේන්ජ් නගරයේ ව්‍යාපාරික ස්ථානයක සිදුවුණු වෙඩි තැබීමකින් කුඩා දරුවකු ඇතුළු සිව් දෙනෙක් ජීවිතක්ෂයට පත් වූහ.**

වෙඩි තැබීම සිදු කළ තැනැත්තා ජීවග්‍රහයෙන් අල්ලා ගැනීමට පොලිසිය සමත් වූ බව ද පැවැසෙයි. වෙඩි ප්‍රහාරයට ලක්වීමෙන් තුවාල ලැබූ තවත් දෙදෙනකු රෝහල් ගත කෙරුණි.

## නිෂ්පාදනාගාරයේ දෝෂයක්:


## ජොන්සන් ඇන්ඩ් ජොන්සන් එන්නත් මිලියන 15 ක් ඉවතට

නිවේයෝක් නුවරදීය (රොයිටර්)

**නිෂ්පාදනයේ සිදුවුණු අත්වැරදීමක් නිසා, 'ජොන්සන් ඇන්ඩ් ජොන්සන්' සමාගමේ කොරෝනා ආසාදනය වළක්වන ප්‍රතිශක්තිකරණ එන්නත් මාත්‍රා මිලියන 15 ක් ඉවත දැමීමට සිදුවී ඇතැයි වාර්තාවේ.**

'ජොන්සන් ඇන්ඩ් ජොන්සන්' සමාගමේ කොරෝනා ආසාදනය වළක්වන ප්‍රතිශක්තිකරණ එන්නත නිපදවීම සිදු කරන්නේ 'ජොන්සන් ඇන්ඩ් ජොන්සන්' සමාගම හරහාය. මෙය ඇමෙරිකන් සමාගමකි. මූලික විමර්ශන අනුව, පෙනී ගොස් ඇත්තේ, 'අත්වැරදීමක්' නිසා දෝෂ සහිතව එන්නත් මාත්‍රා මිලියන 15 ක් නිපදවා ඇති බවය. 'අත්වැරදීම' සිදුවී ඇත්තේ බොල්ටිමෝර් මේරිලන්ඩ් හි පිහිටි එන්නත් නිෂ්පාදනාගාරයේය.

## ආසාදිතයන් වැඩිවෙලා: ප්‍රංශය යළි ලොක්ඩවුන්



පැරිසියේදීය (රොයිටර්)

**'කොවිඩ් 19' හෙවත් නව කොරෝනා වයිරස ආසාදිතයන් වැඩිවීමට පටන්ගෙන ඇති බැවින්, සති තුනක කාලයක් සඳහා පාසල් වසා දමා, ප්‍රංශය ලොක්ඩවුන් කිරීමට ජනාධිපති ඉමැනුවෙල් මැක්රොන් තීරණය කළේය.**

ප්‍රංශ ජනාධිපතිවරයා මෙසේ තීරණය කළේ සෞඛ්‍ය අංශ ලබා දුන් උපදෙස් අනුවය. 'ආසාදිතයන් යළි ඉහළ යෑමට පටන්ගෙන තිබෙනවා. සෞඛ්‍ය අංශ උපදෙස් තිබෙනවා රට වහන්න. මේ මොහොතේ අප රට වසා වයිරස ව්‍යාප්තිය පාලනය කරගත්තේ නැතිනම් වයිරස ව්‍යාප්තිය පාලනය කර ගන්න අපට නොහැකි වේවි' යැයි රූපවාහිනිය ඔස්සේ ජාතිය අමතමින් මැක්රොන් අවධාරණය කළේය.

## කැනඩාවේ ජර්මනියේ ඇස්ට්‍රාසෙනකා තහනම දිගටම

බර්ලිනයේදීය (රොයිටර්)

**අවුරුදු 60 ට වැඩි පුද්ගලයන්ට 'ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනකා' එන්නත ලබා නොදීමට ගත් තිරණය වෙනස් නොකරන බව කැනඩාවත් ජර්මනියත් පවසයි.**

කැනඩාව සහ ජර්මනිය මෙසේ පවසා ඇත්තේ, අවුරුදු 60 ට වැඩි අයට එන්නත නොදීමට ගත් තීරණය වෙනස් කරන්නැයි 'ඇස්ට්‍රාසෙනකා' ඖෂධ නිෂ්පාදන සමාගම සහ ලෝක සෞඛ්‍ය සංවිධානය කළ ඉල්ලීම බැහැර කරමිනි.

ජර්මන් සෞඛ්‍ය බලධාරීන්, එරට ඇස්ට්‍රාසෙනකා එනන්නත 60 ට වැඩි අයට ලබා නොදීමට තීරණය කළේ, මිලියන 2.7 කට ඇස්ට්‍රාසෙනකා එන්නත් ලබා දී තිබියදීය.

එන්නත ලබා ගත් 60 වැඩි 31 දෙනකු රුධිරය කැටි ගැසීම හේතුවෙන් රෝහල්ගත කළ බව වාර්තාවෙයි. ජර්මන් සෞඛ්‍ය අංශ එන්නත නවතා දැමීමට තීරණය කළේ එහෙයිනි.

රුධිර කැටි ගැසීම් හේතුවෙන් මීට පෙර කැනඩා සෞඛ්‍ය අංශ එරට 55 ට අඩු අයට 'ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනකා' එන්නත ලබා නොදීමට තීරණය කර තිබුණි.

කෙසේ නමුත් 'ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනකා' එන්නත සම්බන්ධයෙන් කළ පුළුල් අධ්‍යයනයකින් පසු, මේ වනවිට එන්නත ලබා නොදෙන්නේ අවුරුදු 60 ට වැඩි කැනඩා වැසියන්ටය. 60 අඩු කැනඩා වැසියන්ට 'ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනකා' එන්නත ලබා දීම සිදුවෙයි.




1 වැනි පිටුවෙන්

# අයි.ඩී.එච් රෝහලේ කොරෝනා රෝගීන් ගණන හරි අඩකින් අඩුවෙලා

(සුජිත් හේවාජුලිගේ)

**අයි.ඩී.එච්. රෝහලේ කොරෝනා රෝගීන් සංඛ්‍යාව හරි අඩකින් පමණ අඩුවී ඇතැයි එහි අධ්‍යක්ෂ වෛද්‍ය හසිත අත්තනායක මහතා පැවැසීය.**

කොරෝනා රෝගීන්ට ප්‍රතිකාර ලබාදෙන දිවයිනේ ප්‍රධාන රෝහල ලෙස ක්‍රියාත්මක වන්නේ අයි.ඩී.එච්. රෝහලයි.

කොරෝනා ආසාදිතයන් දෙසීයකට වැඩි පිරිසක් අයි.ඩී.එච්. රෝහලේ මෙයට පෙර ප්‍රතිකාර ගත් බව කී රෝහල් අධ්‍යක්ෂවරයා එම රෝගීන් සංඛ්‍යාව මේ වන විට සියයකට ආසන්න සංඛ්‍යාවක් දක්වා පහත බැස ඇතැයිද ප්‍රකාශ කළේය.

රෝහලේ සියලුම වාට්ටු පසුගිය කාලයේ එක්තරා අවස්ථාවක සම්පූර්ණයෙන්ම පිරී පැවතුන බවද අත්තනායක මහතා කීය.

එන්නත්කරණයත් සමගම කොරෝනා රෝග ව්‍යාප්තිය පහත බැසීම රෝහලේ රෝගීන් සංඛ්‍යාව අඩුවීමට බලපෑ ප්‍රධාන හේතුව බවත් රෝගීන් සංඛ්‍යාව මෙලෙස අඩුවී ඇතත් ඕනෑම අවදානමකට මුහුණ දීමට රෝහලේ පහසුකම් සූදානම් කර තබා ඇති බවත් එහි නිලධාරීහු පවසති.

# අවුරුදු උත්සව සංගීත ප්‍රසංග තහනම්

(සුජිත් හේවාජුලිගේ)

**එළැඹෙන අවුරුදු සමයේ දී මහා පරිමාණ සැණකෙළි හා සංගීත ප්‍රසංග යනාදිය පැවැත්වීම සම්පූර්ණයෙන්ම තහනම් බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධානී විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා පැවැසීය.**

කොරෝනා ව්‍යාප්තිය පාලනය කිරීමේ පියවරක් ලෙස මෙම තීරණය ගත් බවද ඔහු කීය.

ගම්වල සංවිධාන කෙරෙන කුඩා කුඩා අවුරුදු උත්සවලට පමණක් අවසර ලබාදෙන බව කී විශේෂඥ වෛද්‍යවරයා සෞඛ්‍ය අංශ ලබාදෙන සෞඛ්‍ය මාර්ගෝපදේශවලට යටත්ව ඒ උත්සව සංවිධාන කළ යුතු බවද ප්‍රකාශ කළේය.

අවුරුදු උත්සවලදී පුද්ගලයින් අල්ලන හෝ සමීපව ගැටෙන ක්‍රීඩාවලට අවසර නොලැබෙන අතර පුද්ගල දුරස්ථභාවයෙන් යුතුව කළ හැකි ක්‍රීඩාවලට පමණක් අවසර ලැබෙන බවද සමරවීර මහතා පැවැසීය.

අවුරුදු සමයේදී අතට අතදීම් හා වැළඳ ගැනීම් ද තහනම් බව සෞඛ්‍ය අංශ ප්‍රධානීහු පවසති.

අවුරුදු සමයේදී අනුගමනය කළ යුතු සෞඛ්‍ය නීති රීති ඇතුළත් මාර්ගෝපදේශ මාලාව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා විසින් ඊයේ (1) නිකුත් කරනු ලැබීය.

මේ අතර අවුරුදු උත්සව සමයේදී සංචාරණ හැකිතාක් සීමා කරන්නැයි සෞඛ්‍ය අංශ ප්‍රධානීහු ජනතාවගෙන් ඉල්ලා සිටිති.

# අක්ෂිදන සංගමයේ ලක්ෂ 60ක අවුරුදු දීමනා ගෙව්වාට විමර්ශනයක්

## කොළඹ වංචා විමර්ශනය උසාවියට දන්වයි

(නිමන්ති රණසිංහ)

**අක්ෂිදන සංගමයේ රුපියල් ලක්ෂ 60කට ආසන්න මුදලක් නිසි අවසරයකින් තොරව "විශේෂ අලුත් අවුරුදු දිරි දීමනා" වශයෙන් සේවකයන්ට ගෙවා විශ්වාසය කඩකිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇතැයි කොළඹ වංචා විමර්ශන කාර්යාංශය කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට ඊයේ (01) කරුණු වාර්තා කර ඇත.**

ඉකුත් වසරේ අප්‍රේල් මස 01 වැනිද කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට වවුචර් 06කින් "විශේෂ අලුත් අවුරුදු දිරි දීමනා" වශයෙන් රුපියල් පනස් පන් ලක්ෂ තිස් දෙදහස් පන්සිය හතළිස් හතයි ශත විසි නවයක (55,32547.29/ක) මුදලක් මෙලෙස ගෙවා ඇත්තේ අක්ෂිදන සංගමයේ සභාපතිවරයාගේ අනුමැතියකින් තොරව බව ද එම කාර්යාංශය අධිකරණයට කරුණු ඉදිරිපත් කර තිබේ.

මෙය ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 389, 386 වගන්ති ප්‍රකාරව වරදක් බව සඳහන් කරමින් මෙම සිද්ධිය අධිකරණය වෙත වාර්තා කරනු ලැබුවේ කොළඹ වංචා විමර්ශන කාර්යාංශයේ ඒකක 06 හි ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කොඩිකාර මහතා විසිනි.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් කොළඹ වංචා විමර්ශන කාර්යාංශය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත්තේ අක්ෂිදන සංගමයේ සාමාජිකයකු වන හදරාගමගේ දෙන් ගාමිණී විජේසේකර මහතා විසිනි.

සාමාජිකයක් දහසක් පමණ සිටින මෙම සංගමයේ දිවයින පුරා ශාඛා 300ක් පමණ පිහිටුවා ඇති බවත් මියගිය පුද්ගලයන්ගේ ඇස් ලබාගෙන සුදුසු ආකාරයට සකස්කර මෙරට ඇස් අවශ්‍ය අයට නොමිලේ ලබා දීම මෙම සංගමය මගින් සිදුකරනු ලබන බවත් පැමිණිල්ල සඳහන් කර ඇත.

විදේශවලින් ඇණවුම් ලැබුණ හොත් නියමිත පරිදි එම ඇස් සකස් කිරීමට වැයවන මුදල් ආධාරයක් ලෙස ලබාගෙන ඇස් ලබාදීම ද මෙම සංගමය මගින් සිදුකරනු ලබන බව ද පැමිණිලිකරු සඳහන් කර තිබේ.

මෙම සංගමය සභාපති ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු කෘත්‍යාධිකාරී මණ්ඩලය සාමාජිකයන් 15 දෙනකුගෙන් සමන්විත වන අතර, සංගම් ව්‍යවස්ථාවට අනුව රුපියල් 50,00කට වැඩි ගෙවීම් භාරකාර මණ්ඩලයේ අනුමැතිය ඇතිව පමණක් සිදු කළ යුතුව ඇති බව ද පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇත.

කෙසේ වෙතත් විදුලි, දුරකතන සහ ජල බිල්පත්වලට අදාළ මාසිකව නිශ්චිතව ගෙවිය යුතු ගෙවීම් සංගමයේ සභාපතිවරයාගේ අනුමැතියකින් තොරව ගෙවිය හැකි බව ද පැමිණිල්ලේ දක්වා තිබේ.

"විශේෂ අලුත් අවුරුදු දිරි දීමනා" වශයෙන් සංගමයෙන් ගෙවා ඇති අදාළ මුදල සඳහා වන වවුචර්පත් සඳහා සභාපතිවරයාගෙන් කිසිදු ලිඛිත අනුමැතියක් ලබාගෙන නොමැති අතර, ඔහුගේ අස්සන වෙනුවට ලේකම් ලෙස කටයුතු කළ ඊ.එම්. එච්.බී. මොරගස්වැව මහතා සහ භාණ්ඩාගාරික ලෙස කටයුතු කළ සම්පත් ද සිල්වා යන අය අස්සන් තබා ඇතැයි ද පැමිණිල්ල සඳහන් කර ඇත.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් අක්ෂිදන සංගමයේ භාරකාර මණ්ඩලයේ සභාපති චන්දිම අමරසූරිය මහතාගෙන් ප්‍රකාශයක් සටහන් කර ගත් බවත් සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුරටත් විමර්ශන සිදුකරමින් පවතින බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට කරුණු වාර්තා කර තිබේ.

# කොවිකොඩිත්තාල් රක්ෂිතය ඩෝසර් කර හේනක් හදද්දී මාට්ටු

(ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය)

**අඩප්පන් පොලිස් වසමට අයත් මුක්කම්පන්, කොවිකොඩිත්තාල් රක්ෂිත වනාන්තරය තුළ කැටපිලර් යන්ත්‍රයක් යොදු ගනිමින් වගා භූමියක් සකස් කර මින් සිටි බව කියන පුද්ගලයකු පෙරේද (31) අත්අඩංගුවට ගත් බව පොලිස් විශේෂ කාර්ය බළකාය කියයි.**

පොලිස් විශේෂ කාර්ය බළකායේ මන්නාරම කඳවුරේ පොලිස් පරීක්ෂක යූ.ඩී.එස්. ප්‍රසන්න මහතා ඇතුළු පොලිස් නිලධාරීන් කණ්ඩායමක් සහ අඩම්පන් අඩවිවන නිලධාරී කාර්යාලයේ නිලධාරීන් කණ්ඩායමක් ඒකාබද්ධව මෙම වැටලීම සිදුකර ඇත.

වගා බිම් සකස් කිරීමට යොදා ගත් කැටපිලර් යන්ත්‍රය ද පොලිස් බාරයට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරු 29 හැවිරිදි අලව්ව පස්ගොඩ කන්ද ප්‍රදේශයේ පදිංචි අයෙකි.

## කොත්වැව රක්ෂිතයේ තවත් ගස් කැපීමක්

මේ අතර පදවිය කපුකොල්ලදුව, කොත්වැව රක්ෂිත වනාන්තරයට ඇතුළු විශාල ප්‍රමාණයේ පළු ගසක් දම්වැල් ක්‍රියතක් උපයෝගී කරගනිමින් කපමින් සිටි බව කියන පුද්ගලයකු පෙරදා අත්අඩංගුවට ගත් බව විශේෂ කාර්ය බළකාය කියයි.

මෙසේ අත්අඩංගුවට ගනු ලැබ ඇත්තේ කපුගේල්ලෑව ප්‍රදේශයයේ පදිංචි 35 හැවිරිදි අයෙකි.

# දෙවැනි මාත්‍රාවට එන්නත් ලෑස්තියි

(සුජිත් හේවාජුලිගේ)

**ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනිකා කොවිෂීල්ඩ් කොරෝනා මර්දන එන්නතේ පළමු මාත්‍රාව ලබාගත් සියලු දෙනාට දෙවැනි මාත්‍රාව ලබාදීම සඳහා අවශ්‍ය එන්නත් තොග සෞඛ්‍ය අංශ සතුව පවතින බව කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී යුද හමුදපති ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවැසීය.**

ඒ සම්බන්ධයෙන් කිසිවකු කිසිදු බියක් ඇතිකර ගත යුතු නැතැයි කී යුද හමුදපතිවරයා දෙවැනි මාත්‍රාව නියමිත වේලාවට ලබාදීමට සියලු කටයුතු යොදා ඇතැයි ප්‍රකාශ කළේය.

මේ අතර රුසියාවේ නිෂ්පාදිත ස්පුට්නික් එන්නත් මාත්‍රා එක්කෝටි තිස් ලක්ෂයක් මිලදී ගැනීමට කැබිනට් මණ්ඩලය අනුමැතිය දී ඇති බවත් ඉන් එන්නත් මාත්‍රා ලක්ෂ හැත්තෑවක් ප්‍රථම අදියර යටතේ මෙරටට ලැබෙනු ඇති බවත් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවැසුවේය. බොහෝ දුරට එම ස්පුට්නික් එන්නත් තොගය මැයි මාසයේදී පමණ මෙරටට ලැබෙනු ඇතැයි යුද හමුදපතිවරයා විශ්වාසය පළ කළේය. ජනතාවට දෙවැනි මාත්‍රාව ලබාදීමට ප්‍රමාණවත් එන්නත් තොග නැතැයි විපක්ෂය පසුගියද චෝදනා කර තිබිණ.

# අවුරුදු සමයේ සෞඛ්‍ය නීති කැඩුවොත් තුන්වැනි රැල්ලක අවදානමක්

(සුජිත් හේවාජුලිගේ)

**සිංහල හින්දු අලුත් අවුරුදු සමයේදී ජනතාව සෞඛ්‍ය නීති නිසියාකාරව නොපිළිපැද්දෙත් කොරෝනා තුන්වැනි රැල්ලක් ඇතිවීමේ අවදානමක් පවතින බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා පැවැසීය.**

අලුත් අවුරුදු සමයේදී ජනතාව සියයට සියයක් පාලනය කිරීමේ හැකියාවක් නැතැයි ඔහු ප්‍රකාශ කළේය.

අලුත් අවුරුදු සමයේදී ජනතාව කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කරන බව කී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා අවුරුදු උත්සව ඉතාමත් කුඩාවට සංවිධාන කරන ලෙසට ඉන් උපදෙස් ලබාදෙන බවද පැවැසීය.

අලුත් අවුරුදු උත්සවවවලදී කණ්ඩායම් වශයෙන් කරන ක්‍රීඩාවලට ඉඩක් නොලැබෙන බවත් සෞඛ්‍ය නීතිරීති රකිමින් කළ හැකි ක්‍රීඩා ගැන සෞඛ්‍ය අංශ ඉදිරියේදී ජනතාවට කියාදෙන බවත් අසේල ගුණවර්ධන මහතා සඳහන් කළේය.

අවුරුදු සමයේදී සංචරණ සීමා කර සෞඛ්‍ය නීති නිසියාකාරව අනුගමනය කරන්නැයි තමා ජනතාවගෙන් ඉල්ලා සිටින බව ඔහු වැඩිදුරටත් පැවැසුවේය.

මේ අතර අවුරුදු සමයේදී සෞඛ්‍ය නීති කඩකරන්නන් ගැන සෙවිල්ලෙන් සිට අත්අඩංගුවට ගෙන නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා රටපුරා පොලිස් කණ්ඩායම් රැසක් සීරුවෙන් තබන බව පොලිස් මූලස්ථානය පවසයි.

## අනාගත රාජ්‍ය බලය ලබා ගැනීම අරමුණයි:

# ශ්‍රී.ල.නි.ප ඓතිහාසික මාතලේ ප්‍රකාශය නිකුත් කරයි

**අනාගතයේ දී රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා තේමා කිහිපයක් ඔස්සේ පක්ෂය මෙහෙයවන බවට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සභාපති හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රධාන එහි මධ්‍යම කාරක සභාව විශේෂ ප්‍රකාශයක් නිකුත් කරමින් කියා සිටී.**

එම පක්ෂය මාතලේ දී පැවැත්වූ උපාය මාර්ගික සැලසුම් සකස් කිරීමේ වැඩමුළුව අවසානයේ දී ඓතිහාසික මාතලේ ප්‍රකාශය නමින් නිකුත් කළ එම ප්‍රකාශනයේ මෙසේ ද සඳහන්ය.

ශ්‍රී බුද්ධ වර්ෂ 2564 ක් වූ මැදින් අව දියවක හා කියවක නම් තිථිය ලත් බුධ ගුරු දෙදින හෙවත්, ව්‍යවහාර රාජ්‍ය වර්ෂයෙන් 2021 ක් වූ මාර්තු 30 හා 31 දෙදින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකකාකාදීන් හා මධ්‍යම කාරක සභාව විසින් ශ්‍රී සෙංකඩ ශෛලාභිධාන පුරවරයේ දී උතුම් දළඳ වහන්සේ වැඳපුදාගෙන ජාතික වීරවරයන් සඳහා පුෂ්පෝපහාර පවත්වා මහා නායක මාහිමිපාණන් වහන්සේලා බැහැ දැක ආශිර්වාද ලබා ගැනීමෙන් අනතුරුව උතුම් ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කළාවූ ද 1848 තරම් මෑතක දී අධිරාජ්‍යවාදයට එරෙහිව තීරණාත්මක අරගලයක් වූ මහතලා හටනෙහි තීරණාත්මක සන්ධිස්ථානයක්වූ ද නාලන්ද ගෙඩිගේ ස්ථාපනයෙන් ලඞකාදීපයේ මධ්‍ය ප්‍රදේශය ලෙස හඳුනා ගැණුනාවූද ඓතිහාසික මාතලේ පුරවරයේ දී පවත්වන්නට යෙදුණ උපාය මාර්ගික සැලසුම් සකස් කිරීමේ වැඩමුළුව අවසන ඉදිරිපත් කෙරෙන ඓතිහාසික මාතලේ ප්‍රකාශයයි.

එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ දර්ශනය මත පදනම් වෙමින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණිය, මහින්ද රාජපක්ෂ මැතිතුමා ආදී නායක නායිකාවන්ගෙන් පෝෂණය වෙමින් සෙසු පුරෝගාමී පාක්ෂිකයන්ගේ ලෙයින් කඳුළින්, දහඩියෙන්, ගොඩනැගුණු අපේ පක්ෂය වර්ෂ 1951 න් පසුව ශ්‍රී ලංකාවේ දේශපාලන තන්ත්‍රයට කර ඇති දැවැන්ත දායකත්වය ගැඹුරින් සමාලෝචනය කරමින් අපේ ශක්තීන් දුර්වලතා අවස්ථා හා තර්ජන හඳුනා ගනිමින් නිවැරදි දුර දක්නා දේශප්‍රේමී ක්‍රමෝපායික දිශානතියක් ඔස්සේ පක්ෂය ශීඝ්‍ර හා කාර්යක්ෂම සංවර්ධනයකට ලක්කළ යුතු බව තීරණය කළෙමු. වත්මන් රජයේ ප්‍රධාන පාර්ශ්වකරුවකු වශයෙන් අපි සෞභාගයේ දැක්ම ප්‍රතිපත්ති මාලාව සඳහා සහයෝගය ලබාදෙන අතරතුර සමස්ත ශ්‍රී ලාංකික ජාතිය 21 වන ශත වර්ෂයේ නවමු ආර්ථික දේශපාලනික හා සමාජීය අභියෝග ජය ගැනීම සඳහා පහත තේමා ඔස්සේ මෙහෙය වන්නෙමු.

1පක්ෂයේ ඓතිහාසික භූමිකාව සපථ කරමින් ශ්‍රී ලාංකික ජාතියේත් අප මාතෘ භූමියේත් අනාගතය සුරක්ෂිත හා සෞභාග්‍ය සම්පන්න කරනු පිණිස පක්ෂයේ මතවාදී පදනම ශක්තිමත් කරමින්ද,

2 පක්ෂයේ සම්පත් පැතිකඩ ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව සංවර්ධනය කරමින්ද

3. දියුණු හරයාත්මක හා සදාචාරවත් දේශපාලන සංස්කෘතියක් ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරමින්ද,

4. සියලු ජාතීන් හා වෙනත් සංස්කෘතික අනන්‍යතාවන් වෙනුවෙන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරමින්ද,

5. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය බලය අනාගතයේ දී ලබාගැනීමට දැඩි කැපවීමෙන් නොපසුබස්නා උත්සාහයෙන් අධිෂ්ඨානශීලීත්වයෙන් කටයුතු කරන්නෙමු.

# සහරාන්ගේ මත අන්තර්ජාලයෙන් ප්‍රචාරය කළාට දේශන තිබ්බාට 4ක් දැලේ

(ඉන්දිකා රාමනායක සහ ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය)

**පාස්කු ඉරිදා ප්‍රහාර මාලාව එල්ල වී එම උණුසුම යාමට පෙර අන්තවාදීන්ගේ ඡායාරූපයක් අන්තර්ජාලයට මුසු කිරීම අන්තර් ජාලය ඔස්සේ අන්තවාදී මත ප්‍රචාරය කිරීම සහ පාසල් සිසුන්ට අන්තවාදී දේශන පැවැත්වීමට පහසුකම් සැපයීම සම්බන්ධයෙන් සැකකරුවන් සිව්දෙනකු ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාසය විසින් පෙරේද (31) අත්අඩංගුවට ගනු ලැබූ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක අජිත් රෝහණ මහතා පැවසීය.**

සැකකරුවන් දෙදෙනකු කොළඹ අත්අඩංගුවට ගෙන ඇති අතර සෙසු දෙදෙනා මුතූර් හි දී අත්අඩංගුවට ගෙන ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය. කොළඹදී ගත් දෙදෙනා වයස අවුරුදු (31) සහ (32) යන වයස්වල පසුවන්නන් වන අතර ඔවුන් වැල්ලම්පිටිය හා තිහාරිය යන ප්‍රදේශවල පදිංචිකරුවන් බව හෙතෙම සඳහන් කළේය.

අත්අඩංගුවට ගත් වැල්ලම්පිටියේ පදිංචිකරු පාස්කු ඉරිදා ප්‍රහාර මාලාව සිදු වූ අවස්ථාවේ කටාර් රාජ්‍යයේ සිට ඇති බවත් සැකකරු ඇතුළු පිරිසගේ එම ඡායාරූපය එහි සිට අන්තර්ජාලයට මුදා හැර ඇති බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කළේය. කොළඹ දී අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනාම කටාර් රාජ්‍යයේ රියැදුරන් වශයෙන් සේවය කරමින් සිටියදී එහි සිට අන්තවාදී මත ප්‍රචාර කිරීම සම්බන්ධයෙන් ඉකුත් නොවැම්බර් මස දී එරටින් පිටුවහල් කළ දෙදෙනකු බවද හෙතෙම කීය. පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් හෙළිකරගෙන තිබූ තොරතුරු අනුව ජාත්‍යන්තර පොලිසිය හරහා කර තිබුණු දැනුම් දීමකට අනුව කටාර් බලධාරීන් විසින් ඔවුන් දෙදෙනා එරටින් පිටුවහල් කරන ලදී. පිටුවහල් කිරීමෙන් පසු ද මෙරට දී ද ඔවුන් ඉහත මිතුරු සමූහය හරහා නොයෙක් අන්තවාදී මත ප්‍රචාරය කර ඇති බවත්, ත්‍රස්තවාදී විමර්ශන කාර්යාංශය විසින් මාස කිහිපයක් තිස්සේ සිදුකළ පරීක්ෂණයකින් අනතුරුව මොවුන් පෙරේද (31) පස්වරුවේ අත්අඩංගුවට ගෙන තිබිණි.

මේ අතර පෙරේද මුතූර් ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගත් සෙසු සැකකරුවන් දෙදෙනා සහරාන්ගේ මූලධර්ම පන්ති පැවැත්වීම සඳහා සහසුකම් සැපයීම් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන තිබිණි. 2018 වසරේ දී අපොස සාමාන්‍ය පෙළ විභාගය පෙනී සිටි සිසුන්ට සහරාන් නැමැත්තා අන්තවාදී දේශන පවත්වා ඇති අතර මෙම දෙදෙනා එම දේශන සඳහා සහභාගි වෙමින් ඒ වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සපයා දී ඇති බවද පොලිසිය පවසයි. අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනා ත්‍රස්තවාදය වැළැක්වීමේ ආඥා පනත අනුව ත්‍රස්ත විමර්ශන කොට්ඨාස බාරයේ රඳවාගෙන ප්‍රශ්න කරමින් පසුවේ.

# ප්‍රා.ලේකම් පරිපාලන සේවා පුටු 450ක් හිස්

යොහාන් භාසුර)

**ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු රාජ්‍ය පරිපාලන සේවයේ තනතුරු 450 කට අධික සංඛ්‍යාවක් පුරප්පාඩු වී ඇතැයි ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ උසස් නිලධාරියෙක් 'ලංකාදීප' යට පැවසීය.**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332 කින් සැළකිය යුතු සංඛ්‍යාවක වැඩබලන ප්‍රාදේශීය ලේකම්වරුන් කටයුතු කරන බවත් මෙම පුරප්පාඩු හැකි ඉක්මනින්ම පුරවන ලෙස ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා උපදෙස් දුන් බවත් එම නිලධාරියා පැවසීය. මෙම තත්ත්වය හේතුවෙන් ජනතාවට සමීප ආයතන වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු රාජ්‍ය ආයතන රැසකින් නියමිත සේවය නොලැබෙන බවට ජනතාවගෙන් පැමිණිලි ලැබී ඇති බව ද එම නිලධාරියා සඳහන් කළේය.ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු රාජ්‍ය පරිපාලන සේවයේ තනතුරු 450 කට අධික සංඛ්‍යාවක් පුරප්පාඩු වී ඇතැයි ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ උසස් නිලධාරියෙක් 'ලංකාදීප' යට පැවසීය.

# මැතිවරණ ක්‍රමවල අඩුපාඩු හඳුනාගන්න තේරීම් කාරක සභාවක්

## ඇමැති දිනේෂ්ගෙන් සඳුදා මැතිසබයට

(සුජිත් හේවාජුලිගේ)

**මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ අඩුපාඩුකම් හඳුනාගැනීම සඳහා පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාවක් පත් කිරීම සඳහා වූ යෝජනාවක් සභානායක, අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා විසින් පාර්ලිමේන්තුවට ලබන 5 වැනිද සඳුදා ඉදිරිපත් කෙරෙන බව එහි මහ ලේකම් ධම්මික දිසානායක මහතා පැවසීය.**

පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාවක් පත් කිරීම සඳහා වූ මෙම යෝජනාව කරනු ලැබ ඇත්තේ අගමැති මහින්ද රාජපක්ෂ මහතා විසිනි.

යෝජනාව එදින පස්වරුවේ සභාව කල් තැබෙන අවස්ථාවේදී මැතිසබයට ඉදිරිපත් කෙරෙන බව එහි නිලධාරීහු පවසති. පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාව සාමාජිකයන් 15 දෙනකුගෙන් සමන්විත වන අතර කථානායකවරයා තේරීම් කාරක සභාව පත් කිරීමෙන් පසු මාස 06 ඇතුළත එම කාරක සභාව නිර්දේශ ඉදිරිපත් කළ යුතු යැයි යෝජනාවේ සඳහන් වන බව මහ ලේකම්වරයා සඳහන් කළේය. මැතිවරණ හා ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල පවතින අඩුපාඩු හඳුනාගැනීම සහ ඒ සම්බන්ධයෙන් සංශෝධන නිර්දේශ කිරීම කාරක සභාවට පැවැරෙන ප්‍රධාන වගකීම වෙයි.

# ශ්‍රී ලංකා ක්‍රිකට් ඇතුළු රාජ්‍ය ආයතන දෙකක ප්‍රධානීහු කෝප් කමිටුවට

(සුජිත් හේවාජුලිගේ)

**ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ඇතුළු රාජ්‍ය ආයතන දෙකක ප්‍රධානීන් පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව (කෝප්) හමුවට ලබන සතියේදී කැඳවන බව එහි සභාපති මහාචාර්ය චරිත හේරත් මහතා පැවැසීය.**

මෙලෙස කැඳවෙන අනෙක් රාජ්‍ය ආයතනය වන්නේ ජාතික පශු සම්පත් මණ්ඩලයයි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධානීන් ලබන 6 වැනිද අඟහරුවාද දිනයේදීත් ජාතික පශු සම්පත් මණ්ඩලයේ ප්‍රධානීන් ලබන 7 වැනිද බදාද දිනයේදීත් කෝප් කමිටුව හමුවට මෙසේ කැඳවෙනු ඇත. මේ ආයතන දෙකේ දූෂණ වංචා හා අක්‍රමිකතා පිළිබඳව මෙම රැස්වීම්වලදී දීර්ඝව සාකච්ඡා කිරීමට නියමිතව ඇතැයි කෝප් කමිටු නිලධාරීහු පවසති.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධානීන් කෝප් කමිටුව හමුවට මෙයට පෙරද කැඳවා තිබුණත් ඔවුන් ඊට සූදානම් වී නොපැමිණීම නිසා එදින රැස්වීම නවත්වා සූදානම් වී වෙනත් දිනයක පැමිණෙන්නැයි එහි ප්‍රධානීන් ඔවුනට දැනුම් දී හරවා යවා තිබිණ. කෝප් කමිටුව ලබන සතියේ දින දෙකක් පමණක් රැස්වීමටද එහි ප්‍රධානීන් තීරණය කර ඇත.

25TH
සුමති සම්මාන
SUMATHI AWARDS 2020
මහිමාලංකාරය

# හොඳම ප්‍රාසංගික ටෙලි නාට්‍ය නාලිකාව


## ඇතුළු සම්මාන 17 ක් සමඟ

රූපවාහිනී
ரூபவாஹினி
RŪPAVĀHINĪ

හොඳම ප්‍රාසංගික ටෙලි නාට්‍යය - වීරයා ගෙදර ඇවිත් - ආනන්ද අබේනායක
හොඳම ටෙලි නාට්‍ය අධ්‍යක්ෂණය - වීරයා ගෙදර ඇවිත් - ආනන්ද අබේනායක
හොඳම ටෙලි නාට්‍ය නළුවා - වීරයා ගෙදර ඇවිත් - රොෂාන් රවීන්ද්‍ර
හොඳම සහය නිළිය - වීරයා ගෙදර ඇවිත් - චාන්දනී සෙනෙවිරත්න
හොඳම ටෙලි නාට්‍ය තිර රචනය - වීරයා ගෙදර ඇවිත් - නාමල් ජයසිංහ
හොඳම නැගී එන ටෙලි නාට්‍ය නිළිය - මිෂෙල් දිල්හාරා - සුදු ඇඳගෙන කළු ඇවිදින්
හොඳම නැගී එන ටෙලි නාට්‍ය නළුවා - අමුතු රසිකයා - සංජය මුරමුදලි
හොඳම ළමා තාරකාව - වීරයා ගෙදර ඇවිත් - අකිඳු වෙනුජ බණ්ඩාර
හොඳම ඒකාංගික ටෙලි නාට්‍යය - පවිත්‍රාතිගේ ප්‍රේමය - අතුල පීරිස්
හොඳම පූරක - සුහානි රාත් - වත්සලා සමරකෝන්
හොඳම රූපවාහිනී වාර්තා වැඩසටහන - අසිරිමත් හෝර්ටන් තැන්න - පූජිත දිසානායක
හොඳම ක්‍රීඩා වැඩ සටහන - බියෝන්ඩ් ද බවුන්රි - යෙනුක දසනායක
හොඳම රූපවාහිනී අධ්‍යාපන වැඩ සටහන - නොලේජ් ෆස්ට්/සේෆ්ටි ෆස්ට් - ජානක සුජීව ජයකොඩි
හොඳම රූපවාහිනී ළමා වැඩ සටහන - කුරුල්ලන්ට ගී - මාලතී වීරසිංහ
ජූරියේ විශේෂ කුසලතා සම්මානය - වීරයා ගෙදර ඇවිත් - කනිෂ්ක ෂේවියර්
තිර රචනය සඳහා කුසලතා සම්මානය - අමුතු රසිකයා - සද්ධා මංගල සූරියබණ්ඩාර



## ජාතික රූපවාහිනිය
## ප්‍රමිතියේ මුද්‍රාව
## යළි සලකුණු කළ වගයි !




කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 අප්‍රේල් මස 02 වැනිදා සිකුරාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී

## කාර්දියෝ පෙරළි

# පක්ෂ 4කට තහංචි

**පළාත් සභා මැතිවරණය පැවැත්වීම කෙරෙහි නැවතත් රටේ කතාබහක් ඇතිවී තිබේ. ආණ්ඩුවේ වැඩි පිරිසකගේ අදහස් වූයේ පළාත් සභා ක්‍රමය රටට අනවශ්‍ය එකක් හෙයින් එය අහෝසි කිරීමටය. එහෙත් ආණ්ඩුවේ කොටසක් පළාත්සභා අවශ්‍ය බවට විවිධ තර්ක විතර්ක ඉදිරිපත් කළහ. ඒ අනුව ජනාධිපතිවරයා සහ කැබිනට් මණ්ඩලය පළාත්සභා ඡන්දය පැවැත්වීමට තීන්දු කළහ. එම තීන්දුවෙන් පසුව නැවතත් අවුල් වියවුල් තත්ත්වයක් නිර්මාණය වී ඇත්තේ ආණ්ඩුව අදහස්කරන මැතිවරණ ක්‍රමයට ඇතැම් පක්ෂ එකඟ නොවීම හේතුකොට ගෙනය.**




යහපාලන ආණ්ඩුව පාර්ලිමේන්තුවේ සම්මත කළ පළාත් සභා ඡන්ද ක්‍රමයට අනුව පනහට පනහ ආකාරයෙන් නියෝජිතයන් තෝරා ගැනීමට තීන්දුකර තිබිණ. කොට්ඨාස ක්‍රමයෙන් සියයට 50ක් ද සමානුපාතික ක්‍රමයෙන් සියයට 50 ක්ද ආදී වශයෙන් පළාත්සභාවලට නියෝජිතයන් පත්කර ගැනීම යහපාලන ආණ්ඩුවේ අදහස වී තිබුණේය. එහෙත් වර්තමාන ආණ්ඩුව ඊට විරෝධය පළකරයි. කොට්ඨාස ක්‍රමයෙන් සියයට 70ක් ද සමානුපාතික ක්‍රමයට සියයට 30ක් ද ආදී වශයෙන් නියෝජිතයන් පත්කර ගැනීමටත් ඒ සඳහා නව පනත් කෙටුම්පතක් සම්මතකර ගැනීමටත් ආණ්ඩුව අදහස්කර ගෙන තිබේ. සුළු දේශපාලන පක්ෂ ආණ්ඩුවේ අදහසට යම් යම් විරෝධතා දක්වන බවක් ද පෙනේ.

මෙතෙක් තිබුණේ ජයග්‍රහණය කරන පක්ෂයට බෝනස් මන්ත්‍රීධුර දෙකක් ලබාදීමයි. එහෙත් ආණ්ඩුවේ අලුත් යෝජනාව ජයග්‍රහණය කරන පක්ෂයට බෝනස් ආසන දිස්ත්‍රික් ක්‍රමයට ලබාදීමටය. එක් දිස්ත්‍රික්කයකට බෝනස් ආසන දෙක බැගින් ලබාදීම ආණ්ඩුවේ යෝජනාවය. බස්නාහිර පළාත් සභාව ජයග්‍රහණය කරන දේශපාලන පක්ෂයට හෝ කණ්ඩායමට බෝනස් ආසන හයක් හිමිවේ. කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්ක තුනට මන්ත්‍රීධුර දෙක බැගින් එම මන්ත්‍රීධුර හය හිමි වේ. මීට අමතරව ආණ්ඩුව යෝජනා කරන්නේ එක් කොට්ඨාසයකට එක් දේශපාලන පක්ෂයකින් අපේක්ෂකයන් තිදෙනෙකු ඉදිරිපත් කිරීමටය. අපේක්ෂත්වය ඉල්ලා බොහෝ පිරිස් පොරකන ප්‍රශ්නයටත් ඒක විසඳුමක්. එක් දේශපාලන පක්ෂයකින් හෝ කණ්ඩායමකින් හෝ අපේක්ෂකයන් තිදෙනෙකු බැගින් තරග කළ පසුව වැඩිම මනාප ගණන අපේක්ෂකයාට ආසනය හිමිවෙන ක්‍රමයක් තමයි ඒක' යැයි ආණ්ඩුවේ ප්‍රබල ඇමැතිවරයෙක් පැහැදිලි කරන්නේය. කෙසේ වෙතත් නව ක්‍රමය ඇතැම් පිරිස් අපේක්ෂා කළ නිර්ණායක කණපිට හැරවීමක් ලෙස හුවා දක්වති.

'පොලිතින් ඉටිකොළ භාවිතය නැතිකිරීම, අනවශ්‍ය තරගය ඉවත් කිරීම, එකම දේශපාලන පක්ෂයේ අපේක්ෂකයන් ගහමරා ගැනීම නතර කිරීමට තමයි නව මැතිවරණ ක්‍රමය සකස්විය යුත්තේ. එහෙත් නව ක්‍රමයෙන් තරගය, අල්ලස. තෑගිබෝග ලබාදීම තවත් වැඩිවෙනවා' යැයි ද ඊට විරෝධය දක්වන පිරිස පැහැදිලි කරති.

**පළාත්** සභා මැතිවරණය ගැන කතාබහ එලෙස පැතිර යද්දී මැතිවරණ කොමිෂන් සභාව ද වැඩ ආරම්භ කර තිබේ.

'ඉදිරියේදී පැවැත්වීමට නියමිත ඡන්ද විමසීම ඉලක්ක කොටගෙන අපි පොලිස් නිලධාරීන් පුහුණු කරන්න වැඩසටහනක් ආරම්භ කරනවා. පොලිස් නිලධාරීන්ට අමතරව රාජ්‍ය නිලධාරීන්, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නියෝජිතයන් ද පුහුණු කිරීමට අපේක්ෂා කරනවා. සියලු වැඩසටහන් මේ මාසෙ අවසන් සතියේ සිට ආරම්භ කරනවා. ඒ සඳහා දැනටමත් වැඩපිළිවෙළ සකස්කර අවසන්. මැතිවරණ රාජකාරියේ නිරතවන පොලිස් නිලධාරීන්ට විශේෂ පුහුණුවක් අවශ්‍යයි. මැතිවරණ කොමිසම පොලිස් නිල ධාරීන් පුහුණුකර නැහැ. ඒක අවශ්‍යයි. මැතිවරණ නීතිය ගැන ඡන්ද අපේක්ෂකයන්ගේ ක්‍රියාකලාපය ආදිය ගැන හොඳ දනුමක් පොලිස් නිලධාරීන්ට අවශ්‍යයි. ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාව වැඩසටහනක් සකස්කර තිබෙනවා' යැයි මැතිවරණ කොමිෂන් සභාව සඳහන් කරයි.

පිළිගත් දේශපාලන පක්ෂ මැතිවරණ කොමිෂන් සභාවට ගිණුම් වාර්තා ලබාදීම අනිවාර්ය කර තිබේ. එහෙත් පිළිගත් දේශපාලන පක්ෂ 4ක් එම වගකීම පැහැර හැර ඇතැයි වාර්තාවේ. මැතිවරණ කොමිසම එම දේශපාලන පක්ෂවලට අවවාද කර ඇත්තේ මේ මස 22 වැනි දිනට පෙර ගිණුම් වාර්තා ලබාදිය යුතු බවටය. එලෙස ගිණුම් වාර්තා ලබා නොදෙන පක්ෂවල ලියාපදිංචිය තහනම් කරන බව ද මැතිවරණ කොමිසම ප්‍රකාශ කර තිබේ.

මීට අමතරව පිළිගත් දේශපාලන පක්ෂවල ව්‍යවස්ථා, නිල නාම පිළිබඳව කරුණු විමර්ශනය කිරීමට මැතිවරණ කොමිසම කමිටුවක් පත්කර තිබේ. එම පක්ෂවල නිලනාම, ව්‍යවස්ථාවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි කරුණු ඇතුළත් වී තිබේ ද ඒවායේ ආගමික හෝ වාර්ගික වශයෙන් කරුණු සඳහන්ව තිබේද යන්න සොයාබලා වාර්තා කිරීම එම කමිටුවට පවරා තිබේ.

කමිටුව පස්දෙනෙකුගෙන් සමන්විත අතර ඔවුන්ගේ කාර්යයන් අධීක්ෂණය කිරීමට කොමිෂන් සභාවේ සාමාජිකයකු සහ මැතිවරණ කොමසාරිස් ජනරාල් සහ කොමිසමේ ලේකම්වරයා ද පත්කර තිබේ.

**වන** විනාශයක් වන බවට සමාජ මාධ්‍ය ඔස්සේ සිදුකරන ප්‍රචාර සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ ද අවධානය යොමුකර තිබේ. එක්සත් ජාතික පක්ෂයේ සභාපති වජිර අබේවර්ධන ඉකුත් ඉරිදා පස්වරුවේ සිංහරාජ වනාන්තරයට ගියේය. වජිර අබේවර්ධන මොරවක, දෙනියාය ආදී ප්‍රදේශවල ද සංචාරය කළේය. එහිදී පැතිර යන කතා පිළිබඳව සභාපතිවරයා රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රදේශවාසීන් සමඟ සාකච්ඡා කළේය.

## අනාගත ශ්‍රීලනිප ආණ්ඩුවකට මෛත්‍රීගේ වෑයම


## ජිනීවා ගැන මංගල කියන කතා

## වජිර සිංහරාජය බලන්න යයි

## දේශප්‍රේමී එජාපෙන් සජිත්ට චෝදනා

## පක්ෂ ගැන හොයන්න මැකොගෙන් කමිටුවක්

**එජාප** නායක රනිල් වික්‍රමසිංහ සහ සමගි ජනබලවේගයේ මහජන නියෝජිතයන් පිරිසක් ඉකුත් සඳුදා මුණගැසී සාකච්ඡාවක නිරත වූහ. එහිදී පක්ෂ දෙකේ ඉදිරි වැඩසටහන් හා දෙපිරිසම එක්ව කටයුතු කිරීම පිළිබඳව ද යම් අදහස් හුවමාරුවක් සිදුවී තිබිණ. මේ අතර පක්ෂයේ ඉදිරි වැඩසටහන් කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීමට එජාප නායකයෝ ඉකුත් අඟහරුවාදා සිරිකොත පක්ෂ මූලස්ථානයට රැස්වූහ. එම සාකච්ඡාවට රුවන්, වජිර, අකිල, දයා පැල්පොල ආදී පිරිසක් එක්ව සිටියහ.



කොරෝනා වයිරස ව්‍යාප්තිය හේතුවෙන් මැයි දිනය සැමරීමට තිබෙන බාධා පිළිබඳව ද මැයි දිනය කුමනාකාරයෙන් සැමැරිය යුතු ද යන්න පිළිබඳව ද එජාප නායකයෝ අදහස් හුවමාරු කරගත්හ. මැයි දිනය චාම් අයුරින් පැවැත්වීමට ද මැයි දිනය යොවුන් මැයි දිනයක් ලෙස සැමරීමට ද එහිදී යෝජනා විය.



ආණ්ඩුවට විපක්ෂය එල්ලකරන චෝදනාවලට දේශප්‍රේමී එක්සත් ජාතික පක්ෂය පිළිතුරු දීමට පටන්ගෙන තිබේ. දේශප්‍රේමී එක්සත් ජාතික පක්ෂය යනු එක්සත් ජාතික පක්ෂයෙන් වෙන්ව ගිය පිරිසකි. ඔවුන් තවත් දේශපාලන පක්ෂයක් ලෙස ක්‍රියාත්මක වන අතර එහි නායක සුගත් හේවාපතිරණ සඳහන් කරන්නේ සජිත් ප්‍රේමදාසට තම පක්ෂය අභියෝග කරන බවය. විපක්ෂනායකවරයා ලෙස අදහස් ප්‍රකාශ කිරීමටත් ජනතාව දැනුවත් කිරීමටත් ඔහුට අයිතියක් තිබෙන බව දේශප්‍රේමී එක්සත් ජාතික පක්ෂයේ නායකයා සඳහන් කරන්නේය.


'විපක්ෂය ආණ්ඩු බලය ලබා ගැනීම සඳහා ප්‍රාර්ථනයක් තිබෙන්නට පුළුවන්. එය සිදුකළ යුත්තේ ශිෂ්ට සම්පන්න සහ සදාචාරාත්මක ක්‍රමවේදයකටයි. ආණ්ඩුවට තවම මාස හතයි. ජනාධිපතිවරයාට මේ රටේ ජනතාව වසර පහක කාලයක් ලබා දී තිබෙනවා. කොවිඩ් වසංගතය ජයගන්න ආණ්ඩුව ලොකු උත්සාහයක් ගන්නවා. රජයේ උත්සාහයට අකුල් හෙළීම බොළඳ දේශපාලනඥයන්ගේ වැඩක්. රාජ්‍යතාන්ත්‍රික හැසිරීමකින් යුත් විපක්ෂනායකයකුට ඒ ක්‍රමය ගැළපෙන්නේ නැහැ' යැයි ද සුගත් හේවාපතිරණ කියන්නේය.

ශ්‍රී ලංකාව සහ චීනය අතර පවතින දීර්ඝකාලීන මිත්‍රත්වය තහවුරු කරමින් චීනය ශ්‍රී ලංකාවට එරට නිෂ්පාදිත එන්නත් මාත්‍රා ලක්ෂ 6ක් ඉකුත් බදාදා ලබා දුන්නේය. එන්නත් තොගය භාර ගැනීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ කටුනායක ගුවන්තොටුපළට ගොස් සිටියේය. ශ්‍රී ලංකාවේ චීන තානාපතිවරයා නිල වශයෙන් ජනාධිපතිවරයාට එන්නත් තොගය බාරදුන්නේය. 'දෙරට අතර තිබෙන ගැඹුරු සහෝදරත්වය විදහා දැක්වීමට මෙම පරිත්‍යාගය ඉවහල් වෙනවා'. ජනාධිපති ෂී ජින් පිං හා ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා අතර ඉකුත් සඳුදා ඉතා වැදගත් දුරකතන සංවාදයක් සිදුවුණා. 'චීනය සහ ශ්‍රී ලංකාව එකිනෙකාට සලකන සහ සහය වන සුහද අසල්වැසියන්, හොඳ මිතුරන්, අන්‍යෝන්‍ය ගරුත්වය රකින හවුල්කරුවන්' යැයි චීන තානාපතිවරයා එහිදී කීවේය. මේ අතර චීන ජනාධිපතිවරයා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට ප්‍රකාශකර ඇත්තේ චීනයේ සංචාරයක් සඳහා පැමිණෙන ලෙසය. ජනාධිපතිවරයා එම ආරාධනාව පිළිගෙන තිබුණේය.

ජිනීවා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ශ්‍රී ලංකාවට එල්ලවන චෝදනා හා ශ්‍රී ලංකාව ඊට ප්‍රතිචාර දක්වන ආකාරය සම්බන්ධයෙන් දේශපාලන කරළියේ දැඩි කතාබහක් ඇතිවී තිබේ. ආණ්ඩු පක්ෂයත් විපක්ෂයත් ජිනීවා ගැටලුව එකිනෙකාට වාසිවන අයුරින් කළමනාකරණය කිරීමටත් විග්‍රහ කිරීමටත් පටන්ගෙන තිබේ.



ජිනීවා ප්‍රශ්නය විග්‍රහ කරන ආණ්ඩුවේ දේශපාලනඥයෝ හිටපු විදේශ ඇමැති මංගල සමරවීරට දෙස් තබන්නට පටන් ගෙන සිටිති. ශ්‍රී ලංකාවට එරෙහි යෝජනාවට සම අනුග්‍රාහකත්වය ලබාදීම මංගල සමරවීරගේ ගැටයක් බවත් ඉන් රට පාවාදුන් බවත් ආණ්ඩුවේ දේශපාලනඥයෝ කියති. ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරමින් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සඳහන් කර තිබුණේ තමන් එම යෝජනාව සම්බන්ධයෙන් දැනුවත්ව නොසිටි බවය.



එහෙත් හිටපු ජනාධිපතිවරයාගේ එම ප්‍රකාශයට මංගල සමරවීර ඉකුත් බදාදා පිළිතුරක් ලබාදුන්නේය. 'ජිනීවා 30.1 යෝජනාව පිළිබඳව හිටපු ජනාධිපතිවරයා සම්පූර්ණයෙන්ම දැනුවත්ව සිටියා. 2015 වසරේ සැප්තැම්බර් මාසයේදී මම ජිනීවාවල හිටියා. ජනාධිපති සිරිසේනත් හිටියා. කොළඹ අරලියගහ මන්දිරයෙන් සකස්කළ යෝජනාවේ හැම වගන්තියක් පිළිබඳවම මම ජනාධිපති සිරිසේන දැනුවත් කළා' යැයි මංගල සමරවීර කීවේය.

**මේ** අතර හිටපු ජනාධිපතිවරයා ඉකුත්දා ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නමැති යෝධයා යළි නැගිට්ටවීමට තමන් කටයුතු කරන බවය. පක්ෂය යළි ගොඩනැගීම සඳහා ශ්‍රීලනිපය අලුත් වැඩසටහනක් ආරම්භ කර තිබේ. හිටපු ජනාධිපතිවරයා සහ ශ්‍රීලනිප නායකයෝ ඉකුත්දා මහනුවරට ගොස් මල්වතු හා අස්ගිරි මහානාහිමිවරුන් බැහැදැක ආශිර්වාද ලබාගත්හ. එහිදී හිටපු ජනාධිපතිවරයා සඳහන් කළේ ආණ්ඩුවේ සිටින අතරේම ශ්‍රීලනිප ආණ්ඩුවක් පිහිටුවීම සඳහා කටයුතු කරන බවය.

**කස්තූරි**
rankasthuri@gmail.com

## ඔරලෝසු දැන් වැඩක් නෑ

**"අද උදේන්ම ගමනක් යනවා වගේ දැක්කා. දැන්ද ගෙදර ආවේ?" අමරසේන වීරතුංගගෙන් ඇසුවේය.**

"ඔව් මම ටවුමට ගියා. පත්තරේ දැන්වීමක් දුන්න. අපේ ගෙදර තියෙන මේ ලොකු බිත්ති ඔර්ලෝසුයි. අර ග්‍රෑන්ඩ්පාද ඔරලෝසුවයි විකුණලා දන්න. ඉස්සර තමා ගෙවල්වලට වෙලාව බලාගන්න ඔර්ලෝසු ඕනෑ වුණේ" වීරතුංග උත්තර දුන්නේය.

"ඇයි දැන් වෙලාව දැනගන්න වුවමනා නැද්ද?"

"වේලාව දැනගන්න ඕනෑ තමයි. ඒත් ඒ වැඩේට ඔර්ලෝසු තියා ගන්න ඕනේ නැහැ"

"ඒ කොහොමද?" අමරසේන විමසුවේය.




"ඇයි දැන් මේ රේඩියෝවල රූපවාහිනිවල හැම තිස්සේම පැය කාලෙන් කාලෙට ඔර්ලෝසු වෙලාව දක්වනවා නේ. හැම වෙලාවෙම වෙලාව කියන කොට ආයේ වෙනම ඔරලෝසු මොකටද?"

"ඇත්තටම ඔය රේඩියෝවල රූපවාහිනි චැනල්වල හැම තිස්සේම පැය කාලෙන් කාලට වේලාව දක්වන්නේ ඇයි කියලා මටත් ප්‍රශ්නයක්. බණ දේශනාවක් තිබුණත් වෙනත් වැඩසටහනක් තිබුණත් ප්‍රවෘත්ති මාධ්‍යයේත් ගායනයක් යන කොටත් නතර කරල මෙන්න වෙලාව කියනවා. ඇයි ඒ?" අමරසේන විමසුවේය.

"මට හිතෙන්නේ මෙහෙමයි. ඔය රෑට දේපළ මුරකරන මිනිස්සු මුරකාරයෝ පැයෙන් පැයට මනිය ගහනවා නේ. ඔය රූපවාහිනි ගුවන්විදුලි වැඩසටහන් කරන අයත් කල්පනාවෙන් සිටිනවා ද කියලා බලන්න වෙන්නැති පැය කාලෙන් කාලට වේලාව දක්වන්නේ. ඉස්සර තිබුණනේ ජනතාවට වේලාව දක්වන්නෝ කියලා දැන්වීමකුත්" වීරතුංග කීවේය.

"මිනිත්තු පහළොවෙන් පහළොවට වේලාව දක්වන එකත් මහ හිරිහැරයක් වගේ තමා මටනම් දැනෙන්නේ. ඒක නිසා තමා මම හිතුවේ අපට මේ ඔර්ලෝසු ගෙදරට අවශ්‍ය නැහැ කියලා. අනෙක් මිනිස්සුත් ගෙදර තියෙන ඔර්ලෝසු විකුණලා දන්න ඉස්සෙල්ලා මේවා විකුණලා දන්න මම හිතුවේ." වීරතුංග යළිත් කීවේය.

"දැන් හැමකෙනා ළඟම ජංගම දුරකථනත් තියෙන නිසා ඕනෑ නම් ඒකෙන් වෙලාව බලා ගන්නත් පුළුවන් නිසා ගෙදරට ඔර්ලෝසු දැන් අවශ්‍ය නැහැ තමා. මාත් අපේ ගෙදර බිත්ති ඔර්ලෝසු ආදිය විකුණලා දන්න ඕනෑ" අමරසේනත් කියා සිටියේය.

**ලලිත් හීන්ගම**

## අද දවස ඔබට

### රාහු කාලය 10.39-12.09

**• මේෂ — සිත් තැවුල්**

චිත්ත පීඩා ආදියට හේතු බලපාන දිනයකි. ඇසුරු කරන අය හා සබඳතා පළුදුවීමට හේතු යෙදේ. නීති ප්‍රශ්න ආදිය බලපාන දිනයකි. බලාපොරොත්තු ඉටුකර ගැනීමට නොහැකි වේ.

**• වෘෂභ — රැකියා වෙනසක්**

හිතට එකඟව කටයුතු නොකිරීම නිසා විවිධ ගැටලු මතුවේ. විදේශ රැකියා බලාපොරොත්තු ප්‍රමාද වේ. රැකියා කටයුතුවල සුබදයක වෙනසක් සිදුවේ. සන්ධ්‍යා කාලයේ පුණ්‍ය කටයුතු ආදිය යෙදේ.

**• මිථුන — ප්‍රභූ උපකාර**

පාලක පක්ෂයේ ප්‍රසාදයට හේතු යෙදේ. උසස් අයෙකුගෙන් බලාපොරොත්තු උපකාරයක් හිමිවේ. සුළු අසනීප තත්ත්වයක් බලපායි. සන්ධ්‍යා කාලය විවේකයෙන් ගෙවේ.

**• කටක — විවිධ ලාබ**

විවිධ කටයුතුවලට යොමුවීම තුළින් වැඩි ලාබ ප්‍රයෝජන සැලසේ. නිවසේ වැඩ කටයුතුවල කාර්යබහුල වේ. යොදගත් කටයුතුවල වෙනසක් සිදුවේ. ගෙවතු ආශ්‍රිත කටයුතුවලින් වැඩි ලාබ ප්‍රයෝජන හිමිවේ.

**• සිංහ — අතට මුදලක්**

ආරක්ෂක කටයුතුවල නිරතවූවන්ට කාර්යබහුල වේ. විවිධ පුද්ගලයන් ඇසුරට ලැබේ. තාවකාලික රැකියා ස්ථිර වෙයි. බලාපොරොත්තු මුදලක් අතට ලැබේ.

**• කන්‍යා — දේපළ ලාබ**

බලාපොරොත්තු දේපළ ලාබයක් හිමිවේ. දැනට පදිංචි ස්ථානයේ වෙනසකට හේතු යෙදේ. තම හිතවතකුගේ අවශ්‍යතාවක් සඳහා වියදම් ඉහළ යන දිනයකි. සෙම් පීඩා වැනි තත්ත්වයන් මතුවීමට ඉඩ ඇත.

**• තුලා — අන්සතු වස්තුවක්**

අන්සතු වස්තුවකට හිමිකම් ලැබීමට ඉඩ ඇත. දේපළ දියුණුව සඳහා වියදම් ඉහළ යයි. නිවාස අලුත්වැඩියා කටයුතුවල නිරතවූවන්ට කාර්යබහුල වේ. අවශ්‍ය පහසුකම් සැලසේ.

**• වෘශ්චික — හදිසි තීරණ**

දවසේ කටයුතුවලින් වැඩි ඵල ප්‍රයෝජන ලැබේ. හදිසි තීරණාත්මක කරන කටයුතුවලින් බලවත් පාඩු සිදුවේ. උත්සාහයේ තරමට ඵල නොලැබෙන දිනයකි.

**• ධනු — ආයෝජන ලාබ**

දවසේ කටයුතු සඳහා වැඩි වෙහෙසක් දැරීමට සිදුවේ. නිතර උදාසීන ගති බලපාන දිනයකි. ආයෝජන කටයුතුවලින් වැඩි ලාභ උපදී. මිශ්‍ර ඵල සහිත දිනයකි.

**• මකර — බාධක දුරුවෙයි**

පවුලේ වැඩිහිටියකු පිළිබඳ සතුටට හේතු යෙදේ. දුර ගමන්වල යෙදෙන්නන්ට විවිධ ගැටලු මතුවේ. නිදිවර්ජිත කටයුතුවල නිරතවූවන්ට වැඩි ලාභ ප්‍රයෝජන හිමිවේ. කලක් පැවැති බාධක දුරුවී යයි.

**• කුම්භ — විදෙස් රැකියා**

විදෙස් රැකියා බලාපොරොත්තු ඉටුවේ. උසස් අධ්‍යාපන කටයුතුවල නිරතවූවන්ට වියදම් ඉහළ යයි. විනෝදජනක කටයුතු සඳහා වියදම් ඉහළ යයි. දවස කාර්යබහුල වේ.

**• මීන — තරග ජය**

ඇසුරු කරන්නන්ට වියදම් ඉහළ යන දිනයකි. තරගකාරී දෙයින් විශේෂ ජය හිමිවේ. කලෙකින් හමු නොවූ හිතවතකු හමුවේ. උත්සාහයේ තරමට ඵල නොලැබෙන දිනයකි.

ගම්පහ අබේසේන හේරත්

# පොල්තෙල් තවත් කන්ටේනරයක් දඹුල්ලෙන් අල්ලයි

(දඹුල්ල කාංචන කුමාර ආරියදාස)

විදේශ රටකින් ගෙනෙවිත් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ පිටුපස පෞද්ගලික ගබඩාවක නතර කර තිබූ සැක සහිත පොල් තෙල් කන්ටේනරයක් ඊයේ (1) පස්වරුවේ පොලිස් භාරයට ගත් බව දඹුල්ල පොලිසිය කියයි.

මෙම පොල්තෙල් කන්ටේනරයට වරායෙන් මුදාහැරීමේ තත්ත්ව වාර්තා හෝ ප්‍රවාහන බලපත්‍ර නොතිබූ හෙයින් පොලිස් භාරයට ගත් බව දඹුල්ල පොලිසිය කීය.

දඹුල්ල නගරාධිපති ජාලිය ඕපාත මහතාට ලැබුණු තොරතුරක් මත දඹුල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂක එස්.පී. එදිරිසිංහ මහතා සහ පොලිස් කණ්ඩායමක් දඹුල්ල නගර සභාවේ නාගරික මන්ත්‍රීවරුන් පිරිසක් පස්වරු හතර හතර පමණ මෙම ස්ථානය පරීක්ෂා කළේය. ඒ අවස්ථාවේ දී කන්ටේනර් රථය සම්පූර්ණයෙන්ම ගබඩාව ඇතුළට දමා බට වලින් එම ගබඩාවේ වහලය මත තනා තිබූ ටැංකියකට මෙම පොල්තෙල් පොම්ප කරමින් සිටින අයුරු දැක ගැනීමට හැකි වූ බව නගරාධිපතිවරයා කීය.

එම කන්ටේනර් රථය පොල් තෙල් ලීටර් 28,000ක් පමණ තිබී ඇත.

පාරිභෝගික අධිකාරිය මීට පෙරද දඹුල්ල නගර මධ්‍යයේ පිහිටි පොල් තෙල් අලෙවි කරන ස්ථානයක් මුද්‍රා තබා තිබිණි. මෙම පොල් තෙල් කන්ටේනරය පෙන්වා ඇත්තේ ද මුද්‍රා තැබුණු පොල් තෙල් අලෙවි මධ්‍යස්ථානයේ හිමිකරු බව පොලිසිය පවසයි.

මෙම පුද්ගලයා සතුව ගබඩාව සඳහා නගර සභාවෙන් වෙළෙඳ බලපත්‍රයක් හෝ ලබා ගෙන නොමැති බව නගරාධිපතිවරයා කීය. එමෙන්ම දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය පිටිපස මාර්ගය පස්වරු 6 ට වසා දැමීමෙන් පසුව මෙම කන්ටේනර් රථය එම මාර්ගයේ පිටුපස කොටසෙන් ගෙනවිත් ගබඩාවක් තුළ බාමින් සිටීම සැකයට තුඩු දුන් බව ද පැවසීය.


නගරාධිපතිවරයා ඇතුළු පිරිස තෙල් කන්ටේනරය පරීක්ෂා කරමින්


ඇල්ලූ තෙල් කන්ටේනරය

පොල්තෙල්වල ලියකියවිලි සහ ඒවා මිනිස් පරිභෝජනයට සුදුසු ඒවා ද යන්න 02 දින පරීක්ෂා කර බලන බවත් එතෙක් මෙම පොල්තෙල් පිරවූ කන්ටේනර් රථය පොලිස් භාරයට ගත් බවත් හෙතෙම සඳහන් කළේය.

දඹුල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂක එස්.පී. එදිරිසිංහ මහතා කියා සිටියේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ මේ පිළිබඳව වගකිවයුතු අංශ දැනුවත් කොට 2 දින ඉදිරි විමර්ශන කටයුතු සිදු කරන තෙක් පොල්තෙල් කන්ටේනර් රථය පොලිස් භාරයට ගත් බවය.

# දේවානිත් මැති ඇමැතිනුත් අතර වචන හුවමාරුවකට තුඩුදුන් ගැටලුව ලිහන්න ජාසිංහ මැදිහත් වෙයි

(විනීතා එම්. ගමගේ)

මීගමුව කලපුවෙන් බැහැර කර ඇති රොන්මඩ සහිත පස් තොගයේ වැලි ඉවත් කර ගැනීමට පරිසර අමාත්‍යාංශයේ අවධානය යොමු වී තිබේ.

එම රොන්මඩ සහිත පස් තොගයෙන් වැලි සෝද ඉවත් කර ගත හැකි දැයි වහාම සොයා බලා එසේ වැලි ඉවත් කර ගැනීමේ හැකියාවක් ඇත්නම් ඊට වහාම මැදිහත් වන්නැයි පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශයට උපදෙස් දී ඇත.

2018 දී ධීවර අමාත්‍යාංශයේ කළපු සංවර්ධන ව්‍යාපෘතියේ මෙම රොන් මඩ තොගය ගොඩ දමා ඇති අතර ගම්පහ දිසා අඩවි වන නිලධාරී දේවානි ජයතිලක මහත්මිය මෙම පස් තොගය කඩොලාන පරිසරයෙන් ඉවත් කරන ලෙස දැනුම් දුන්න ද ධීවර අමාත්‍යාංශය ඒ සම්බන්ධව කිසිදු පියවරක් නොගැනීම පිළිබඳ පරිසර අමාත්‍යාංශයේ අවධානය යොමුවී තිබේ.

මේ සම්බන්ධව දිස්ත්‍රික් අඩවි වන නිලධාරිනී දේවානි ජයතිලක මහත්මිය ප්‍රදේශයේ මැති ඇමැතිවරුන් අතර උණුසුම් වචන හුවමාරුවක් සිදුවී ඇති බවට ඉකුත් 31 වැනිද පළවූ මාධ්‍ය වාර්තා අනුව මේ පිළිබඳ සොයා බැලීමට පියවර ගත් බව පරිසර අමාත්‍යාංශය කියයි.

පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා මේ පිළිබඳව හා තවත් කරුණු කිහිපයක් සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යාව සමීක්ෂණ හා පතල් කාර්යාංශය වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශවල ලේකම් හා රාජ්‍ය ලේකම් සමග සාකච්ඡාවක් පවත්වනු ලැබූ අතර වැලි වෙන්කර ගැනීම ගැන වහා සොයා බලන ලෙස එහි දී ලේකම්වරයා උපදෙස් දී ඇත.

නිලධාරීන් පිරිසක් වහා එහි යවා ඊට අදාළව පියවර ගෙන තමන්ට වාර්තා කරන ලෙස ද ලේකම්වරයා භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයට තවදුරටත් උපදෙස් දී තිබේ.

මෙම පියවර සාර්ථක වුවහොත් මෙම ගැටලුව එතැනින්ම අවසන් කළ හැකි බවද පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ අනිල් ජාසිංහ මහතා ලංකාදීපයට ඊයේ පැවැසීය.

## පොල්තෙල් තොගයක් අත්අඩංගුවට ගැනීම:

# උසාවි නියෝගය නොතකා ක්‍රියාකළැයි දන්කොටුව පොලිසියට දැඩි දෝෂාරෝපණ

## පරීක්ෂණයකට පොලිස්පතිට නියෝග

(හලාවත ඔගස්ටින් ප්‍රනාන්දු)

දන්කොටුව පොලිසිය මගින් අත්අඩංගුවට ගත් පිළිකා කාරක අඩංගු බවට සැක කෙරෙන පොල්තෙල් තොගය සම්බන්ධයෙන් මාරවිල අධිකරණය පොලිසියට දුන් නියෝගය අනුව ක්‍රියා නොකර වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීම සම්බන්ධයෙන් දන්කොටුව පොලිසියට දෝෂාරෝපණයක් කළ මාරවිල මහේස්ත්‍රාත් හා දිසා විනිසුරු රඛිත පී. අබේසිංහ මහතා මෙම සිද්ධිය සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කරන මෙන් පොලිස්පතිවරයා වෙත පෙරේද (31) නියෝග කළේය.

රාගම ප්‍රදේශයේ සිට බවුසර් දෙකකින් ගෙන ආ බව කියන පිළිකා කාරක අඩංගු බවට සැක කරන පොල්තෙල් තොගයක් දන්කොටුවේ ප්‍රසිද්ධ පොල් තෙල් මෝලක නවතා ඇති බවට ලද තොරතුරක් අනුව පොලිසිය එම බවුසර් දෙක පසුගිය 29 වැනිද රාත්‍රි පරීක්ෂණ පිණිස අත්අඩංගුවට ගත්තේය.

එම බවුසර් දෙකේ පොල්තෙල් ලීටර් 55,000ක් අඩංගුව තිබූ බව පසුව කළ පරීක්ෂණවලදී අනාවරණය විය.

මේ සම්බන්ධයෙන් දන්කොටුව පොලිසිය මාරවිල මහේස්ත්‍රාත් හා දිසා විනිසුරු රඛිත පී. අබේසිංහ මහතා හමුවට පසුව කරුණු වාර්තා කළ අතර ඒ අනුව වහාම මෙම පොල් තෙල් සම්බන්ධයෙන් රජයේ රස පරීක්ෂක මගින් පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබා ගන්නා ලෙස පොලිසියට නියෝග කළේය.

එහෙත් ඒ අතර රේගුව පැමිණ පොලිසිය බාරයේ තිබූ තෙල් අඩංගු බවුසර් දෙක සිය බාරයට ගෙන ඇත.

පොලිසියට අධිකරණය දුන් නියෝගය නොතකා තෙල් බවුසර් දෙක රේගුව වෙත බාර දීම සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තාවීම නිසා අධිකරණය මේ සම්බන්ධයෙන් දන්කොටුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක තිළිණ හෙට්ටි ආරච්චි මහතා කැඳවා විමසීමක් කළේය.

එහිදී මෙම පොල් තෙල් අඩංගු බවුසර් දෙක තමන් රේගුව වෙත බාර දුන්නේ පොලිස් නීති ඒකකයේ නියෝගයක් අනුව බව පොලිස් ස්ථානාධිපතිවරයා අධිකරණයට දැනුම් දුන්නේය.

මෙහිදී පොලිසියට දැඩි දෝෂාරෝපණයක් කළ මහේස්ත්‍රාත්වරයා පොලිසිය කටයුතු කළ යුත්තේ තම විධානය අනුව නමුත් මෙහිදී කර ඇත්තේ පොලිස් නීති කොට්ඨාසයේ නියෝගය අනුව බව පැවසීම ගෝචර නොවන නිසා මේ සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් කර වාර්තාවක් මේ මස 21 දින අධිකරණයට ඉදිරිපත් කරන ලෙස පොලිස්පතිවරයාට නියෝග කළේය.

# මණ්ඩලය පරීක්ෂා කළ තෙල් සාම්පල 55 කට පිළිකා කාරක නෑ

## පොල් සංවර්ධන අධිකාරිය කියයි

(යොහාන් භාසුර)

පාරිභෝගික සේවා අධිකාරිය විවෘත වෙළෙඳපොළෙන් ලබාගත් පොල්තෙල් සාම්පල 125 න් පොල් සංවර්ධන මණ්ඩලය පරීක්ෂා කළ පොල්තෙල් සාම්පල් පනස්පහේම 'ඇෆ්ලටොක්සීන්' නමැති පිළිකා කාරකය අඩංගු නොමැති බව සනාථ වූ බව පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් දශිත නිරෝෂණ මහතා පවසයි.

පාරිභෝගික සේවා අධිකාරිය එහි ඉතිරි සාම්පල තත්ත්ව පරීක්ෂාව සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට යොමුකර ඇති අතර එවායේ ප්‍රතිඵල මේ දක්වා ලැබී නොමැත.

# ආනයනික පොල්තෙල්වලට වෙනත් තෙල් මිශ්‍ර කිරීමේ ගැසට්ටුව අවලංගු කරනවා

## ඇමැති බන්දුල ගුණවර්ධන කියයි

(යොහාන් භාසුර)

ආනයනික පොල්තෙල්වලට වෙනත් ආහාරයට ගත හැකි තෙල් වර්ග මිශ්‍ර කිරීමට අවස්ථාව ලබාදෙමින් 2016 වසරේ නිකුත්කර තිබෙන ගැසට් නිවේදනය අවලංගු කරන බව වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පැවසීය.

ආනයනික පොල්තෙල් සමග ආහාරයට ගත හැකි වෙනත් තෙල් වර්ග මිශ්‍ර කිරීම තහනම් කරමින් නව ගැසට් නිවේදනයක් නිකුත් කරන බව ද වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පැවසීය.

ආනයනික පොල්තෙල් පිළිබඳව මේ වන විට උද්ගත වී ඇති ව්‍යාකූල තත්ත්වයට මෙම ගැසට් නිවේදනය හේතු වූ බව වෙළෙඳ අමාත්‍ය පවසයි.

# කසළ කළමනාකරණ ගැටලු: විසඳුම් යෝජනාව ජනපතිට

(සුජිත් හේවාපුලිගේ)

කසළ කළමනාකරණය පිළිබඳ ගැටලු හඳුනාගෙන ඊට විසඳුම් යෝජනා කිරීම සඳහා පත් කෙරුණු විශේෂඥ කමිටුවේ වාර්තාව එහි සභාපති ඉංජිනේරු රොහාන් සෙනෙවිරත්න මහතා විසින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ජනාධිපති කාර්යාලයේදී පෙරේද (31) පස්වරුවේ බාරදෙනු ලැබීය.


කසළ කළමනාකරණය පිළිබඳ ගැටලු හඳුනාගෙන ඊට විසඳුම් යෝජනා කිරීම සඳහා පත් කෙරුණු විශේෂඥ කමිටුවේ වාර්තාව එහි සභාපති ඉංජිනේරු රොහාන් සෙනෙවිරත්න මහතා විසින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ජනාධිපති කාර්යාලයේදී පෙරේදා (31) පස්වරුවේ පිරිනමනු ලැබූ අවස්ථාව.

සාමාජිකයන් දහතර දෙනකුගෙන් යුතු මෙම විශේෂඥ කමිටුව පසුගිය වසරේ ජූලි මාසයේදී පත් කරනු ලැබුවේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසිනි.

මේ විශේෂඥ කමිටු වාර්තාව කැබිනට් මණ්ඩලයට ඉදිරියේ ඉදිරිපත් කරන බව ජනාධිපතිවරයා මෙහිදී පැවැසීය.

වාර්තාවේ ඇති නිර්දේශ පිළිබඳව පූර්ණ පසු විපරමක නිරතවීමේ වැදගත්කම මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණ.

කසළ කළමනාකරණයේදී බාහිර පරිසර සාධක පිළිබඳව සැලකිලිමත් නොවීම නිසා විවිධ ජනතා විරෝධතා ඇති වූ බව පැවසූ ජනාධිපතිවරයා මැසි මදුරු උවදුර මෙන්ම දුගඳ ඇති වීම වැළැක්වීමේ වැදගත්කම ද අවධාරණය කළේය. මේ අවස්ථාවට ඩලස් අලහප්පෙරුම, ගාමිණී ලොකුගේ සහ මහින්ද අමරවීර යන ඇමැතිවරුන්ද දුමින්ද දිසානායක හා රොෂාන් රණසිංහ යන රාජ්‍ය ඇමැතිවරුන් ද ජනාධිපති ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහතා ද විශේෂඥ කමිටු සාමාජිකයින් ඇතුළු පිරිසක් ද සහභාගී වූහ.

# කොරෝනා නව වයිරස ප්‍රභේද හඳුනාගැනීමේ පරීක්ෂණ දෙවැනි වටය අරඹයි

## වාර්තා සතියකින්: ආචාර්ය ජීවන්දර කියයි

(සුජිත් හේවාපුලිගේ)

කොරෝනා නව වයිරස ප්‍රභේද හඳුනාගැනීමේ පරීක්ෂණ දෙවැනි වටය ඊයේ (1) ආරම්භ කෙරුණු බව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආසාත්මිකතා ප්‍රතිශක්තිවේද හා සෛල ජෛව විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රධානී ආචාර්ය චන්දිම ජීවන්දර මහතා පැවැසීය.

දිවයිනේ විවිධ ප්‍රදේශවල කොරෝනා ආසාදිතයන් අතුරින් අහඹු ලෙස 96 දෙනකුගෙන් ලබාගත් ජෛව පටල සාම්පල මෙම පරීක්ෂණ සඳහා යොදගත් බව ද ඔහු කීය

මේ පරීක්ෂණවල වාර්තා සතියකදී නිකුත් කිරීමට ආචාර්ය චන්දිම ජීවන්දර මහතා බලාපොරොත්තු වෙයි.

නව කොරෝනා වයිරසය ප්‍රභේද හඳුනාගැනීමේ පරීක්ෂණවලදී එවැනි වයිරස ආසාදිත වූ විස්සකට ආසන්න පිරිසක් දිවයිනේ විවිධ ප්‍රදේශවලින් පසුගිය දිනවල සොයාගනු ලැබූහ.

නව විකෘති කොරෝනා වයිරස ප්‍රභේද ආසාදනය වී සිටියදී සොයා ගැනුණු පිරිසට විදේශයන්හි සිට මෙරටට පැමිණි විදේශිකයෝ කිහිප දෙනෙක්ද ඇතුළත් වූහ.

ආචාර්ය චන්දිම ජීවන්දර මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් පර්යේෂණ කණ්ඩායම් කිහිපයක් මේ පරීක්ෂණවල නියැලී සිටී.

# ලෙබනන් ගොස් හාම්පුතුන්ගේ හිරිහැර විඳි ලාංකිකයෝ 177ක් ගෙන්වා ගැනෙති

(කටුනායක ටී.කේ.ජී. කපිල )

ලෙබනනයේ රැකියා සඳහා ගොස් සිටිය දී, එරට හාම්පුතුන් අතින් විවිධ හිරිහැර කරදරවලට ලක්ව මෙරටට පැමිණීමට නොහැකිව රැඳී සිටි ශ්‍රී ලාංකිකයන් 177 දෙනකු ශ්‍රී ලංකා ගුවන් සේවයේ විශේෂ ගුවන් යානයකින් ඊයේ (01) අලුයම කටුනායක ගුවන්තොටුපොළට වෙත පැමිණි බව ගුවන්තොටුපොළ කාර්යභාර නිලධාරියකු කීය.

විදේශවල රැකියා සඳහා ගොස් ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකිව එම රටවලම රැඳී සිටින ශ්‍රී ලාංකිකයන් කණ්ඩායම් වශයෙන් මෙරටට ගෙන්වා ගන්නා වැඩසටහන යටතේ මෙම පිරිස ගෙන්වා ගනු ලැබූහ.

ලෙබනනයේ සිට ඊයේ (01) අලුයම 3.45ට පමණ පැමිණි ශ්‍රී ලංකන් ගුවන් සේවයේ යූ.එල්.- 554 දරන විශේෂ ගුවන් යානයෙන් මෙම පිරිස තොටුපළට පැමිණියහ.

මෙසේ පැමිණ සිටි පිරිස අතරින් වැඩි දෙනෙක් ලෙබනනයේ ගෘහ සේවය සඳහා ගොස් සිටි කාන්තාවෝ වෙති. එම පිරිස නිරෝධායනය සඳහා ශ්‍රී ලංකා යුද හමුදාව විසින් රජයේ නිරෝධායන මධ්‍යස්ථානවලට යොමු කරනු ලැබූහ.

# නාමල් රාජපක්ෂ ඇතුළු සිවුදෙනකුගේ විදෙස් ගමන් තහනම ඉවතට

(නිමන්ති රණසිංහ)

එන්.ආර්. කන්සල්ටන්ස් සමාගම මගින් සැක සහිත ගනුදෙනු සිදුකර මුදල් විශුද්ධිකරණය කළැයි කියන සිද්ධිය සම්බන්ධයෙන් විදෙස් ගමන් තහනම් කර සිටි පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතා ඇතුළු සැකකරුවන් සිව් දෙනකුගේ එම තහනම ඉවත් කිරීමට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් බුද්ධික ශ්‍රී රාගල මහතා ඊයේ (01) නියෝග කළේය.

සැකකරුවන්ගේ නීතිඥවරුන් අධිකරණයෙන් කළ ඉල්ලීමක් සැලකිල්ලට ගත් අධිකරණය නාමල් රාජපක්ෂ, චන්ද්‍රසේකර පවිත්‍රා සුජානි බෝගොල්ලාගම, ඔරනෙල්ලා ඉරේෂා සිල්වා සහ නිත්‍යා සේනානි සමරනායක යන අයගේ විදෙස් ගමන් තහනම එලෙස ඉවත් කළේය.

මෙම සිද්ධියට අදාළ විමර්ශන අවසන් කර ඇති බැවින් තමන්ට පනවා ඇති විදෙස් ගමන් තහනම ඉවත් කරන ලෙසට සැකකරුවන් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටි නීතිඥවරුන් කළ ඉල්ලීමක් සැලකිල්ලට ගත් අධිකරණය මෙම නියෝගය නිකුත් කළේය.

මෙම සිද්ධියේ ඇප මත සිටින සැකකරුවෝ ඊයේ (01) අධිකරණය හමුවේ පෙනී සිටියහ. මෙහි සැකකාර නාමල් රාපක්ෂ මහතා ඇතුළු සැකකරුවන් හතර දෙනා සම්බන්ධයෙන් අධිකරණය මගින් ඇප නියම කෙරුණේ එක් අයකුට රුපියල් ලක්ෂයක මුදල් ඇපයක් සහ රුපියල් ලක්ෂ 100 බැගින් වූ ශරීර ඇප 4ක් බැගිනි. ඒ ඉකුත් 2018 වසරේ අගෝස්තු මස 22 වැනිදය.

හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතා විසින් අයථා ලෙස උපයන ලද මුදල්වලින් හෙලෝකෝප් සමාගමේ කොටස් මිලදී ගෙන ඇති බවට මෙම සිද්ධිය මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත වාර්තා කර තිබුණේ අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම ලිපිනයේ වසන්ත සමරසිහ මහතා විසිනි.

# රාජකීය විදුහලේ හිටපු විදුහල්පතිගේ පෙත්සම විභාග නොකරම ඉවත දමයි

(තිළිණි ද සිල්වා)

කොළඹ 07, රාජකීය විද්‍යාලයේ විදුහල්පති ධුරයේ කටයුතු කළ තමා දේශපාලන බලපෑම් මත, නීතියට පටහැනි ලෙස අධ්‍යාපන අමාත්‍යංශයේ අධ්‍යක්ෂ ධුරයකට පත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් ගත් තීරණයෙන් තම මූලික අයිතිවාසිකම් කඩ වී ඇතැයි සඳහන් කරමින් , එම තීරණය බලරහිත කරන්නැයි ඉල්ලා රාජකීය විද්‍යාලයේ හිටපු විදුහල්පති බී.ඒ. අබේරත්න මහතා ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයට නොගෙන ඉවත දැමීමට ශ්‍රේෂ්ඨාධිකරණය ඊයේ (01) තීන්දු කළේය.

අත්‍යවශ්‍ය සහ සැබෑ කරුණු සඟවමින් මෙම පෙත්සම ඉදිරිපත් කරමින් අධිකරණය නොමග යැවීමට පෙත්සම්කරු උත්සාහ කර ඇති බවට නීතිපතිවරයා ඉදිරිපත් කළ මූලික විරෝධතාවක් පිළිගනිමින් ශ්‍රේෂ්ඨාධිකරණය පෙත්සම ඉවත දමා ඇත.

සිසිර ද ආබෲ, ශිරාන් ගුණරත්න සහ මහින්ද සමයවර්ධන යන මහත්වරුන්ගෙන් සමන්විත විනිසුරු මඬුල්ලක් මෙම නියෝගය දුන්නේය.

පෙත්සම්කාර පාර්ශ්වය පෙත්සම සම්බන්ධයෙන් සත්‍ය කරුණු වසන් කර ඇති බවට නීතිපති වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් විවේකා සිරිවර්ධන මහත්මිය අධිකරණය හමුවේ විරෝධතාව දක්වමින් කියා සිටියාය.

එබැවින් මෙම පෙත්සම විභාගයට නොගෙන ඉවත දමන්නැයි ද නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරිය කියා සිටියාය.

එම කරුණ පිළිගත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ල පෙත්සම විභාගයට නොගෙනම ඉවත දැමීය.

අධ්‍යාපන පරිපාලන සේවයේ පළමු පන්තියේ නිලධාරියකු වන බී.ඒ . අබේරත්න මහතා ගොනුකළ මෙම මූලික අයිතිවාසිකම් පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මහාචාර්ය කපිල

පෙරේරා, එම අමාත්‍යාංශ අතිරේක ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්, නීතිපති ඇතුළු 19 දෙනෙක් නම් කරනු ලැබ සිටියහ.

වසර පහක් පුරා රාජකීය විද්‍යාලයේ විදුහල්පති ධුරයේ කටයුතු කරමින් සිටියදී දේශපාලන බලපෑම මත සිදු කළ ස්ථාන මාරුවීම අත්හිටුවන්නැයි ඉල්ලා රාජකීය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය ඇතුළු පාර්ශ්වකරුවන් අභියාචනාධිකරණය හමුවට පෙත්සම් 18 ක් ඉදිරිපත් කර එම ස්ථාන මාරුවීම සම්බන්ධයෙන් පියවර නොගැනීමට එකඟතාවක් ඇති කර තිබියදී, දේශපාලන බලපෑම මත අදාළ ස්ථාන මාරුවීම ලබා දී ඇති බවද පෙත්සම්කරු කියා සිටී.

එමගින් සිය මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බවට නියෝගයක් නිකුත් කරන ලෙසත් , තම ස්ථාන මාරුවීමට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා ගත් තීරණය බලරහිත කරන නියෝගයක් නිකුත් කරන්නැයිද පෙත්සම්කරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටී.

පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ගෞරී සංගරී තවරාසා මහත්මිය ගේ උපදෙස් මත ජනාධිපති නීතිඥ සාලිය පීරිස් , තනුක නන්දසිරි , සරින්ද ජයවර්ධන යන නීතිඥවරු පෙනී සිටියහ .

නීතිපති වෙනුවෙන් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් විවේකා සිරිවර්ධන මහත්මිය පෙනී සිටියාය.

# මන්ත්‍රී මිලාන්-දොම්පේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් අල්ලස් නඩුවෙන් නිදහස්

(මනෝප්‍රිය ගුණසේකර)

කළුගල් කැඩීමේ බලපත්‍රයක් නිකුත් කිරීමට රුපියල් ලක්ෂ 06 ක අල්ලසක් ඉල්ලා ලබාගත් බවට පාර්ලිමේන්තු මන්ත්‍රී මිලාන් ජයතිලක සහ දෙම්පේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකුට එරෙහිව පවරා ඇති නඩුවෙන් ඔවුන් දෙදෙනා නිදහස් කිරීමට කොළඹ මහාධිකරණ විනිසුරු ආදිත්‍ය පටබැඳි මහතා ඊයේ (01) නියම කළේය.

විත්තිකරුවන්ට එරෙහිව යළි නඩු පැවරීමට යටත්ව මෙම නඩුවේ චෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීමට පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි අල්ලස් කොමිසමේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ ගංගා හෙයියන්තුඩුව මහත්මිය කළ ඉල්ලීමක් පිළිගනිමින් විත්තිකරුවන් දෙදෙනා නිදහස් කිරීමට විනිසුරුවරයා නියම කළේය.

2012 නොවැම්බර් මස 12 වැනිදත් දෙසැම්බර් මස 05 වැනිදත් අතර කාලයේ දෙම්පේදී අංක 567 දරන පිඹුර අනුමත කර කළුගල් කැඩීමේ බලපත්‍රයක් හා වෙළෙඳ බලපත්‍රයක් නිකුත් කිරීමට රුපියල් ලක්ෂ 07 ක අල්ලසක් ඉල්ලා ඉන් රුපියල් ලක්ෂ 06ක් ලබා ගන්නා ලදැයි ද ඒ සඳහා ආධාර හා අනුබල දෙන ලදැයිද අල්ලස් කොමිසම විත්තිකරුවන්ට එරෙහිව නඩු පවරා තිබිණි.

මෙලෙස චෝදනා ලැබ සිටින්නේ දෙම්පේ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති මෙන්ම ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමෙන්තු මන්ත්‍රී මිලාන් සජිත් ජයතිලක සහ දෙම්පේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු වන අජිත් සිසිර කුමාර නමැත්තන්ය.

විත්තිකරුවන්ට එරෙහිව නඩු පවරා ඇත්තේ අල්ලස් කොමිසමේ කොමසාරිස්වරුන් තිදෙනාගේම අස්සන් සහිතව නොවන හෙයින් මෙම විත්තිකරුවන්ට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා පත්‍ර දෝෂ සහිත බවට පෙන්වා දෙමින් විත්තිකරුවන් අභියාචනාධිකරණයෙන් කරන ලද ඉල්ලීමකට අනුව මෙම නඩුව විභාගයට ගැනීම වළකාලමින් තාවකාලිකව වාරණ නියෝගයක් නිකුත් කර තිබූ අතර නැවත නඩු පැවරීමට යටත්ව විත්තිකරුවන්ට එරෙහිව ඉදිරිපත් කර ඇති තාක්ෂණික දෝෂ සහිත චෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීමට පැමිණිල්ල අභියාචනාධිකරණයේ දී එකඟතාව පළ කර තිබිණි.

ඒ අනුව මෙම නඩුව කොළඹ මහාධිකරණයේ කැඳවනු ලැබූ අවස්ථාවේ දී පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි අල්ලස් කොමිසමේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ ගංගා හෙයියන්තුඩුව මහත්මිය කරුණු ඉදිරිපත් කරමින් අභියාචනාධිකරණයේ දී එකඟතාව අනුව නැවත නඩු පැවරීමට යටත්ව විත්තිකරුවන්ට එරෙහි චෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීමට අවසර ඉල්ලා සිටියාය.

පැමිණිල්ල වෙනුවෙන් කළ ඉල්ලීමට අවසර දෙමින් විත්තිකරුවන් දෙදෙනා නිදහස් කිරීමට විනිසුරුවරයා නියම කළේය.

පැමිණිල්ල වෙනුවෙන් අල්ලස් කොමිසමේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ ගංගා හෙයියන්තුඩුව මහත්මිය පෙනී සිටියාය.

විත්තිකරුවන් වෙනුවෙන් නීතිඥ ශාලික ගුණවර්ධන මහතා සමග ජනාධිපති නීතිඥ නලීන් ලද්දුවහෙට්ටි මහතා පෙනී සිටියේය.

# කණ්ඩායම් 10 න්ම සම දස්කම්

(නාමල් පතිරගේ)

**ශ්‍රී ලංකා සුපර් ලීග් පාපන්දු තරගාවලියේ පෙර සූදානම් වටය නිමාවේදී ඊට සහභාගි වූ කණ්ඩායම් 10 වෙතින්ම සම දස්කම් පළවී තිබේ. තරග 20කින් සමන්විත පෙර පුහුණු තරග වටය පසුගියදා කොළඹ සුගතදාස පිටියේදී නිමාවට පත්විය.**

පුහුණු වටය නිමාවූයේ රිනවුන් කණ්ඩායම විසින් රත්නම් කණ්ඩායම ගෝල 6-0කින් පරාජයට පත් කරමිනි. එහෙත් මෙම වටයේදී කිසිදු කණ්ඩායමක් අපරාජිතව පසුවීමට සමත්ව නැත.

අප්‍රේල් 18 වැනිදා ශ්‍රී ලංකා සුපර් ලීග් පාපන්දු තරගාවලිය නිල වශයෙන් ආරම්භ කිරීමට නියමිතය. ඊට සහභාගි වන කණ්ඩායම් 10 සහභාගි කර ගනිමින් මෙම පෙර සූදානම් තරග වටය පැවැත්විණි. වැඩිම ගෝල පරතරයකින් මෙහි තරගයක් ජයගත්තේ නාවලපිටිය අප්කන්ට්‍රි කණ්ඩායම විසින් වෙන්නප්පුව නිව් යංග්ස් පිල ගෝල් 7-0 කින් පරාජය කරමිනි.

අවසන් වරට පැවති (2018 දී) ශූරයන්ගේ කුසලාන තරගාවලියට ක්‍රීඩා කළ කණ්ඩායම් 10ක් සුපර් ලීග් තරගාවලියට නිර්දේශ කර ගැණුනි. එහි ප්‍රසාද ලකුණු සටහනට අනුව ඉදිරියෙන්ම සිටි යුද හමුද (ඩිෆෙන්ඩර්ස්) කණ්ඩායම මෙම තරගාවලියේදී පරාජයන් කීපයක්ම ලබමින් පසුබෑමකට ලක්ව සිටියි. ශූරයන්ගේ තරගාවලියේ ප්‍රසාද ලකුණු සටහනට අනුව කොළඹ ක්‍රීඩා සමාජය දෙවැනි තැනත් කළුතර බ්ලූස්ටාර්ස් ක්‍රීඩා සමාජය තෙවැනි ස්ථානයත් ලැබීය.

**පුහුණු වටයයේ අවසන් ප්‍රතිඵල.**

- නාවලපිටිය අප්කන්ට්‍රි ලයන්ස් පිල විසින් නාවික හමුද (සී හෝක්ස්) පිල පරාජය කරන ලදී (4-2)
- රිනවුන් පිල විසින් රත්නම් පිල පරාජය කරන ලදී. (6-0)
- කළුතර බ්ලූස්ටාර්ස් පිල විසින් ඩිෆෙන්ඩර්ස්-යුද හමුද පිල පරාජය කරන ලදී (3-1)
- කොළඹ පිල විසින් වෙන්නප්පුව නිව්යංග්ස් පිල පරාජය කරන ලදී. (4-3)

# කොදෙව්වෝ ලකුණු 165 ක් ඉදිරියෙන්



**පළමු ඉනිමේදී ලද ලකුණු 96 ක වාසිය සමගින් දෙවැනි ඉනිම ඇරඹූ කොදෙව්වෝ ඇන්ටිගුවාහි පැවැත්වෙන දෙවැනි ටෙස්ට් තරගය, සිවුවැනි දිනයේ (1 වැනිදා) දිවා ආහාරය සඳහා නතර කරන විට කඩුලු 2 ක් අහිමි කරගෙන ලකුණු 69 ක් ලබා ශ්‍රී ලංකාවට වඩා ලකුණු 165 ක් ඉදිරියෙන් සිටියහ. පළමු ඉනිමේදී ශතකයක් ලබාගත් නායක ක්‍රේග් බ්‍රැත්වෙයිට් හතරේ පහරක් සමග ලකුණු 22 ක්ද, කයිල් මේයර්ස් හතරේ පහරක් සමග ලකුණු 9 ක්ද ලබා ඒ වන විට කඩුල්ලේ රැඳී සිටියහ.**

මුලු ලකුණු සංඛ්‍යාව 14 ක් වන විට ආරම්භක පිතිකරු ජෝන් කැම්බල් ආපසු ක්‍රීඩාගාරයට හරවා යැවීමට සුරංග ලක්මාල් සමත් වූ අතර කඩුලු රකින ක්‍රීඩක නිරෝෂන් දික්වැල්ල අතට උඩ පන්දුවක් දෙමින් දැවීයන විට කැම්බල් ලබා සිටියේ ලකුණු 10 ක් පමණි. එහිදී ප්‍රධාන විනිසුරුගේ තීරණය සමග එකඟ නොවූ කැම්බල්, එම තීරණය තෙවැනි විනිසුරුට යොමු කළ නමුත් ඉන් සිදුවූයේ කොදෙව් කණ්ඩායමට එක් විනිසුරු තීරණ විමසීමේ අවස්ථාවක් අහිමිවීම පමණි.

ඉන් අනතුරුව බ්‍රැත්වෙයිට් සමග එක්වූ ජර්මේන් බ්ලැක්වුඩ් (18) දෙවැනි කඩුල්ල වෙනුවෙන් ලකුණු 44 ක සම්බන්ධතාවක් ගොඩනැගුවේය. කෙසේ වුවත් විශ්ව ප්‍රනාන්දුගේ පන්දුවක් හමුවේ අනවශ්‍ය ලෙස අපර් කට් පහරක් ගැසීමට යෑමෙන් බ්ලැක්වුඩ්ට පිටියෙන් ඉවත්ව යෑමට සිදුවිය. බ්ලැක්වුඩ්ගේ පිත්තේ දරයේ වැදුණ පන්දුව දික්වැල්ලගේ අත් ආවරණ තුළ සිරවීමත් සමග කොදෙව් ඉනිමේ දෙවැනි කඩුල්ලේ සම්බන්ධතාව නිමාවට පත් විය.

විටින් විට වර්ෂාවෙන් බාධා පැමිණුන තුන්වැනි දිනයේදී ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමට උත්සාහ කරන සෑම අවස්ථාවකදීම පිතිකරුවකු දැවී ගිය නමුත් ශ්‍රී ලංකා පිල වෙනුවෙන් නවක ක්‍රීඩක පැතුම් නිස්සංක හුදෙකලා සටනක නිරතව සිටියේය. සිය මංගල ටෙස්ට් තරගයේදීම ශතකයක් ලබාගත් පැතුම් නිස්සංක, බදදා දිනය නිමා වනවිට නොදැවී ලකුණු 49 ක් ලබා සිටි නමුත් සිවුවැනි දිනයේදී අර්ධ ශතකය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව කෙමර් රෝච්ගේ පන්දුවක් හමුවේ ඔහු දැවී ගියේය.

අල්සාරි ජෝෂප් සහ ජේසන් හෝල්ඩර් දෙදෙනාගේ බුරුළක් නැති පන්දු යැවීම හමුවේ ශ්‍රී ලංකා පිතිකරුවන්ට තිබුණේ අසීරු ගමනකි. ලකුණු ලබාගැනීමත් අවශ්‍යව තිබුණෙන් තට්ටු දම දමා ඉන්නවාට වඩා පහර කරා යාමත් අවශ්‍යව තිබිණ. පිතිකරුවන් අතර සම්බන්ධතාවක් ගොඩනැඟෙන සෑම විටෙකම අයෙක් කඩුල්ල රැකගැනීමටත් අනෙකා ලකුණු කරා යාමත් ශ්‍රී ලංකා පිලේ උපාය විය. එහෙත් වරින් වර ඇදහැළුණු වර්ෂාව පිතිකරුවන්ගේ මානසික ඒකාග්‍රතාව මෙන්ම රිද්මය ද අවුල් කර දැම්මේය.

වර්ෂාවෙන් බාධා පැමිණි හෙයින් තෙවැනි දිනය පුරාම යැවුණේ ඕවර 42 ක් පමණි. එහිදී ලකුණු 114 ක් ලබාගැනීමට ශ්‍රී ලංකා පිතිකරුවන්ට හැකිවූ නමුත් කඩුලු 5 ක් බිඳ වැටිණ.

## ලකුණු පුවරුව

**බටහිර ඉන්දීය කොදෙව් - පළමු ඉනිම 354**

**ශ්‍රී ලංකාව - පළමු ඉනිම**

| | |
|---|---|
| දිමුත් කරුණාරත්න - ඇ.බෝනර් ප.ජෝෂප් | 1 |
| ළහිරු තිරිමාන්න - ප.රෝච් | 55 |
| ඕෂධ ප්‍රනාන්දු - ක.මු.කළා ප.මේයර්ස් | 18 |
| දිනේෂ් චන්දිමාල් - ඇ.අතිරේක ප.ගේබ්‍රියෙල් | 44 |
| ධනංජය ද සිල්වා - ක.මු.කළා ප.බ්ලැක්වුඩ් | 39 |
| පැතුම් නිස්සංක - ඇ.වෝල්ෂ් ප.රෝච් | 51 |
| නිරෝෂන් දික්වැල්ල - ඇ.ජොෂුවා ප.හෝල්ඩර් | 20 |
| සුරංග ලක්මාල් - ඇ.බ්‍රැත්වෙයිට් ප.ජෝෂප් | 6 |
| දුෂ්මන්ත චමීර - ඇ.ජොෂුවා ප.හෝල්ඩර් | 2 |
| ලසිත් ඇඹුල්දෙණිය - නොදැවී | 5 |
| විශ්ව ප්‍රනාන්දු - ඇ.ජොෂුවා ප.රෝච් | 0 |
| අතිරේක | 17 |
| එකතුව ඕවර 107 කදී සියලු දෙනා දැවී | 258 |

**කඩුලු වැටීම:** 1-18(දිමුත් කරුණාරත්න), 2-64(ඕෂධ ප්‍රනාන්දු), 3-77(ළහිරු තිරිමාන්න), 4-152(දිනේෂ් චන්දිමාල්), 5-177(ධනංජය ද සිල්වා), 6-203(නිරෝෂන් දික්වැල්ල), 7-214(සුරංග ලක්මාල්), 8-231(දුෂ්මන්ත චමීර), 9-258(පැතුම් නිස්සංක), 10-258(විශ්ව ප්‍රනාන්දු)

**පන්දු යැවීම:** කෙමර් රෝච් : 18-5-58-3, ෂැනන් ගේබ්‍රියෙල් : 16-3-37-1, අල්සාරි ජෝෂප් : 22-4-64-2, ජේසන් හෝල්ඩර් : 21-3-39-2, කයිල් මේයර්ස් : 11-7-10-1, රකීම් කොන්වෝල් : 15-5-25-0, ජර්මේන් බ්ලැක්වුඩ් : 4-0-16-1

**බටහිර ඉන්දීය කොදෙව් - දෙවැනි ඉනිම**

| | |
|---|---|
| ක්‍රෙග් බ්‍රැත්වෙයිට් - නොදැවී | 22 |
| ජෝන් කැම්බල් - ඇ.දික්වැල්ල ප.ලක්මාල් | 10 |
| ජර්මේන් බ්ලැක්වුඩ් - ඇ.දික්වැල්ල ප.චමීර | 18 |
| කයිල් මේයර්ස් - නොදැවී | 9 |
| අතිරේක | 10 |
| එකතුව ඕවර 24 කදී කඩුලු 2 ක් දැවී | 69 |

**කඩුලු වැටීම :** 1-14(ජෝන් කැම්බල්), 2-58(ජර්මේන් බ්ලැක්වුඩ්)

**පන්දුවට පහර නොදුන් ක්‍රීඩකයෝ :** කෘමා බෝනර්, ජේසන් හෝල්ඩර්, ජොෂුවා ද සිල්වා, රකීම් කෝන්වෝල්, අල්සාරි ජෝෂප්, කෙමර් රෝච් සහ ශැනන් ගේබ්‍රියෙල්

**පන්දු යැවීම :** සුරංග ලක්මාල් : 6-2-13-1, විශ්ව ප්‍රනාන්දු : 7-0-26-0, ධනංජය ද සිල්වා 6-1-10-0, දුෂ්මන්ත චමීර 5-0-12-1

# පැතුම් නිස්සංක හොඳම 11 අතරට



**පළමු ලෝක ටෙස්ට් ශූරතාවලිය එහි අවසානය කරා ලඟාවෙමින් පවතින මොහොතක මෙම තරගාවලියේදී මංගල ටෙස්ට් තරගයට එක්වෙමින් දස්කම් දැක්වූ හොඳම ක්‍රීඩකන් 11 දෙනා අතරට ශ්‍රී ලංකාවේ පැතුම් නිස්සංකත් ඇතුළු වී තිබේ. සුප්‍රකට විස්ඩන් සඟරාව විසින් මෙම තෝරා ගැනීම කර ඇත.**

මේ වනවිට 22 වැනි වියේ පසුවන පැතුම් නිස්සංක බටහිර ඉන්දීය කොදෙව් පිලට එරෙහිව පැවැති පළමු ටෙස්ට් තරගයේදී ටෙස්ට් වරම් හිමිකරගත් අතර එහිදී දෙවැනි ඉනිමේදී ලබාගත් ශතකයත් සමගින් තරගයේදීම ලකුණු 112 ක් ලබාගත්තේය. ශ්‍රී ලංකාවෙන් පිටතදී සිය මංගල ටෙස්ට් තරගයට සහභාගි වෙමින් ශතකයක් ලබාගත් පළමු ශ්‍රී ලාංකික ක්‍රීඩකයා ලෙස පැතුම් නිශ්ශංක වාර්තා පොත් අතරට එක්වීය.

**මංගල ටෙස්ට් තරගයේ දස්කම් දැක්වූ හොඳම ක්‍රීඩකන් 11**

අබීඩ් අලී (පාකිස්තානය), ෂුබ්මන් ගිල් (ඉන්දියාව), නිකෘමා බෝනර් (බටහිර ඉන්දීය කොදෙව්), පැතුම් නිස්සංක (ශ්‍රී ලංකාව), කයිල් මේයර්ස් (බටහිර ඉන්දීය කොදෙව්), ජොශුවා ද සිල්වා (බටහිර ඉන්දීය කොදෙව්), රකීම් කොන්වෝල් (බටහිර ඉන්දීය කොදෙව්), අක්ෂර් පතෙල් (ඉන්දියාව), කයිල් ජැමීසන් (නවසීලන්තය), ජොෆ්රා ආචර් (එංගලන්තය) සහ ඇන්රිච් නෝයේ (දකුණු අප්‍රිකාව)

# වෙළෙඳ සේවා තරගාවලියට ශ්‍රී ලංකා 'ඒ' කණ්ඩායමක්

(දමින්ද විජේසූරිය)

**වෙළෙඳ සේවා ක්‍රිකට් සංගමය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන වෙළෙඳ සේවා ප්‍රිමියර් ලීග් ඕවර 50 ක්‍රිකට් තරගාවලිය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය නියෝජනය කරමින් 'ඒ' කණ්ඩායමක් සහභාගි කරවීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තීරණය කර තිබේ. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සංවර්ධන හා නැගී එන කණ්ඩායම්වල සිටින ක්‍රීඩකයන්ගෙන් සමන්විත කණ්ඩායමක් මේ සඳහා තෝරා ගැනේ.**

මෙම ක්‍රීඩකයන්ට වඩාත් උසස් තරගකාරීත්වයෙන් යුතු තරගාවලියකට ක්‍රීඩා කිරීමේ අවස්ථාව එයින් උදාවනු ඇත.

2021 වසරේ පැවැත්වෙන වෙළෙඳ සේවා තරගාවලිය සඳහා තරුණ ක්‍රීඩකයන්ගෙන් සමන්විත (වයස 23ත් පහළ) කණ්ඩායමක් ඉදිරිපත් කරන ලෙස වෙළෙඳ සේවා ක්‍රිකට් සංගමය කළ ඉල්ලීමක් සලකා බලමින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මෙම තීරණය ගෙන තිබේ.

ක්‍රිකට් ක්ෂේත්‍රයේ සාමාන්‍ය පිළිගැනීම වන්නේ ශ්‍රී ලංකාවේ පැවැත්වෙන පාසල් ක්‍රිකට් තරග හැරුණු විට උසස්ම තරගකාරීත්වයක් ඇත්තේ වෙළෙඳ සේවා ක්‍රිකට් තරගාවලියේදී බවයි. පළමු පෙළ ක්‍රීඩා කරන ක්‍රීඩා සමාජ සංඛ්‍යාව 26 ක් වීමත්, එම ක්‍රීඩා සමාජ වල ක්‍රීඩකයන්ද බොහෝ අවස්ථාවලදී ජාතික කණ්ඩායම නියෝජනය කිරීම හෝ වෙනත් අවශ්‍යතා සඳහා ක්‍රීඩා සමාජයෙන් බැහැරව සිටීමත් ක්‍රීඩා සමාජ තරගාවලිය දුර්වල වීමට ප්‍රධානතම හේතුවයි.

ආරාධිත කණ්ඩායම සම්බන්ධයෙන් කළ විමසීමකදී වෙළෙඳ සේවා ක්‍රිකට් සංගමයේ සභාපති රෝහණ දිසානායක මහතා පැවසූයේ කිසියම් අවස්ථාවකදී ශ්‍රී ලංකා ඒ කණ්ඩායමේ ක්‍රීඩකයකු වෙළෙඳ සේවා ආයතන කණ්ඩායමක් නියෝජනය කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් සිය සේවා ස්ථානයෙන් උපදෙස් ලබාගත යුතුවන බවයි.

අප්‍රේල් මස 17 වැනිදා සිට මැයි 02 වැනිදා දක්වා තරගාවලිය පැවැත්වේ.

# ස්ටැන්ලි ජයසිංහ උපහාර උළෙල හෙට

(දමින්ද විජේසූරිය)

**ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කළ, දැනට සිටින වයෝවෘද්ධතම ක්‍රිකට් ක්‍රීඩකයා වන ස්ටැන්ලි ජයසිංහ මහතාට උපහාර දැක්වීමේ උත්සවයක් හෙට (3 වැනිදා) කොළඹ නාලන්ද විද්‍යාලයීය මලලසේකර ශාලාවේදී පැවැත්වේ.**

1931 ජනවාරි මස 19 වැනිදා බදුල්ලේදී උපත ලද ස්ටැන්ලි ජයසිංහ කොළඹ නාලන්ද විද්‍යාලයෙන් ක්‍රිකට් පිටියට පිවිසියේය. නාලන්ද විද්‍යාලය නියෝජනය කරමින් සිටියදීම, යන්තම් 18 වැනි වියේදී ජාතික කණ්ඩායම (එවකට ලංකා කණ්ඩායම) නියෝජනය කළ ස්ටැන්ලි ජයසිංහ උසස් ගණයේ පිතිකරුවකු විය.

ස්ටැන්ලි ජයසිංහ මහතා, පළමු පෙළ ක්‍රිකට් ක්‍රීඩාවේ නිරත වූ මුල්ම ශ්‍රී ලාංකිකයන් තිදෙනාගෙන් අයකුද වෙයි. එංගලන්තයේ ලෙස්ටර්ෂයර් ප්‍රාන්ත කණ්ඩායම නියොජනය කරමින් ජයසිංහ මහතා පළමු පෙළ තරගවලට සහභාගි වූයේය. ගාමිණී ගුණසේන සහ ක්ලයිව් ඉන්මන් 1982 ට පෙර පළමු පෙළ ක්‍රිකට් ක්‍රීඩා කළ අනෙක් දෙදෙනාය.

50 දශකය ආරම්භයේ සිටම, එංගලන්ත ප්‍රාන්ත තරගාවලියේදී ලෙස්ටර්ෂයර් පිල වෙනුවෙන් පළමු පෙළ තරග 144 කට ක්‍රීඩා කළ ස්ටැන්ලි ජයසිංහ මහතා ලකුණු 6811 ක් ලබාගත්තේ ශතක 10 ක් ද සිය වාර්තාවට ඇතුළත් කරමිනි.

මේ වන විට ජනප්‍රියත්වයේ ඉහළම තලයේ තිබෙන එක්දින අන්තර්ජාතික තරග ආරම්භ වූයේ 1971 දීය. එහෙත් එක්දින තරග අත්හද බැලීමේ මට්ටමින් සංවිධානය කිරීමට සාකච්ඡා කෙරුණු 1962 දී, ලෝකයේ පළමු වැනි එක්දින තරගයට ද ක්‍රීඩා කළ ස්ටැන්ලි ජයසිංහ මහතා එද ඩාර්බිෂයර් පිලට



එරෙහිව නොදැවී ලකුණු 49 ක් ලබාගත්තේය. "පිළිමළුන් පිටුදැකීමේ මිඩ්ලන්ඩ්ස් තරගාවලිය" ලෙසින් හැඳින්වූ මෙම තරගය 1962 මැයි මස 2 වැනිදා ග්‍රේස් රෝඩ්හි ලෙස්ටර්ෂයර් ප්‍රාන්ත ක්‍රීඩාංගණයේදී පැවැත්විණ. කෙසේ වෙතත් මෙම තරගය අත්හද බැලීමේ තරගයක් වූ බැවින් එය පළමු වැනි නිල එක්දින තරගය ලෙසින් නොසැලකේ.

ලෝකයේ පළමු වැනි නිල එක්දින තරගය ලෙසින් හැඳින්වෙන්නේ 1963 මැයි මස 1 වැනිදා (මෙම තරගය මැයි 2 වැනිදටත් ඇදී ගියේය) පැවැති ගිලට් කුසලාන තරගයයි. එම තරගයටත් ක්‍රීඩා කළ ස්ටැන්ලි ජයසිංහ මහතා එහිදී ලබාගත්තේ එක ලකුණක් පමණි.

එංගලන්තයේ ක්‍රිකට් ක්‍රීඩා කිරීමෙන් පසුව නැවතත් සියරට පැමිණි ජයසිංහ මහතා ක්‍රිකට් පුහුණුකරුවකු මෙන්ම තණතීරු සකස් කරන්නකු ලෙසද කටයුතු කළේය. 1991 දී ශ්‍රී ලංකා කණ්ඩායමේ කළමනාකරු වශයෙන් කටයුතු කළ ජයසිංහ මහතා ඉන් පසුව ක්‍රිකට් ක්‍රීඩාවෙන් ඈත්ව සිටියේ එහි තිබූ විවිධ අර්බුද හේතුවෙනි.

ආදි නාලන්ද ක්‍රීඩා සමාජය හෙට දින නාලන්ද විද්‍යාලයේදී පැවැත්වෙන උපහාර උත්සවය සංවිධානය කරයි.







කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 අප්‍රේල් මස 2 වැනිදා සිකුරාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.
Lankadeepa - Printed and published by Wijeya Newspapers Ltd. on Friday 02nd April, 2021 at No. 8, Hunupitiya Cross Road, Colombo 02, Sri Lanka.
Telephone: Editorial Dept: 2448321, 2423919, 5330813 Fax: 2438039, Advertising Dept: 2479540, 5383383, 5330330, Fax: 2314864, 2304144 Circulation Dept: 2435454, 2448322, 2479625 Fax: 2459725 General: 2314714

අඛණ්ඩව 15 වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත

# ලංකාදීප 2

2021 අප්‍රේල් මස 2 වැනිදා සිකුරාදා

අන්තර්ජාල ලිපිනය . වෙබ්.ලංකාදීප.ලංකා /www.lankadeepa.lk

# පන්දහේ හොර නෝට්ටු 7 ක් එක්ක දෙදෙනෙක් අත්අඩංගුවට

## සැකකරු නෝට්ටුවක් කටේ දමා හපලා

(ඉන්දිකා රාමනායක)

**රුපියල් 5000 ව්‍යාජ නෝට්ටු 7 ක් සමඟ සැකකරුවන් දෙදෙනකු බ්ලූමැන්ඩල් පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබ ඇත.**

මෙම සැකකරුවන් දෙදෙනා ඉකුත්ද (30) පස්වරුවේ මෙම ව්‍යාජ නෝට්ටුවක් ඉදිරිපත් කර බ්ලූමැන්ඩල් ප්‍රදේශයේ අවන් හලකින් බීම ඇණවුම් කර ඇති බවත් ඔහු දුන් රුපියල් 5000 නෝට්ටුව සම්බන්ධයෙන් වෙළෙඳසලේ මුදල් අයකැමිවරියට ඇති වූ සැකයක් මත ඇය සිද්ධිය පොලිසියට දැනුම් දී ඇති බවත් පොලිසිය පවසයි.

එම දැනුම් දීම අනුව බ්ලූමැන්ඩල් පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයා යතුරු පැදියකින් එම ස්ථානයට ගොස් ඇති අතර, පොලිසිය දුටු සැකකරු එකවරම ව්‍යාජ මුදල් නෝට්ටුව කටේ දමාගෙන හපා ඇති බවද පොලිසිය කියයි.

වහාම ක්‍රියාත්මක වූ පොලිසිය මහත් පරිශ්‍රමයක් යොදා සැකකරුගේ කටේ තිබූ නෝට්ටුව ඉවත් කරගෙන ඇත.

පොලිසිය සැකකරු අත්අඩංගුවට ගෙන පරීක්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබී තවත් ව්‍යාජ නෝට්ටු තුනක් හමුවී ඇති බව පොලිසිය පවසයි.

අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනාගෙන් ප්‍රධාන සැකකරුට අයත් වැල්ලම්පිටිය කිත්තම්පහුව ප්‍රදේශයේ නිවස පරීක්ෂා කිරීමේදී එහි තිබී තවත් ව්‍යාජ නෝට්ටු තුනක් සොයා ගත් බවද පොලිසිය කියයි.

සැකකරු වාප්පු ලිපිකරුවකු වශයෙන් කලින් සේවය කර ඇති බවත්, ඔහු තදින්ම මත්කුඩුවලට ඇබ්බැහිව සිටින්නකු බවත් පොලිසිය පවසයි.

අවුරුදු සමයේ කොළඹ නගරය ඇතුළු දිවයිනේ විවිධ ප්‍රදේශවල රුපියල් 5000 ව්‍යාජ නෝට්ටු සැරිසැරීමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙන බවත්, ජනතාව ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පැවසීය.

රුපියල් 5000 ව්‍යාජ නෝට්ටු අතට පත් වූයේ නම් ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකර එහි නිර්ව්‍යාජත්වය සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු බවද හෙතෙම කීය.

ව්‍යාජ මුදල් නෝට්ටුවක් සහ සැබෑ මුදල් නෝට්ටුවක් හඳුනා ගැනීමේ ප්‍රධාන නිර්නායකය වන්නේ සැබෑ නෝට්ටුවේ දිය සලකුණ සහ එහි ඇතුළත ඇති කළුපැහැති ධාරය බවත් , ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කළේය.

ඉදිරියේ එන උත්සව සමය හේතුවෙන් මේ ආකාරයේ ව්‍යාජ මුදල් නෝට්ටු තව තවත් හුවමාරු විය හැකි බැවින් ජනතාව ඒ සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කළ යුතු බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කීය.

බ්ලූමැන්ඩල් පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සම්පත් පත්මලාල් මහතාගේ උපදෙස් මත, අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උපපොලිස් පරීක්ෂක රංජිත් මහතා ඇතුළු පොලිස් කණ්ඩායමක් සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වයි.

# හොර ලියකියවිලි හදාගෙන දෙබිඩි දරුවන්ගේ ෆොටෝ එකකුත් හොයාගෙන

# අනුන්ගේ දරුවන් පෙන්වා බස් මගීන්ගෙන් සල්ලි ගරලා

(මීගහතැන්නන ප්‍රේමතිලක පෙරමුණ)

**වෙනත් කෙනෙකුට අයත් ආබාධිත දරුවන් දෙදෙනකුගේ ඡායාරූපයක් පෙන්නා බස් රථවලට නැග ආධාර එකතු කළ පුද්ගලයකු අත්අඩංගුවට ගත් බව මීගහතැන්න පොලීසිය පවසයි.**

මෙසේ අත්අඩංගුවට පත්ව ඇත්තේ මතුගම, කන්දවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවකු බවත්, මොහු පසුගිය 19 වන දින මතුගම - පැලවත්ත බස් රථය තුළ දී , එකට බද්ධ වූ ආබාධිත දරුවන් දෙදෙනකු ගේ ඡායාරූපයක් මගින්ට පෙන්වා, එම දරුවන්ගේ පියා තමා බවත් ශල්‍යකර්ම හා ප්‍රතිකාර සඳහා අවශ්‍ය මුදල් වෙනුවෙන් ආධාර එකතු කරමින් සිට ඇත, ඒ පිළිබඳ සැක සිතූ බස් රථයේ ගමන් ගත් යුද හමුදා සෙබළෙකු කරුණු විමසීමේ දී සැකකරු වංචාවක් කරන බවට අනාවරණය වී ඇතැයි පොලීසිය සඳහන් කරයි

ඒ අනුව එම හමුදා සෙබළා පොලිසිය දැනුවත් කිරීමෙන් පසු බස් රථය නවත්වා, මීගහතැන්න පොලිසියේ උපපොලිස් පරීක්ෂක රත්නසිරි මහතා විසින් සැකකරු අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇත.

වැඩිදුරටත් සැකකරුගෙන් ප්‍රශ්න කිරීමේ දී අදාළ ඡායාරූපය වසර කිහිපයකට පෙර මාධ්‍යයේ ප්‍රචාරය වූ ගාල්ල, අක්මීමන ප්‍රදේශයේ බද්ධ වූ දරුවන්ගේ ඡායාරූපය බවත්, ආධාර එකතු කිරීම සඳහා විවිධ පුද්ගලයන්ගෙන් සහ ආයතනවලින් සහතික කළ ලියකියවිලි සැකකරු සන්තකයේ තිබී සොයාගත් බවත් පොලිසිය පවසයි

එම සහතික වසරකට පමණ කලින් ප්‍රාදේශීය සභාවකින් සහ යම් යම් පුද්ගලයන්ගෙන් ලබාගත් දින ඉකුත් වූ ඒවා බව ද අනාවරණය වී ඇත.

සැකකරුගෙන් වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේදී තමන් විවාහකයකු බවත්, මෙම ලියකියවිලි වෙනත් පුද්ගලයකු ලබාදුන් බවත් තමන්ගේ පාසල් යන දරුවන්ට අවශ්‍ය වියදම් මෙම වංචාව සිදුකළ බවත් පොලිසිය වෙත පවසා ඇත

සැකකරු මතුගම අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාරගත කර ඇති අතර කළුතර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කපිල ප්‍රේමදාස මහතාගේ උපදෙස් මත මීගහතැන්න පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්. එම්. ජේ. ආරියවංශ මහතාගේ මෙහෙයවීමෙන් උපපොලිස් පරීක්ෂක රත්නසිරි, සැරයන් බුද්ධදාස යන මහත්වරු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

# බූරුවා කවුද?



## චාල්ස් කොලොන්නේ පෙදෙසේ කුණු ගොඩක්



ගල්කිස්ස ටෙම්ප්ලර්ස් පාර චාල්ස් කොලොන්නේ ප්‍රදේශයේ පිහිටා ඇති විශාල ඉඩමක් අයිනේ මහා පරිමාණයෙන් කැළිකසළ ගොඩගැසී තිබේ.

ටයර්, ප්ලාස්ටික් භාජන, වීදුරු බෝතල්. කැළිකසළ මලු යනාදිය හේතුවෙන් ප්‍රදේශය පුරාවට මැස්සන්, කෘමීන්, මදුරුවන් බෝවීමෙන් ප්‍රදේශයේ ජනතාව මහත් පීඩාවකට පත්ව ඇති බව ප්‍රදේශවාසීහු පවසති.

ගල්කිස්ස ටෙම්ප්ලර්ස් පාර චාල්ස් කොලොන්නේ පෙදෙස ප්‍රදේශයේ පිහිටා ඇති විශාල ඉඩමක් අයිනේ මහා පරිමාණයෙන් කැළිකසළ ගොඩ ගැසී ඇති අයුරු. (වැල්ලවත්ත බී. ජානක)

### ජනපති ජාතික පාසල් වැඩසටහනේ පළමුවැන්න:

# ජයවර්ධනපුර බාලක බාලිකා විදුහල් මිශ්‍ර ජාතික පාසලක් වෙයි



පළමු සිසුවිය ලියාපදිංචි කරවීම. පාර්ලිමේන්තු මන්ත්‍රී මධුර විතානගේ මහතා, දිසාපති ප්‍රදීප් යසරත්න මහතා ඇතුළු පිරිස මෙහි වෙති.

(මොරටුව රේඛා තරංගනී ෆොන්සේකා)

**මෙතෙක් කලක් පැරණිතම පාසල් දෙකක් ලෙස පැවතුන ශ්‍රී ජයවර්ධනපුර බාලක පාසල සහ ශ්‍රී ජයවර්ධනපුර බාලිකා පාසල මිශ්‍ර ජාතික පාසලක් ලෙස මෙම වසරේ ජනවාරි මාසයේ නම් කිරීමෙන් පසු මිශ්‍ර ජාතික පාසලක් වූ (Church Missionary Society) සී.එම්.එස්. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ජාතික පාසලට පළමු සිසුවිය ලියාපදිංචි කිරීම සහ 2021 වර්ෂය සඳහා සිසු සිසුවියන් ඇතුළත් කර ගැනීමේ උත්සවය 31 දා එම විදුහලේදී සිදුකෙරිණි.**

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ පාසල් සංවර්ධනය හා ජාතික පාසල් වැඩසටහන යටතේ අභිෂේක ලැබූ පළමු ජාතික පාසල ලෙස CMS ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ විද්‍යාලය පත්ව ඇත.

පාර්ලිමේන්තු මන්ත්‍රී මධුර විතානගේ, කොළඹ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) ප්‍රදීප් යසරත්න, විදුහල්පති ලුතිනන් කර්නල් ඩී.ඒ.ඩී. වානගුරු මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් එම විදුහලේදී ආරම්භක උත්සවය පැවැත්විණි.

2021 වර්ෂය සඳහා වූ සිසු සිසුවියන් ඇතුළත් කිරීමේදී පළමුවෙන්ම ලියාපදිංචි කළ සිසුවිය වූයේ කඩුවෙල ප්‍රදේශයේ පදිංචි අහංගමගේ මිනුලිකා වගීෂානි හේවාවසම් සිසුවියයි.

මෙම වසරේ නවක සිසුසිසුවියන් එකසිය හැටක් ඇතුළත් කර ගනු ලැබීය.

ජාතික පාසලක් ලෙස නම් කළ පාසලට අනුගත කෙරුණු ශ්‍රී ජයවර්ධනපුර බාලක පාසල වසර 199 ක් පැරණි වන අතර ශ්‍රී ජයවර්ධනපුර බාලිකා පාසල වසර 150ක් පැරණි පාසලකි.

මෙම උත්සවය සිහිගැන්වීමක් ලෙස රුක් රෝපණයක්ද සිදුකළ අතර එහිදී ඇතුළත් කෙරෙන දරු දැරියන්ට පැළයක් ප්‍රදානය කිරීම ද සිදුකෙරිණි.

# උඩුගල්පොත්ත රක්ෂිතයේ අනවසරයෙන් වේවැල් කැපූ දෙදෙනෙක් අසුවෙති



අත්අඩංගුවට ගත් වේවැල් තොගය

(මතුගම බන්දු තඹවිට සහ ඉසුරු ලක්ෂාන්)

**සිංහරාජ වනාන්තරයේ පරිවාර රක්ෂිතයක් වන උඩුගල්පොත්ත රක්ෂිතයේ කාලයක සිට අනවසරයෙන් වේවැල් කැපීමේ නිරත වූ දෙදෙනකු වේවැල් කැබලි 350ක් සමඟ තිනියාවල පොලිසිය අත්අඩංගුවට ගෙන ඇත.**

14 කණුව, තිනියාවල පදිංචිකරුවන් දෙදෙනකු මෙසේ අත්අඩංගුවට ගෙන ඇත.

නෙළුව සහ තිනියාවල පොලිස් වසම්වල පිරිසක් කාලයක සිට පවත්වාගෙන ගිය සිංහරාජ වනාන්තරයේ පරිවාර රක්ෂිතයක් වන උඩුගල්පොත්ත රක්ෂිතයේ වේවැල් කැපීමේ ජාවාරම පිළිබඳව පොලිස් විශේෂ කාර්යාංශයේ තිනියාවල පොලිසියට අනුයුක්ත නිලධාරියාට ලැබුණු තොරතුරක් අනුව සිදුකළ වැටලීමකදී මෙම සැකකරුවන් සමග වේවැල් තොගය අත්අඩංගුවට ගැනීමට හැකි වී ඇත.

මෙම වැටලීමේදී අඩි 10 ත් 12 ත් අතර ප්‍රමාණයේ වේවැල් කැබලි 350ක් පොලිසිය අත්අඩංගුවට ගෙන ඇත. රක්ෂිතයේ ගස් සහ වේවැල් කැපීමේ චෝදනාවට මේ වන විටත් මතුගම අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින ජාවාරමේ ප්‍රධාන සැකකරු පලාගොස් ඇති අතර ඔහු අත්අඩංගුවට ගැනීමට තිනියාවල පොලිසිය පරීක්ෂණ අරඹා ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත අතර තිනියාවල පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ටී.පී. වැදිසිංහ මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් පරීක්ෂක ධර්මප්‍රිය, පොලිස් සැරයන් 5828 අනුර, පොලිස් කොස්තාපල්වරුන් වන 84312 මධුසංඛ, 78827 සම්පත්, 65205 ගුණතිලක යන නිලධාරිහු මෙම වැටලීම සිදුකළහ.

# ලක්ෂ 3 ක කුඩු එක්ක ජාවාරමා මාට්ටු

## අම්මා-තාත්තා-ආච්චිත් කුඩු විකුණා රිමාන්ඩ්

(බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ)

**දෙහිවල ලියනගේ මාවතේදී රුපියල් ලක්ෂ තුනක් පමණ වටිනා හෙරොයින් මත්කුඩු පැකට් තොගයක් සමග පුද්ගලයෙකු 30 වැනිද අත්අඩංගුවට ගත් බව පොලිස් විශේෂ කාර්ය බළකා මූලස්ථාන කඳවුර කියයි.**

සැකකරු සන්තකයේ මත්කුඩු පැකට් 500ක් තිබී පොලිසිය භාරයට ගෙන ඇත.

විශේෂ කාර්ය බළකා මූලස්ථාන කඳවුරට ලද තොරතුරක් අනුව අත්අඩංගුවට ගත් සැකකරුගේ මව, පියා හා ආච්චි මත්කුඩු ජාවාරම් සිදුකරන බවත් මව මේ වන විට රිමාන්ඩ් භාරයේ පසුවන බවත් පොලිසිය කියයි. 21 හැවිරිදි සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා දෙහිවල පොලිසිය වෙත භාර දී ඇත. පොලිස් විශේෂ කාර්යය බළකා මූලස්ථාන කඳවුරේ නිලධාරීහු වැටලීම සිදුකළහ.

# කෘමි රසායන ද්‍රව්‍ය මිලදී ගන්න කෝටි 4ක් වැඩිපුර ගෙවීම ගැටලුවක්


## නාගරික මන්ත්‍රී වෛද්‍ය ප්‍රදීප් කාරියවසම් කියයි

(මුදිතා දයානන්ද)

**කොළඹ මහ නගර සභාව කෘමි මර්දන රසායනික මිලදී ගැනීමේදී 2019 දී කෝටි හතරක් වැඩියෙන් ගෙවීම ගැටලු සහගත බව ද ඒ සම්බන්ධයෙන් තමන් ඉදිරිපත් කළ ප්‍රශ්නය නගරාධිපතිනිය මාස හයක් තිස්සේ මගහැර ඇති බව ද ඒ අනුව එහි අක්‍රමිකතාවක් සිදුව ඇතැයි සැකයක් පවතින බව ද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නාගරික මන්ත්‍රී වෛද්‍ය ප්‍රදීප් කාරියවසම් මහතා ලංකාදීපයට පැවසීය.**

සාමාන්‍යයෙන් මීට පෙර වැයකරන ලද්දේ කෝටි දෙකකට ආසන්න ප්‍රමාණයක් වන අතර 2019 දී මෙම රසායන ද්‍රව්‍ය මිලදී ගැනීමට කෝටි හයකට වැඩි මුදලක් වැයකර ඇති බව ද ඔහු පැවසීය.

ඩෙංගු රෝගයේ පැතිරයාම 2019 දී විශාල ලෙස වැඩි නොවූ බව ද එසේ තිබියදී කෘමි මර්දන රසායනික මිලදී ගැනීමට මෙතරම් අධික මුදලක් හිටිහැටියේම වැඩිපුර වැය කරන්නට සිදුවූයේ කුමන හේතුවක් නිසාදැයි ගැටලුවක් ඇති බව ද ඔහු පැවැසීය. මේ සම්බන්ධයෙන් තමන් පසුගිය වසරේ සැප්තැම්බරයේ සිට නගර සභාවෙන් ප්‍රශ්න කරන නමුත් මේ දක්වා එම ප්‍රශ්නයට පිළිතුරු දීම නගරාධිපතිනිය මග හැර සිටින බව ද කාරියවසම් මහතා පැවසීය.




# හවුලේ පොහොර හැදූ දෙදෙනා බහින්බස්වී පහරකෑ අයෙක් මරුට

(බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ)

**කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරමින් හවුල් ව්‍යාපාරයක් කරන දෙදෙනකු අතර පෙරේදා (31) ඇතිවූ ආරාවුලකින් අනතුරුව එක් පුද්ගලයකු අනෙකාට පහරදී ඝාතනය කර ඇතැයි පාදුක්ක පොලිසිය කියයි.**

මෙලෙස ඝාතනයට ලක්ව ඇත්තේ හෂාන් ලක්මාල් ගුණරත්න 27 නමැත්තාය.

පහරදුන් බවට සැකකරන පුද්ගලයා ප්‍රදේශය හැර පලාගොස් ඇති බව පොලිස් නිලධාරියෙක් පැවැසීය.

මියගිය පුද්ගලයාගේ කෑ ගැසීම ඇසී ඔහුගේ බිරිඳ නිවසින් පිටතට පැමිණ සොයා බැලීමේදී ඔහු වැටී සිටින අයුරු දැක පාදුක්ක රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව පැයකට පමණ පසු මියගොස් තිබූ බව පොලිස් නිලධාරියා වැඩිදුරටත් පැවසීය.

පලාගිය සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා විශේෂ පොලිස් කණ්ඩායම් යොදවා ඇතැයි පොලිස් නිලධාරියා වැඩිදුරටත් පැවසීය. පාදුක්ක පොලිසිය පරීක්ෂණ පවත්වයි.

# වියදම් කළ මිලියන 64 වතුරේ







## පාදුක්ක මහජන ක්‍රීඩාපිටියට ගිය කලක්

## විදුලි පහන් කැඩිලා: රාත්‍රියට මංතීරුවල යන්න බෑ: විසකුරු සර්පයන් වැහි වැහැලා

(පාදුක්ක විශේෂ නිහාල් වෙත්තසිංහ)

**සීතාවකපුර නගර සංවර්ධන වැඩසටහන යටතේ රුපියල් මිලියන 64ක මහජන මුදල් සම්භාරයක් වැයකර ඉදිකළ පාදුක්ක මහජන ක්‍රීඩාංගණය අඩුපාඩු සහිතව හුදකලා වී ඇතැයි ප්‍රදේශයේ ජනතාව පවසති.**

නාගරික සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ ඉදි කෙරුණු මෙම ක්‍රීඩාංගණය 2019 වර්ෂයේ ජූලි මස 23 වැනි දින ජනතා අයිතියට පත් කෙරුණි.

ක්‍රීඩාංගණය විවෘත කළ මුල් කාලයේදී රාත්‍රී කාලයේ ජනතාවට ව්‍යායාම් කටයුතුවල නිරතවීමට හැකියාව තිබුණත් මේ වනවිට එම අවස්ථාව විදුලි පහන් අක්‍රියවීම නිසා අහිමිවී ඇතැයි ඔවුහු පවසති.

**මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ පාදුක්ක ලියන්වල පදිංචි ආර්.එන්. දමින්ද කුමාර මහතා:**

මේ ප්‍රදේශයට විශාල අඩුපාඩුවක්ව පැවති මංතීරු සහිත මෙම ක්‍රීඩාපිටිය මේ ප්‍රදේශයට විශාල සම්පතක් වෙනවා.

මුල් අවධියේ පැවති තත්ත්වයෙන්ම මේ වනවිටත් තිබෙනු ඇතැයි බොහෝ දෙනා විශ්වාස කළා. නමුත් කුමන හෝ හේතුවක් මත ක්‍රීඩාපිටිය විවෘත කර ඉතාමත් කෙටි කාලයකින් රාත්‍රී කාලයේ දැල්වෙන විදුලි පහන් අක්‍රිය වුණා. දැන් රාත්‍රී කාලයේ කිසිම කෙනෙකුට මං තීරුවේ ඇවිදින්න බැහැ. පිට්ටනිය පුරා රාත්‍රී කාලයේ විසකුරු සර්පයින් පිරිලා. රැකියාවන් සඳහා යන බොහෝ දෙනා රැකියාවන්වලට ගොස් නිවෙස්වලට ඇවිත් රාත්‍රී 10-11 වනතුරු ව්‍යායාම් කටයුතුවල නියැළෙනවා. වසර දෙකකට ආසන්න කාලයක් පුරා පවතින මෙම තත්ත්වය කෙරෙහි වගකිවයුතු අංශවල අවධානය යොමු වුවහොත් මේ ක්‍රීඩාපිටියේ වටිනාකම ඉදිරි පරපුරටත් ප්‍රයෝජනවත් වෙනවා යැයි ඒ මහතා පැවසීය.

**පාදුක්ක ගලගෙදර පදිංචි කේ. අනුර ධම්මික මහතා මෙසේ පැවසීය.**

අදියර දෙකකින් ඉදිකෙරුණු මෙම ක්‍රීඩාපිටිය නාගරික සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ ඉදිවී 2019 වර්ෂයේ ජනතා අයිතියට පත් වුවත් රාත්‍රී කාලයේ විදුලි පහන් අක්‍රියවෙලා. සමහර අය විදුලි පන්දම් පවා දල්වාගෙනයි රාත්‍රී කාලයේ ව්‍යායාම් කටයුතුවල නිරත වෙන්නේ.

ඒ විතරක් නෙවෙයි. සැලසුමක් ඇතිව මංතීරුව සකස් කළත් මංතීරුවේ සවිකර ඇති විදුලි පහන් කණු මංතීරුවේ ඇවිදින බොහෝදෙනාට ඉතාමත් බාධාවක්.

මේ විදුලි පහන් කණු නියමිත සැලැස්මක් පරිදි මංතීරුවේ එක් පැත්තකට වනසේ සවි කළා නම් තියෙන අඩුපාඩුවලින් එක් අඩුපාඩුවක් හෝ විසඳෙනවා.

දැන් මේ තියෙන ක්‍රමයට දෙදෙනකුට එකවර මංතීරුවේ ගමන් කරන්න බැහැ.

ඒ වගේම තමයි මංතීරුව මැදිවූ ක්‍රීඩා පිටිය ඉතාමත් කෙටි කාලයකින් නිදිකුම්බා සහ වෙනත් වල් පැළ වැවීම සිදු වෙනවා. නිසි භාරකරුවෙකුට මෙම ක්‍රීඩාපිටියේ පාලනය නොලැබීමෙන් මේ වනවිට ක්‍රීඩාපිටිය හුදකලාවී තිබෙනවා යනුවෙන් පැවසීය.

ප්‍රදේශය නියෝජනය කරන සීතාවක ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝම මධු ප්‍රසාද් මහතාගෙන් විමසීමේදී මෙසේ පැවසීය.

ප්‍රදේශයේ ජනතාවට විශාල ප්‍රයෝජනයක් වූ මෙම නව ක්‍රීඩාංගණයේ ඇත්තෙන්ම අඩුපාඩු රාශියක් තිබෙනවා.

මේ වනතෙක් මෙම ක්‍රීඩාංගණය සීතාවක ප්‍රාදේශීය සභාවට පවරා නැහැ. අපි මේ සම්බන්ධයෙන් එම ආයතනය දැනුවත් කර තිබෙනවා. ඉදිරියේදී එය සිදුවේයැයි මන්ත්‍රීවරයා පැවසීය.




### මේ සිංහල අපගෙ රටයි

මුතු ඇටයක් ලෙසට වියතුන් කියන — ලද
ඇත ගොඩබිමක් මේ මහ සාගරය — මැද
පෙර රජදවස සව් සිරියෙන් පිරුණ — ලද
මේ රජ දහන බැබලුණි ලොව දී — නාද

පිරිසුදු නිහඬ ජන කොටසක් — සිටියාලු
සාමය රැඳුණ සමගිය එහි — තිබුණාලු
ආගම දහම සිය පණ මෙන් — රැකුණාලු
පිරිසිදු සංස්කෘතියක උන් — බැඳුනාලු

පිට රටවලින් අන් ජාතිකයන් — පැමිණෙනවා
උන්ගේ ගති සිරිත් ටික ටික — වපුරනවා
සංකර ගති සිරිත් රට තුළ — ඇති වෙනවා
කලවම් සංස්කෘතියක් මෙහි — බිහි වෙනවා

මෙරට තිබුණ සාමය වනසා — දමලා
පුරා වස්තු දේපළ ගිනිබත් — කරලා
ජනතා විරෝධී පෙරමුණු — ඇති කරලා
බඩ ගෝස්තරවාදියො — රජවීලා

පාලකයිනේ මේ ගැන සොයලා — බලමු
වඳවෙන අපේකම රැක ගන්නට — හිතමු
සිංහල සංස්කෘතියක් යලි — බිහි කරමු
සිංහල රටක් බව අපි ලෝකෙට — කියමු

**විජයපාල නිරිඇල්ල**
නාගරික සංවර්ධන පදනම - බුලත්සිංහල

**ඔබේ නිර්මාණ බස්නාහිර කවි මඩුව "ලංකාදීප" කර්තෘ මණ්ඩලය, අංක 8, හුණුපිටිය හරස් පාර, කොළඹ 02. ලිපිනයට යොමු කරන්න.**

## සෞඛ්‍යදානයෙන් පරිත්‍යාගයක්

**කොවිඞ් මර්දන පාසල් සුරක්ෂිතා වැඩසටහන දිවයින පුරා පිහිටි පාසල් සෞඛ්‍යදන ඒකක සඳහා අත් සේදුම් දියර ප්‍රදානය කිරීමේ වැඩ සටහනක් මේ දිනවල ශ්‍රී ලංකා සෞඛ්‍යදන ව්‍යාපාරය මගින් ක්‍රියාත්මක කරනු ලබයි.**



**ඒ අනුව කුරුණෑගල වයඹ රාජකීය විද්‍යාලයේ සෞඛ්‍යදන ඒකකය සඳහා සෞඛ්‍යදන මූලස්ථානයේ සුනිල් පෙරේරා මහතා අතින් අත් සේදුම් දියර ලබා දුන් අවස්ථාව.**

## යගිරල කැලේ අනවසරයෙන් හෙළි කළ බිමක වන වගා




**(මීගහතැන්න - ප්‍රේමතිලක පෙරමුණ)**

**වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් යගිරල රක්ෂිතය තුළ අනවසරයෙන් එළි පෙහෙළි කරන ලද අක්කරයක භූමි භාගයක ඉකුත් 23 දින නැවත වන වගාවක් ආරම්භ කරන ලදී.**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මතුගම සහ අගලවත්ත අඩවි වන නිලධාරී කාර්යාල මගින් සංවිධානය කරන ලද මෙම වන වගා වැඩසටහන බස්නාහිර සහ වයඹ පළාත් භාර නියෝජ්‍ය වන සංරක්ෂක නිලධාරිනී තුලානි කුලරත්න මෙනවියගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.

රක්ෂිතය තුළ කිලෝමීටරයක් පමණ ඇතුළත අනවසරයෙන් එළි පෙහෙළි කර වගා කිරීමට සූදානම් කළ භූමි භාගයක් රක්ෂිතයට පවරා ගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

මෙහිදී මෙම භූමිභාගය තුළ හොර, නා, ඉඹුල්, ඇටඹ, පත්කැල ශාක පැළ 450 ක් රෝපණය කරන ලදී.

මේ අවස්ථාව සඳහා කළුතර දිසා වන නිලධාරී මංගල ජයකොඩි, මතුගම අඩවි වන නිලධාරී සිදත් අබේධීර, අගලවත්තඅඩවි වන නිලධාරීන් චන්දිම යන මහත්වරුන් ද, අගලවත්ත සහ මතුගම බීට්වු වන නිලධාරීන් වන ව්‍යාප්ති නිලධාරීන්, නිලධාරිනියන්, ක්ෂේත්‍ර සහයක නිලධාරීන් ඇතුළු ප්‍රදේශවාසීන් පිරිසක් එක් වූහ.

## කුඩු ජාවාරම්මු 3ක් බොරැල්ලෙන් මාට්ටු

**(මත්තේගොඩ - ශාන්ත ප්‍රදීප් කුමාර කුලරත්න)**

**බොරැල්ල හා ග්‍රෑන්ඩ්පාස් යන ප්‍රදේශවලදී හෙරොයින් මිලිග්‍රෑම් නවදහස් නවසිය අසූවක් සමග තිදෙනකු ඉකුත් 27ද අත්අඩංගුවට ගත් බව පොලිසිය පවසයි.**

මින් ජාවාරම්කරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන ඇත්තේ බොරැල්ල, ගෝතමීපුර සහ සරණපාල හිමි මාවතේදීය. ඔවුන් සන්තකයේ හෙරොයින් මිලිග්‍රෑම් හයදහස් එකසිය අසූවක් තිබී බොරැල්ල පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන තිබේ.

අනෙක් සැකකරු ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන තිබූ අතර ඔහු සන්තකයේ හෙරොයින් මිලිග්‍රෑම් තුන්දහස් අටසියයක් තිබී ග්‍රෑන්ඩ්පාස් පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන තිබුණි.

ඒ අනුව අත්අඩංගුවට ගත් හෙරොයින් මිලිග්‍රෑම් නවදහස් නවසිය අසූවෙහි වටිනාකම රුපියල් ලක්ෂ දහයකට ආසන්න බව පොලිසිය කියයි.

අවුරුදු 22, 25 සහ 42 යන වයස්වල පසුවන සැකකරුවන් බොරැල්ල සහ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශවල පදිංචිකරුවන් බව පැවසේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් තිදෙනා මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

## කුඹුරක මැණික් ගැරූ 3කට 15000 ක් දඩ

**(අවිස්සාවේල්ල විශේෂ සෝමසිරි හිගුරල ආරච්චි)**

බලපත් නොමැතිව පෞද්ගලික කුඹුරක මැණික් ගැරීම සඳහා පතල් කැපීම චෝදනාලත් පුද්ගලයන් තිදෙනකු එම චෝදනාවලට වරදකරුවන් බව පිළිගැනීම නිසා අවිස්සාවේල්ල ප්‍රධාන මහේස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු චමරි වීරසූරිය මහත්මිය තදින් අවවාද කොට එක් අයෙකුට රුපියල් 5000/- බැගින් තිදෙනාටම රුපියල් 15,000ක දඩ නියම කළාය.

සැකකරුවන් අවිස්සාවේල්ල මානියම්ගම පදිංචි කේ.ඒ. රත්වීර, කේ. චන්ද්‍රදස, කේ.එම්. ජිනදස යන අයවෙති.

අවිස්සාවේල්ල මූලස්ථාන පොලිසිය මගින් සැකකරුවන් අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර තිබිණි.

## ගල්කිස්ස වෙරළ තීරයේ කෘත්‍රිම වැලිපරය සාර්ථකයි

### වෙරළ සංරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් කියයි

**(මොරටුව - රේඛා තරංගනී ෆොන්සේකා)**

**ගල්කිස්ස වෙරළ තීරයේ කෘත්‍රිම වැලිපරය සැකසීමේ ව්‍යාපෘතියේ බලාපොරොත්තු වූ ආකාරයට කෘත්‍රිම වැලි පරයේ ප්‍රතිනිර්මාණය සිදුවී ඇති බවත් එහි වැරදුණු තැන් හඳුනාගෙන ඇති බවත් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුගත් යාලේගම මහතා (29) පැවසීය.**



වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගල්කිස්ස වෙරළ තීරයේ කෘත්‍රිම වැලිපරය සැකසීම ව්‍යාපෘතියේ පසු විපරම් නිරීක්ෂණ චාරිකාවේදී යාලේගම මහතා එසේ කීය.

ව්‍යාපෘතියේ නිවැරදි තැන් ලෙස හුවා දක්වමින් යාලේගම මහතා පැවසූයේ ගල්කිස්ස හෝටලය ආසන්න වෙරළ කලාපයේ මුහුදු තරංග හේතුවෙන් අධිකව ඛාදනයට ලක් වී තිබුණු හෙයින් වැලි ප්‍රවාහය වැඩි කිරීමේ අවශ්‍යතාවයක් පැවැත්වුණු බවයි.

ගල්කිස්ස වෙරළ තීරය භාවිත කරන සංචාරකයින් සහ දුම්රිය මගින් මෙන්ම හෝටල් හිමියන්ගෙන් වරින්වර ලැබුණු ඉල්ලීම මෙන්ම වෙරළ රැක ගැනීමේ අවශ්‍යතාව නිසා මෙම වෙරළ තීරය සැකසීමේ ව්‍යාපෘතිය සඳහා අවධානය යොමු කළ බවද ඒ මහතා පැවසීය.





ගල්කිස්ස යනු කොළඹ ප්‍රදේශය ඇති ප්‍රධාන සංචාරක වෙරළ තීරයක් නිසා ගල්වැටි දැමීම ප්‍රායෝගික නොවන කාර්යයක් බව ද සඳහන් කළ ඒ මහතා විශාල පිරිවැයක් දැරීමට සිදු වුවත් කෘත්‍රිම වැලි පර නිර්මාණය කිරීමේ අවශ්‍යතාවයක් පැවති බව පැවසීය.

කෘත්‍රිම වැලි පර සැකසීමේදී එක්තැනකට වැලි නිකුත් කළ විට එය වෙරළෙ ප්‍රතිනිර්මාණය වන තරංග මගින් තවත් තැනකට ස්ථානගත කිරීම සිදුකරන බවද යාලේගම මහතා සඳහන් කළේය.

2017 වර්ෂයේ ආරම්භ කළ ව්‍යාපෘති සැලසුමකට අනුව 2020 වර්ෂයේ ක්‍රියාවට නැංවුණු මෙම කෘත්‍රිම වැලි පරය සැකසීමේ ව්‍යාපෘතිය මේ වනවිට ඕනෑම අයකුට දැකිය හැකි වන ආකාරයට ප්‍රතිනිර්මාණය වී ඇති බව යාලේගම මහතා වැඩිදුරටත් පැවසීය.

පාරිසරික වශයෙන් නීතිමය පැත්ත පිළිබඳව අවධානය යොමුකිරීමේදී වෙරළෙ සිදුකරන වෙනස්කම් සම්බන්ධයෙන් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වැඩි බලයක් පැවරෙන බව යාලේගම මහතා පැවසීය.

වෙරළ ආරක්ෂණ ක්‍රියාවලිය වෙනුවෙන් යම් යම් තීන්දු තීරණ ගැනීමේ හැකියාව පැවතුනත් විවිධ පාර්ශ්ව සම්බන්ධ කරගනිමින් මත විමසීමේ වටිනාකම හඳුනාගෙන ඇති බවත් ඉදිරියේදී වෙරළ සංරක්ෂණයේ සිදුකරන විවිධ ව්‍යාපෘතිවලට පෙර සැලැස්මක් ලෙස විවිධ පාර්ශ්වයන්ගෙන් අදාළ ව්‍යාපෘතිය පිළිබඳව මත විමසීම සිදු කිරීමට බලාපොරොත්තු වන බවද යාලේගම මහතා වැඩිදුරටත් පැවසීය.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ආර්.ඒ.එස්. රණවක මහතා කියා සිටියේ වරින්වර ගල්කිස්ස වෙරළ තීරයේ වෙරළ ඛාදනය වැඩි වශයෙන් වාර්තා වූ බවද වෙරළ ඛාදනය වළකාලීමට ගල්වැටි යොදා කෙටි කාලීන සැලැස්මක් යෙදුවද දිගුකාලීන සැලැස්මක් ලෙස කෘත්‍රිම වැලිපරයක් සැකසීමේ අවශ්‍යතාවය පැවති බවය.

ප්‍රතිපෝෂණය කිරීමේදී ධීවරයන්ට ධීවර කර්මාන්තයේ නියැළීමට සහ සංචාරක කටයුතු කරගෙන යෑමට හැකිවන පරිදි වෙරළ ප්‍රතිපෝෂණය කිරීමේ ක්‍රමවේදය ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාව පැන නැගි බව ද ඒ මහතා පැවැසීය.

මේ වනවිට වසරකට පසු සිදුකරන මෙම පසු විපරමේදී බලාපොරොත්තු වූ ආකාරයට වෙරළ ප්‍රතිපෝෂණය වී ඇති ආකාරය දැකගත හැකි බව කී රණවක මහතා අදාළ කෘත්‍රිම වැලි සැකසීම විදේශීය දියුණු රටවල්වල වැඩි වශයෙන් භාවිතයට ගන්නා බව සඳහන් කළ ඒ මහතා එහි අදියර තුනකින් වෙරළ ප්‍රතිපෝෂණ වීමේ ක්‍රියාවලිය සැකසෙන බව පැවසීය.

එහි පළමු අදියර ලෙස වැලි පරයක් සැකසීමේදී වෙරළට ආසන්න ඇති වැලි මුහුදට ගසා ගෙන ගොස් ගොඩබිම් කලාපයක් නිර්මාණය කරන බවද ඉන් අනතුරුව විශාල රළ පාරවල් ගොඩබිමට ගලා ඒම එකී වැලි තලයෙන් පාලනය වන බවද ඒ මහතා පැවසීය.

එයාකාරයෙන් වැලි තලය පාලන වීමෙන් අනතුරුව තව කොටසක් වෙරළ දෙසට ඇදී යාම ස්වාභාවික ක්‍රියාවලියක් ලෙස සඳහන් කළ රණවක මහතා බලාපොරොත්තු වන ස්ථාවර වෙරළ තීරය ඉන් අනතුරුව තුන්වන අදියර ලෙස ස්වභාවික ලෙස ආරක්ෂා කරමින් වෙරළ ප්‍රතිපෝෂණය වන බව ද වැඩිදුරටත් පැවසීය.

## වලගෙදර පුරන් කුඹුරු අක්කර 50 කට පණදෙයි

**(මතුගම - බන්දු තඹවිට)**

**පුරන් කුඹුරු අස්වැද්දීමේ ජාතික වැඩසටහනට සමගාමීව මතුගම වලගෙදර ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් වලගෙදර දකුණ ප්‍රදේශයේ පිහිටි වසර 48 ක් පුරන්වූ පුරන් කුඹුරු අක්කර 50 ක ප්‍රමාණයක් නැවත වගාකිරීමේ කටයුතු ආරම්භ කිරීමේ උත්සවයක් වලගෙදර රිටිකැටිය ප්‍රදේශයේදී පැවැත්විණි.**



මතුගම ප්‍රාදේශීය සභාවේ සභාපති මෙරිල් මුණසිංහ සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජය කරවිට ඇතුළු ප්‍රදේශයේ ගොවි ජනතාව පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා කටයුතු ආරම්භ කළ අයුරු

වලගෙදර දකුණ කොට්ඨාසයට අයත් කැකිල්ලවල ඕවිට, මීගමුව ඕවිට සහ දුවගොඩ ඕවිට යන කුඹුරු යායවල්වලට අයත් වර්ෂ 1973 න් පසුව වගා නොකළ අක්කර 50 ක පමණ කුඹුරු ඉඩම් ප්‍රමාණයක් මෙම වැඩසටහන මගින් අස්වැද්දීමට නියමිත අතර ඒ සඳහා ගොවීන්ට රජය මගින් ගොවිජනසේවා මධ්‍යස්ථාන හරහා පහසුකම් සැලසීමට නියමිතය.

මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී අනුප පැස්කුවෙල්, මතුගම ප්‍රාදේශීය සභාවේ සභාපති මෙරිල් මුණසිංහ, මතුගම ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජය කරවිට, වලගෙදර ගොවිජන සංවර්ධන නිලධාරී එස්.ආර්.එච්.එන්. පෙරේරා, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර අනේක සපුතන්ත්‍රි, වලගෙදර දකුණ ග්‍රාම නිලධාරී යසෝජා රත්නලතා ඇතුළු නිලධාරීන් සමග වලගෙදර දකුණ ගොවි සංවිධානයේ සභාපති එන්.ඩී. කුලරත්න, ලේකම් උපුල් ජයසිංහ ඇතුළු ප්‍රදේශවාසීන් විශාල පිරිසක් සහභාගි වූහ.

# බියගම ප්‍රාදේශීය සභාව

## සියඹලාපෙ සංවර්ධනයේදී කුඹුරු ඉඩමකට උපරිම වන්දියක් ගෙවනවා

### සභාපති ආනන්ද ගනේපොළ

(දෙල්ගොඩ - සුදත් පුබුදු කීර්ති)

**බියගම සියඹලාපේ මංසන්ධියේ හරිත බිම් සංවර්ධන ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ අක්කර 75 ක කුඹුරු ඉඩම් ප්‍රමාණයක සංවර්ධන කටයුතු සිදු කරන බවත් ඒ වෙනුවෙන් මඩ ඉඩමකට ගෙවිය හැකි උපරිම වන්දි මුදල ඉඩම් හිමිකරුවන්ට ලබා දෙන බවත් මූලික මැනුම් කටයුතුවලින් පසුව සියලුම ඉඩම් හිමිකරුවන් කැඳවා දැනුවත් කිරීමක් සිදු කරන බවත් බියගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආනන්ද ගනේපොළ මහතා පැවැසීය.**

එසේම මෙම ව්‍යාපෘතියේ මූලික කටයුතු සඳහා මෙවර අයවැයෙන් රුපියල් කෝටි 15 ක මුදලක් වෙන්කර ඇති බවත් දේශීය හා ජාත්‍යන්තර වැදගත්කමක් ඇති අංග රැසක් මෙම ස්ථානයේ ස්ථාපනය වන බවත් ඒ අතරින් උද්භිද උද්‍යානයක්, පරිසර හිතකාමී වෙළෙඳපොළක්, ක්‍රීඩාංගණයක්, වැවක් සහ රථවාහන අංගනයක් මූලික අදියර යටතේ ඉදිවන බවත් බියගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආනන්ද ගනේපොළ මහතා පැවැසීය.

බියගම ප්‍රාදේශීය සභාවේ මාර්තු මස මාසික මහා සභා රැස්වීමේ මුලසුන හොබවමින් සභාපති ආනන්ද ගනේපොළ මහතා එසේ කීවේය.

මාවරමංඩිය ප්‍රධාන රැස්වීම් ශාලාවේදී ඉකුත්ද මහා සභා රැස්වීම පැවැත්විණි.

**විපක්ෂනායක ප්‍රසන්න සම්පත් (එ.ජා.ප.):**

සියඹලාපේ හරිත බිම් සංවර්ධන ව්‍යාපෘතියට අපගේ උපරිම සහය ලබා දෙනවා. මේ පිළිබඳව ගොවීන්ගේ වැරදි මත දුරු කර ඔවුන්ට මේ ව්‍යාපෘතිය පිළිබඳව අවබෝධයක් ලබා දෙන්න. කුඹුරු යාය මැද තියන දූපත කොටස දේශපාලකයෙකුට අයිතියි කියා කතාවක් යනවා. ඒ කොටසත් මේ අවස්ථාවේම මේ ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන්න.

**දිවානි හෙට්ටිගේ (ශ්‍රී ල.නි.ප.):**

පමුණුවිල ප්‍රදේශයේ පුරන් කුඹුරුවල අනවසර කටයුතු සිදු වෙනවා. එම කුඹුරු හිමියන්ගේ කැමැත්ත මත පුරන් කුඹුරු වගා කළ හැකි අයට ලබා දෙන්න. ඊට සභාවේ අනුග්‍රහය ලබා දෙන්න.

**සමන්ත විජේරත්න (පො.ජ.පෙ.):**

තම පෞද්ගලික මුදල් යොදවා ඇළ වේලි පිළිසකර කර බියගම පුරන් කුඹුරු නැවත වගා කිරීමට පෙරමුණ ගෙන කටයුතු කරන නිමල් කාරියප්පෙරුම මහතා අගය කළ යුතුයි.

**ආර්.පී. සිසිර කුමාර (එ.ජා.ප.):**

බොල්ලෑගල ගඟ බඩ සීතාවෙල ඇළ පිළිසකර කළ යුතුයි. ඇළේ මුල් කොටස පළල් කර ගැඹුර වැඩි කර පිළිසකර කර දෙන්න. මෙම ඇළ ගංවතුර පාලනයටද ඉවහල් වෙනවා.

**අනුෂ්කා ලියනගේ (ජ.වි.පෙ.):**

බියගම බල ප්‍රදේශයේ පවත්වාගෙන යන යාඥා මධ්‍යස්ථාන නියාමනයකට ලක්විය යුතුයි. කඳුබොඩ ප්‍රදේශයේ එවැනි මධ්‍යස්ථානයක යක්දෙස්සියක් විසින් අහිංසක දැරියක් මරු මුවට පත්කළා. ජාති ආගම් බේදයෙන් තොරව ජනතාව පීඩාවට පත්වෙනවා. මිථ්‍යා මතවල සිටින ජනතාව ඉන් මුදා ගැනීමට දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කරමු.

**ටී. සෝමවතී පෙරේරා (එ.ජා.ප.):**

පමුණුවිල ආදාහනාගාරය සහ එහි භූමිය ඉතා දැකුම්කළු ස්ථානයක් බවට පත්කර තිබෙනවා. ඒ ආකාරයෙන්ම පමුණුවිල පාසල අසල සුසාන භූමියද දැකුම්කළු ස්ථානයක් බවට පත්කරන්න.

**ආසිරි සචින්ත (පො.ජ.පෙ.):**

බියගම නිදහස් වෙළඳ කලාපයේ කර්මාන්ත ශාලාවල රාත්‍රී මුර සේවයේ නියුතු ඇතැම් සේවකයන්ට යතුරුපැදිවලින් පැමිණ මත්ද්‍රව්‍ය අලෙවි කරනවා. මේ ගැන අදාළ බලධාරීන් දැනුවත් කරන්න.

**සිඩ්නි කැමිලස් (එ.ජා.ප.):**

සපුගස්කන්ද තෙල් පිරි පහදුව වට රවුමේ තිබූ සපුගස්කන්ද ශාන්ත ප්‍රැන්සිස් දේවස්ථානයට අයත් කුරුසිය මාර්ග සංවර්ධනයේදී ඉවත් කර බොහෝ කල් වෙනවා. යළි එම කුරුසිය එහි ස්ථාපිත කරන්න.

**නලින් දිසානායක (ශ්‍රී ල.නි.ප.):**

සභාවේ නීති රීති අනුව මේ සභාව ක්‍රියාත්මක විය යුතුයි. මන්ත්‍රීවරුන්ට හිතෙන හිතෙන දේ කියන්න ගියොත් සභා රැස්වීම රාත්‍රී වෙනකම් තියන්න වෙනවා.

**එච්. ඩී. කීර්තිසිරි (එ.ජා.ප.):**

සභාපතිතුමා පරිනත දේශපාලනඥයකු නිසා විපක්ෂයේ අපි එතුමාට සහාය ලබා දෙනවා. නමුත් මේ සභාවේ ඇතැමුන් කරන කුහක ප්‍රකාශ නිසා අපේ සමගිය නැතිව යා හැකියි.

**අන්වර් මහතා (ශ්‍රී ල.නි.ප.):**

බෞද්ධ ඉස්ලාම් දහම් පාසල් ටිකත් සෞඛ්‍ය ක්‍රමවේද අනුව හැකි ඉක්මනින් විවෘත කරමු. සියලු දරුවන්ට දහම් අධ්‍යාපනය තම දිවි සාර්ථක කරගන්න මහඟු පිටුවහලක් වෙනවා.

**කේ.ඒ. ගුණසිංහ (පො.ජ.පෙ):**

පට්ටිවිල ප්‍රධාන මාර්ගය ඉතා පටුයි. අවට කර්මාන්ත ශාලාවල තෙල් පුරවාගත් බවුසර් ඇතුළු විශාල රථවාහන ප්‍රමාණයක් එහි ධාවනය වෙනවා. පදිකයන්ට ඉඩක් නැහැ. මාර්ගය පළල් කර නිසි නඩත්තුවක් කරන්න අදාළ ආයතන දැනුවත් කරන්න.

**ආනන්ද ගනේපොළ සභාපති (පො.ජ.පෙ.):**

පාඩු ලබමින් අගාධයට ගිය බියගම විවිධ සේවා සමුපකාර සමිතිය නව සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ලාභ ලබන ආයතනයක් බවට පත්ව තිබෙනවා. රුපියල් කෝටියක ලාභයක් වගේම ස්ථාවර තැන්පතු ලක්ෂ 50 ක් අද වනවිට සමිතිය සතුව තිබෙනවා.

බැංකුවට උකස් වන්න ගිය දෙල්ගොඩ නගරයේ දෙමහල් ගොඩනැගිල්ල යළි සමිතිය සතු කරගෙන තිබෙනවා. ගම්වල වැසී ගොස් ඇති සමුපකාර ප්‍රාදේශික යළි විවෘතකර ජනතාවට සහන සැලසිය යුතුයි. පට්ටිවිල නගර සංවර්ධනයට අවශ්‍ය කටයුතු සිදුකර තිබෙනවා. පට්ටිවිල සිට කැලණි ගඟෙන් එගොඩට පාලමක් ඉදිවෙනවා. ඊට අවශ්‍ය සැලසුම් සකස් කර අවසන්.

# බියගම යාඥා මධ්‍යස්ථාන හොයා බලන්න ඕනෑ

## අනුෂ්කා ලියනගේ (ජ.වි.පෙ.)

# සීතාවක ඇළ පිළිසකර කළොත් ගංවතුර පාලනය කරන්න පුළුවන්

## ආර්.පී. සිසිර කුමාර (එ.ජා.ප.)

# පට්ටිවිල පාර පටුයි

## කේ.ඒ. ගුණසිංහ (පො.ජ.පෙ.)

# කළගෙඩිහේන අශෝක ප්‍රාථමිකයේ පිපුණු මල් කැකුළු



(වාරණ ආනන්ද ඉ. ජයකොඩි)

කළගෙඩිහේන අශෝක ප්‍රාථමික විද්‍යාලයේ පළමු වසර සඳහා ඇතුළත් කරගත් නවක සිසුන්ගේ පන්ති පෙරේද (31) ආරම්භ කෙරිණි.

නවක සිසු දරු දැරියන් සෞඛ්‍ය ආරක්ෂිතව පාසැලට පැමිණි අවස්ථාව.

# රාගම මඩම පාරටත් කුණු ගෙනත් දාලා



රාගම කොළඹ 'බස් නැවතුම්පොළට යාබද මඩම පාරට 'කුණු කසළ' ගෙනවිත් ගොඩගැසීමට පිටස්තර ප්‍රදේශවල ඇතැම් පිරිස් මේ වන විට පුරුදුව සිටින බව ජනතාව කියති.

මෙලෙස ගොඩගසන කුණු කසළ අතර මස් මාංශ අබලි කොටස්ද වන අතර එමගින් හමන දුගඳින් ජනතාව මහත් අපහසුතාවට පත්ව සිටිති.

බස් නැවතුම්පොළ ආසන්නයේ මෙම කුණු ඉඳුල් සුනඛයන් විසින් පාරට ඇද දැමීම නිසා මාර්ගයද අපවිත්‍රව පවතී.

මීට ආසන්නයේ ළදරු පාසලක්, කන්‍යාරාමයක්, රජයේ ආයතන 2ක නිල නිවාස කිහිපයක් සහ ජනතාව පදිංචි නිවාස කිහිපයක් ද පවතියි. මෙම කුණු කසළ ඉඳුල් ගෙනවිත් දමන පුද්ගලයන් හඳුනාගෙන ඔවුනට නීතිමය පියවර ගත යුතු බවද ජනතාව පවසති.

**(රාගම එච්.ආර්. ගැමිලස් සිල්වා)**

# කැලණිය සරසවි සිසු උද්ඝෝෂණය



විශ්වවිද්‍යාල විවෘත නොකිරීමට සහ කැලණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය මර්දනයට එරෙහිව මහා ශිෂ්‍ය සංගමය මගින් සංවිධානය කෙරුණ උද්ඝෝෂණයක් ඉකුත් 30දා කැලණිය විශ්වවිද්‍යාලය ඉදිරිපිටදී පැවැත්විණි.

එහිදී ශිෂ්‍ය සංගමයේ සිසුන් උද්ඝෝෂණයේ නිරතව සිටි අවස්ථාව.

# ජාඇළ අඩු ආදායම් පවුල්වල දරුවන්ට අභ්‍යාස පොත්

(ජා-ඇල ප්‍රසංග පෙරේරා)

ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පදිංචි අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පාසල් අභ්‍යාස පොත් කට්ටල හා උපකරණ බෙදාදීමක් උදම්මිට ශ්‍රී ජයවර්ධනාරාමයේදී විහාරාධිපති උදම්මිට ඤාණිස්සර තිස්ස හිමියන්ගේ ප්‍රධානත්වයෙන් විහාර ශාලාවේදී සිදුවිය.

ජා-ඇල ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන සංවිධායක නාගරික මන්ත්‍රී නාමල් සුරංග මහතාගේ සිසු නැණ ට සවියක් වැඩසටහන යටතේ ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිසු දරුවන් තුන්දහසක් සඳහා අභ්‍යාස පොත් හා උපකරණ නොමිලයේ බෙදාදීමේ වැඩසටහනට සමගාමීව මෙම පොත් බෙදාදීම සිදු විය. පාසල් දරුවන්ගේ සහභාගීත්වයෙන් තොරව කොරෝනා සෞඛ්‍ය නීති රීති අනුව පැවති මෙම උත්සවයේදී මවක් සිය දරුවාගේ පොත් කට්ටලය උදම්මිට ඤාණිස්සර තිස්ස හිමියන් අතින් ලබා ගත් අවස්ථාව ඡායාරූපයේ වෙයි.



# ගම්පහ සම්පායවත්ත පාර රූපසිංහ මාවත කළාට විරෝධයක්

(ගම්පහ තිලකරත්න දිසානායක)

**ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ඉහළ යාගොඩ සිට මොරගොඩ දක්වා ඇති සම්පායවත්ත නමැති මාර්ගයේ කොටසක් රූපසිංහ මාවත යනුවෙන් නම් කිරීම සම්බන්ධයෙන් එම ප්‍රදේශයේ සංවිධාන කිහිපයක විරෝධය පළව ඇත. මේ සම්බන්ධයෙන් ඉකුත් (31) ද පැවති ගම්පහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදීද සාකච්ඡා වූ අවස්ථාවේ තීරණය වූයේ මෙය ප්‍රාදේශීය සභාවේ තීරණයක් මත ක්‍රියාත්මක කර ඇති බවය.**

මෙම රැස්වීමේදී ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රේණුකා ශ්‍යාමලී පෙරේරා මහත්මිය අදහස් දක්වමින් පැවසුවේ කලකට ඉහතදී සම්පායවත්ත පාර සඳහා එම ප්‍රදේශයේ විසූ සම්පායෝ නමැති අයකු විසින් සිය ඉඩමේ කොටසක් පරිත්‍යාග කොට ඇති බැවින් මාර්ගය සම්පායවත්ත පාර නමින් නම් කර ඇති බවය.

මීට පිළිතුරු දෙමින් ගම්පහ ප්‍රාදේශීය සභාවේ සභාපති රංජිත් ගුණවර්ධන ප්‍රකාශ කොට සිටියේ 2002 වර්ෂයේදී වරිපනම් ගැසට් කිරීම රූපසිංහ මාවත යනුවෙන් සිදුකොට ඇති බවත් මෙය ප්‍රාදේශීය සභාවේ තීන්දුවක් මත ක්‍රියාත්මක කරන ලද බවත්ය.

මෙහිදී සම්බන්ධීකරණ කමිටුවෙහි සභාපති රාජ්‍ය අමාත්‍ය නාලක ගොඩහේවා මහතා සඳහන් කර සිටියේ ගැසට් කර ඇති අන්දමට ප්‍රාදේශීය සභාවේ තීරණයක් අනුව රූපසිංහ නාමය යෙදීම ක්‍රියාත්මක කර ඇති බවය.

# මාස 3ට මිනුවන්ගොඩින් මී උණ රෝගීහු 21 ක්

(දෙවලපොළ කීර්ති ප්‍රනාන්දු)

**මිනුවන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයෙන් මී උණ රෝගීන් 21 දෙනකු වාර්තා වී ඇතැයි මිනුවන්ගොඩ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක අරුණ රන්දෙණිය මහතා කියයි.**

මෙම වසරේ ජනවාරි මාසයේ සිට මාර්තු 31 දක්වා කාලය තුළදී මෙම රෝගීන් වාර්තා වූ බවත් වෙනත් වසරවලට සාපේක්ෂව මෙම මාස තුන තුළ රෝගීන් වැඩිවීමට ප්‍රධාන හේතුව කුඹුරු ගොවීන්ගේ නොසැලකිලිමත්කම බවත් රන්දෙණිය මහතා පැවසීය.

මේ වන විට වාර්තා වී ඇති මී උණ රෝගීන් වැඩි පිරිසක් දෙවලපොළ අස්ගිරිය, වීදියවත්ත, හොරම්පැල්ල ප්‍රදේශවලින් වාර්තා වූ බවද අරුණ රන්දෙණිය මහතා පවසයි.

පසුගිය දිනවල ගොයම් කැපීම සඳහා කුඹුරුවලට බැසීම සිදු කළ පුද්ගලයන් මෙසේ මී උණ රෝගයට ගොදුරු වී සිටින බවද රන්දෙණිය මහතා ලංකාදීපයට පැවසීය.

කුඹුරුවල වැඩ කිරීම සඳහා කුඹුරට බැසීමට පෙර මී උණ රෝගයෙන් ආරක්ෂා වීමට නියමිත බෙහෙත් පානය කරන ලෙස සෞඛ්‍ය නිලධාරීන් විසින් දිගින් දිගටම ගොවීන් දැනුවත් කරනු ලැබුවද එම උපදෙස් පිළිනොගෙන කුඹුරුවලට බසින පිරිස් මෙසේ මී උණ රෝගීන් ලෙස හඳුනාගැනීමට හැකි වූ බවද හෙතෙම පැවැසීය.

එසේ වාර්තා වී ඇති මී උණ රෝගීන් 21 දෙනා අතර කුඹුරු ඇළ මාර්ගවල සහ කුඩා ජලාශ තුළ මාළු ඇල්ලීමට ගිය කීප දෙනකුම සිටින බවද රන්දෙණිය මහතා කීය.

ඉදිරි දිනවල කුඹුරු වගා කටයුතු ආරම්භ කරන කාලය බැවින් කුඹුරුවලට බැසීමට දින කීපයකට පෙර මී උණ රෝගයෙන් ආරක්ෂා වීමට අදාළ බෙහෙත් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගෙන් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් නොමිලයේම ලබා ගෙන එය පානය කරන ලෙසත් එම බෙහෙත් පානය නොකර කුඹුරු වගා සඳහා කුඹුරුවලට බැසීමෙන් වළකින ලෙසත් අරුණ රන්දෙණිය මහතා ගොවීන්ට දැනුම් දෙයි.

# මීරිගම වන සංරක්ෂණ කලාප අවට නිවාසවලට පොදු ළිංවලින් ජලය

(මීරිගම විශේෂ පුෂ්පකුමාර මල්ලවආරච්චි)

**පරම්පරා ගණනක සිට මීරිගම ප්‍රදේශයේ වන සංරක්ෂණ කලාප අවට පිහිටි නිවාසවලට පොදු ළිඳක් මගින් ජලය ලබාගැනීමේ පහසුකම් සලසන බව ගම්පහ දිස්ත්‍රික් වන නිලධාරිනී දේවානි ජයතිලක මහත්මිය කියයි.**

මෙම පෙදෙස්වල පදිංචිකරුවන් රක්ෂිත කඳු ඉඩම්වලින් ගලා එන ජල පහරවල් හරස් කර කුඩා වළවල් සකසා බට යොදාගෙන නිවෙස්වලට පානීය ජලය ලබා ගැනීමේ නිරතව සිටීම හේතුවෙන් ඔවුනට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම නිසා එම ජනතාව දැඩි ලෙස අසරණව සිටින බව මීරිගම ප්‍රාදේශීය ලේකම් ඉන්දික ප්‍රසාද් මහතා ගම්පහ දිස්ත්‍රික් ජීවනෝපාය සංවර්ධන කමිටුවේදී අනාවරණය කරනු ලැබීය.

මෙම ජනතාවට වෙනත් ජල මූලාශ්‍ර හෝ විකල්පයක් නැති බවද වේවැල්දෙණිය බෝතලේ හා හන්දුරුමුල්ල ඇතුළු වසම් 14 ක පදිංචිකරුවන් මේ හේතුවෙන් පීඩාවට පත්ව සිටින බවද මෙහිදී හෙළිවිය. මෙම ජනතාව රක්ෂිත වනයට කිසිදු ආකාරයක හානියක් නොකර පාරම්පරිකව මේ ආකාරයට ජලය ලබාගැනීමෙන් එදිනෙද කටයුතු කරගෙන ගොස් ඇතැයිද එම පෙදෙස්වල ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නැති බවද මෙහිදී හෙළිවිය.

පොළොන්නරුව ප්‍රදේශයේ පවුල් 80 ක් ඇතුළුව මීරිගම ප්‍රදේශයේ පවුල් 300 ක් පමණ මේ තත්ත්වයට මුහුණදී ඇතැයිද මෙහිදී කියවිණි.

මෙහිදී අදහස් දැක්වූ දිසා වන නිලධාරිණි දේවානි ජයතිලක මහත්මිය සඳහන් කළේ කඳු මුදුන්වලින් ගලා එන ජලය මේ ආකාරයට ලබා ගැනීමෙන් භූගත ජල මට්ටමට බලපෑමක් ඇති වන බවයි. කාලාන්තරයක් තිස්සේ මේ ආකාරයට ජලය ලබා ගැනීමෙන් කැලෑවේ ළිං තවානක් ආකාරයෙන් පවතින බවද ඇය සඳහන් කළාය.

ඒ තත්ත්වය නවතා එක් ළිඳකින් පවුල් කිහිපයකට ජලය ලබා ගැනීමේ අවස්ථාව සලසාදීමට පියවර ගෙන ඇතත් පිරිසක් ඊට අකැමැත්ත පල කරන බවද ඇය සඳහන් කළාය. එසේ ජලය සපයන්නේද එක් ස්ථානයකින් පවුල් කිහිපයකට වන සංරක්ෂණ නිලධාරින්ගේ පාලනය යටතේ වන අතර පානීය ජල පහසුකම් සඳහා පමණක් බවද ඇය අවධාරණය කළාය.

මෙම ජනතාව ජලය ලබා ගන්නා ළිං ලෙස හැඳින්වුවද ඒවා අඩියක් දෙකක් තරම් ගැඹුරති කුඩා වළවල් පමණක් වන බව මෙහිදී ප්‍රාදේශීය ලේකම් ඉන්දික ප්‍රසාද් මහතා පෙන්වා දෙනු ලැබීය.

මෙම ගැටලුව සම්බන්ධයෙන් දෙසතියක් ඇතුළත දිසා ලේකම්වරයා හා සාකච්ඡා කර විධිමත් ක්‍රමවේදයක් සකසන ලෙසට සංචාරක ඇමති ප්‍රසන්න රණතුංග මහතා මෙහිදී උපදෙස් දුන්නේය.

# ධීවර කාර්මිකයන්ට කුඩු ජාවාරම් කර අවුරුද්දක් රිමාන්ඩ්ව ඉඳලා

## සැකකරුට ඇප

**(මීගමුව අධිකරණ ඩබ්ලිව්. කීර්ති)**

**ගැඹුරු මුහුදේ දින ගණනාවක් රැඳී සිටිමින් ධීවර කර්මාන්තයේ යෙදෙන බහුදින ධීවර කාර්මිකයන්ට අලෙවි කිරීම සඳහා මත්කුඩු රැගෙන යමින් සිටිය දී අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් භාරයේ පසු වූ ධීවර කාර්මිකයකු රුපියල් 25,000 ක මුදල් ඇප සහ රුපියල් ලක්ෂ 5 බැගින් ශරීර ඇප දෙකක් මත රිමාන්ඩ් භාරයෙන් මුදා හැරීමට මීගමුව මහාධිකරණ විනිසුරු ආර්.ඩී.පී.පී. රත්නායක මහතා පෙරේදා (31) දා නියෝග කළේය.**

ජ්‍යෙෂ්ඨ නීතිඥ ප්‍රීමාල් අමරසිංහ මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ ඇප අයදුම මත ඇප නියම වූ සැකකරු වූයේ දිවුලපිටියේ පදිංචි මදුසංඛ අසංක රෝහණ හෙට්ටිආරච්චි නැමැති බහුදින ධීවර කාර්මිකයෙකි. මොහු බහුදින ධීවර යාත්‍රාවක් මගින් ගැඹුරු මුහුදේ ධීවර කාර්මිකයන්ට මත්කුඩු විකිණීම සඳහා දිවුලපිටියේ සිට බේරුවල ධීවර වරාය දක්වා ත්‍රිරෝද රථයකින් ගිය වසරේ මැයි මස 7 වෙනි දින යමින් සිටිය දී මරඳගහමුල ඉන්ධන පිරවුම් හල අසල දී දිවුලපිටිය පොලිසියේ නිලධාරීන් විසින් හෙරොයින් ග්‍රෑම් 5 මිලිග්‍රෑම් 300ක් සමග අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගතකර තිබිණි.

සැකකරු වසරකට ආසන්න කලක් රිමාන්ඩ් භාරයේ පසු වූ අතර රජයේ අධිනීතිඥ ගයනි වැගොඩපොළ මහත්මිය පැමිණිල්ල මෙහෙය වීය. ඇප අයැදුම වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ නීතිඥ ප්‍රිමාල් අමරසිංහ මහතා පෙනී සිටියේය.

# කැලණියේ සිසුන්ට කලිසම් රෙදි නෑ

## මවුපියන්ගෙන් මැසිවිලි

**(කැලණිය ලාල් එස්. කුමාර)**

**පාසල් විවෘත කිරීමත් සමගම සිසුන් සඳහා ලබාදෙන නිල ඇඳුම්වලට අදාළ කමිස රෙදි ලැබුණ නමුත් කලිසම් රෙදි නොලැබුණ බව කැලණිය අධ්‍යාපන කොට්ඨාසයේ බොහෝ පාසල්වල මවුපියෝ පවසති.**

පාසල් දරුවන් සඳහා නොමිලේ ලබාදෙන නිල ඇඳුම් බෙදදීම ඉකුත් දිනවල සිදුවූ බවත් සිසුවියන් සඳහා නියමිත රෙදි ප්‍රමාණය ලැබුණු නමුත් සිසුන් වෙනුවෙන් ලබාදෙන කලිසම් රෙදි නොලැබුණු බවත් මවුපියෝ පැවැසූහ.

මීට පෙර වසරවල නිල ඇඳුම් සඳහා වවුචර් මගින් මුදල් ලබා දුන් බව එසේ මුදල් ලබාදීම තුළින් දරුවන්ට අවශ්‍ය පරිදි නිල ඇඳුම් සකස් කර ගැනීම සිදුකළ බවත් ඒ අයුරින් වවුචර් ලබාදීමට කටයුතු කරන්නේ නම් ඊට බොහෝ මවුපියන් කැමති බවත් ඔව්හු පවසති.

පාසල් දරුවන් සඳහා ලබාදෙන කලිසම් රෙදි නොලැබීම පිළිබඳව කැලණිය අධ්‍යාපන කොට්ඨාස අධ්‍යක්ෂ ඩී.එස්.එස්. ලියනගේ මහත්මිය මෙසේ පැවසුවාය.

## තවම රෙදි ඇවිත් නෑ: ආව ගමන් බෙදනවා

### කැලණිය කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ

කලිසම් රෙදි තවම සැමතැනටම ඇවිල්ලා නැහැ. ඒවා පැමිණි විගස බෙද දෙනවා'' යැයි ඇය පැවසුවාය.

# ඉඩම් ආරවුලකට ගෙහිමියා මරා බිරිඳට බරපතළ තුවාල කිරීමේ සිද්ධිය: විත්තිකරුවන්ට නිදහස

**(මීගමුව අධිකරණ ඩබ්ලිව්. කීර්ති)**

**ඉඩම් ආරවුලක් මත තම ඥාතියාගේ ගෙළ කඩුවකින් කපා ඝාතනය කිරීම සහ ඔහුගේ බිරියට බරපතළ තුවාල සිදුකළැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන් අධිචෝදනා ලැබූ විත්තිකරුවන් දෙදෙනකුට එරෙහි චෝදනාව ඔප්පු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැතිවීම සැලකිල්ලට ගත් මීගමුව පූර්වගාමී මහාධිකරණ විනිසුරු අමල් රණරාජ මහතා විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කිරීමට පෙරේදා (31) නියෝග කළේය.**

නිදොස් කොට නිදහස් ලැබූ විත්තිකරුවන් වූයේ වත්තල හුණුපිටියේ පදිංචිකරුවන් වන පී.ඒ. චන්ද්‍රසිරි නොහොත් වයිපා සහ ඒ. සුනිල් කුමාර චන්ද්‍රසිරි නැමැත්තන්ය.

2003 ඔක්තෝබර් මස වත්තල හුණුපිටියේ පදිංචිව සිටි බී. එම්. දීපාල් චන්දන බස්නායක යන අය තියුණු අවිවලින් කපා කොටා ඝාතනය කිරීම, නීතිවිරෝධි රැස්වීමක සාමාජිකයන් වීම, මියගිය අයගේ බිරියට බරපතළ තුවාල සිදු කිරීම මරණකරුගේ නිවසට අයතු ලෙස ඇතුළුවීම ඇතුළු අධිචෝදනා 7ක් යටතේ විත්තිකරුට එරෙහිව නීතිපතිවරයා විසින් නඩු පවරා තිබිණි. මෙම ඝාතන සිද්ධියේ ප්‍රධාන විත්තිකරු වන එල්.ඩබ්ලිව්.පී. ගාමිණී නමැත්තා නඩු විභාගයට ප්‍රථම මියගොස් සිටි බව ද නඩු විභාගයේ දී හෙළිදරව් විය. එම නඩු විභාගයේ දී ඉතිරි විත්තිකරුවන් දෙදෙනාට එරෙහිව හා අනිකුත් චෝදනා ඝාතන සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි නොමැතිවීම සැලකිල්ලට ගත් මහාධිකරණ විනිසුරුවරයා විත්තිකරුවන් දෙදෙනා නිදහස් කරන ලදී. රජයේ අධිනීතිඥ ගයානි වැගොඩපොළ මහත්මිය පැමිණිල්ල මෙහෙය වීය. විත්තිය වෙනුවෙන් නීතිඥ ගයානි වාසනා ජයසිංහ සහ ජ්‍යෙෂ්ඨ නීතිඥ ඉඳුනිල් ලසන්ති පෙරේරා යන මහත්මීහු පෙනී සිටියහ.

# ගම්පහ උසාවියෙන් ලිපි ගොනුවක් ඉස්සූ සේවකයාට ඇප

**(ගම්පහ අධිකරණ - ටෝනි කරුණානායක)**

**ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණ ලේඛනාගාරයෙන් නඩු ගොනුවක් සොරකම් කිරීමේ චෝදනා මත රිමාන්ඩ් භාරයේ පසුවූ අධිකරණ සේවකයා රුපියල් 50,000ක ශරීර ඇප මත මුදහරින ලෙසට ගම්පහ අතිරේක මහේස්ත්‍රාත් ආර්.එස්.එම්. මහේන්ද්‍ර රාජා මහතා පෙරේද 31 නියම කළේය.**

ගම්පහ වැඩ බලන මහේස්ත්‍රාත් වසන්තා ගුණසේකර මහත්මිය ඉදිරියේ දී ඉකුත් 31 වැනිද ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ පැවැති හඳුනා ගැනීමේ පෙරෙට්ටුවේ දී පැමිණිලිකාර සාක්ෂිකරු විසින් සැකකරු හඳුනාගත් බවට අධිකරණයේ දී සඳහන් වූ අතර නැදුන්ගමුව, කුරුඳුවත්ත ප්‍රදේශයේ පදිංචි සැකකාර අධිකරණ සේවකයා මෙසේ ඇප මත මුදහැරුණි.

කසිප්පු සන්තකයේ තබා ගැනීමේ චෝදනා මත ගම්පහ පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිපත් කර තිබූ සැකකරුවෙකු චෝදනා ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඇපමත නිදහස් කර තිබේ. එම නඩු ගොනුව සොරාගත් අධිකරණ සේවකයා එම කසිප්පු නඩුවේ සැකකරුගේ නිවසට ගොස් නඩු ගොනුව පෙන්වා නඩු ගොනුව අස්ථාන ගත කිරීම සඳහා මුදල් ඉල්ලා ඇති බවත් ඒ සම්බන්ධයෙන් ගම්පහ පොලිසියට ලද පැමිණිල්ලක් මත නඩු ගොනුව සැකකාර අධිකරණ සේවකයාගේ නිවසේ තිබිය දී සොයාගත් බවත් පොලිසිය අධිකරණය හමුවේ පැවැසීය.

මැයි මස 12 වෙනිදට නඩුව නැවත කැඳවීමට නියම කෙරුණි.

# මීගමු රෝහලේ සත් මහල් ගොඩනැගිල්ලේ අලුත්වැඩියාව නැවතිලා

**(කොච්චිකඩේ වාර්තාකරු)**

**මීගමුව දිසා මහ රෝහලේ සත්මහල් ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් අලුත්වැඩියා කිරීම සඳහා කොටස් වශයෙන් රජයෙන් කෝටි ගණනක මුදල් වැය කළ නමුත් මෙතෙක් එම ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු සම්පූර්ණ නොකර වසර ගණනක් තිස්සේ නවතා ඇතැයි රෝහල් ආරංචිමාර්ග පවසයි.**

රෝහල තුළ හෘද රෝග අංශයක් ආරම්භ කර ඇතත් ඒ සඳහා සුදුසු වාට්ටුවක් නොමැති අතර වකුගඩු රෝගීන් සඳහා ශල්‍ය වෛද්‍ය ගාරයක් ඇතත් අවශ්‍ය උපකරණවල හිඟයක් පවතින බව ද පැවැසේ.

දැනට පවතින මෘත ශරීරාගාරය ඉතා කනගාටුදායක තත්ත්වයක පවතින අතර අලුත් මෘත ශරීරාගාරයක වැඩ අරම්භ කර ඇතත් තවමත් එය සම්පූර්ණ කර නොමැත.

අධිකරණ වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සිට ඒ හා සම්බන්ධ වන සැම නිලධාරියකුම මැසිවිලි නගන අතර, රෝහලේ ඇතැම් කාර්ය මණ්ඩලවල හිඟතාවක් පැවැතීම නිසා රෝගීන් පීඩාවට පත්වන බව ද පැවැසේ.

මේ සම්බන්ධව රෝහල් පරිපාලනයෙන් විමසූවිට පැවැසුවේ මීගමුව රෝහල දිසා මහ රෝහලක් වශයෙන් පැවතිය ද බස්නාහිර පළාත් සභාවට අනුයුක්තව තිබූ රෝහලක් නිසා රෝහලට අවශ්‍ය පහසුකම් සලසා ගැනීමේ දී බොහෝ දුෂ්කරතා ඇති වූ බවය. එහෙත් මේවන විට රෝහල මධ්‍යම රජයට පවරාගෙන ඇති බැවින් සෞඛ්‍ය අමාත්‍යාංශය සමග සෘජුව සාකච්ඡා කර ප්‍රශ්න විසඳගැනීමට හැකි බවත් දැනටමත් එය ආරම්භ කර තිබෙන බවත් රෝහලේ සහකාර අධ්‍යක්ෂවරයා පැවසීය.

# නිට්ටඹුවේ කඩ 3 ක් හොරු කඩලා

## ලක්ෂ 3 ක බඩු අරගෙන

**(වතුපිටිවල එස්.යූ.ඩබ්ලිව්.කේ. ජයවර්ධන)**

**නිට්ටඹුව කෝන්ගස්දෙණිය හන්දියේ නවගමුව හා කළල්පිටිය යන ප්‍රදේශවල පිහිටි පූජා භාණ්ඩ අලෙවි සලක් ඇතුළු කඩ 3ක් කඩා එහි තිබූ රුපියල් ලක්ෂ 3ක් පමණ වටිනා භාණ්ඩ සහ මුදල් ඊයේ (01) ද අලුයම සොරාගෙන ඇතැයි නිට්ටඹුව පොලිසිය කියයි.**

සොරුන් විසින් කඩා දමන ලද අලෙවිසල් තුනම නිට්ටඹුව පොලිසියට කිලෝ මීටර 1 1/2ක් පමණ නුදුරින් පිහිටා ඇති බව ද පොලිසිය කියයි.

නිට්ටඹුව කෝන්ගස්දෙණිය හන්දියේ පිහිටි පූජා භාණ්ඩ අලෙවිසලෙහි තිබී ඇති අටපිරිකර 20ක් පමණ ද සිවුරු, අඳන, ඇතුළු පූජා භාණ්ඩ රැසක් ද සෙසු අළෙවිසල් දෙකෙන් මුදල්, සිගරැට් සහ ජංගම දුරකතන කාඩ්පත් ද සොරාගෙන ඇති බව පොලිස් පරීක්ෂණවල දී හෙළිවිය.

පස්යාල කලල්පිටියේ පිහිටි අලෙවිසලේ යකඩ අල්මාරිය කඩා ඇති සොර කල්ලිය එහි තිබූ රුපියල් 70,000ක මුදලක් සොරාගෙන ගොස් ඇති බවද පොලිස් පරීක්ෂණවල දී අනාවරණය විය. මෙම වෙළෙඳසල් තුනේම ඉදිරිපස දෙරවල්වල ඉබි අගුල්, යතුරු තහඩු සහ සොයිබ කඩා ඇත.

වාහනයකින් පැමිණ ඇති සොරකල්ලියක් මෙම අලෙවිසල් තුනම කඩා ඇති බවට පොලිසිය අනුමාන කරයි. පස්යාල කලල්පිටියේ කොළඹ-මහනුවර මහා මාර්ගයට මුහුණලා පිහිටි තවත් අලෙවිසලක් කැඩීමට උත්සාහ කිරීමේදී එය තුළ නිදාගෙන සිට ඇති පිරිස අවදිවීම නිසා සොරකල්ලියේ එම ඉලක්කය වැරදී ගොස් ඇත.

නිට්ටඹුව මූලස්ථාන පොලිස් නිල සුනඛ අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ආර්.ඒ.ඒ.ආර්. රත්නසිරි මහතාගේ උපදෙස් මත එහි පොලිස් කොස්තාපල් (78626) ජී.ආර්. ඉන්දික ප්‍රසන්න ගෝනාවල මහතාගේ මෙහෙයැවීම යටතේ 'ඔලී' නමැති පොලිස් නිල සුනඛයා ද සොරුන් කඩන ලද වෙළෙඳසල් තුනට අදළ පොලිස් පරීක්ෂණ සඳහා අද (01) දහවල් යොදගනු ලැබුණි.

සොරාගෙන ගිය පූජා භාණ්ඩ, මුදල් සහ සෙසු භාණ්ඩ හා සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඉන්දික ද සිල්වා සහ අත්තනගල්ල සහකාර පොලිස් අධිකාරි ප්‍රභාත් දයානන්ද යන මහත්වරුන්ගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ සහ නිට්ටඹුව මූලස්ථාන පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අජිත් කුමාර පිටිගල මහතාගේ මෙහෙයැවීමෙන් එහි අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රභාත් අසේල පෙරේරා, පොලිස් සැරයන් (31973) ටී.බී. රත්නායක, කොස්තාපල් (94504) පනන්වල යන නිලධාරීහු පරීක්ෂණ පවත්වති.

# ගම්පහට නවීන ධීවර අලෙවි සලක්



අමාත්‍යවරුන්, පුරපති සහ නිලධාරීන් නව වෙළෙඳසල නිරීක්ෂණය කළ අයුරු

**(ගම්පහ තිලකරත්න දිසානායක)**

**දිවයිනෙහි සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ධීවර සංස්ථාවෙහි නවීන අලෙවි සල් ජාලයක් ඇති කිරීම යටතේ එහි පළමුවැන්න ගම්පහ නගරයේ දී ආරම්භ කිරීම ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මහතාගේ ප්‍රධානත්වයෙන් ඉකුත්ද සිදු කෙරිණි.**

මෙහිදී ධීවර රාජ්‍ය අමාත්‍ය කාංචන විජේසේකර මහතා සඳහන් කර සිටියේ, දැනට පවතින ධීවර අලෙවිසල් 93 නවීකරණය කිරීම ඇතුළු අලුතින් වෙළෙඳසල් ආරම්භ කිරීම පිණිස රුපියල් මිලියන 500 ක මුදලක් වෙන්ව ඇති බවය.

ගම්පහ නව අලෙවිසැල විවෘත කිරීමේ අවස්ථාවට ගම්පහ පුරපති එරංග සේනානායක, ගම්පහ අතිරේක දිසාපති සුගත් කිත්සිරි, ධීවර සංස්ථාවේ සභාපති විශ්‍රාමික මේජර් ලලිත් දවුලගල, එහි කළමණාකාර අධ්‍යක්ෂ ක්‍රිෂාන්ත රත්නවීර, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) ඩබ්ලිව්.ජී. යසන්ත යන මහත්වරුන් ඇතුළු නිලධාරීහු එක්ව සිටියහ.

# විස පොල්තෙල් සොයා මෙහෙයුමක් ගම්පහෙන් ඇරැඹෙයි

**(වාරණ ආනන්ද ඉ ජයකොඩි)**

**ගම්පහ දිස්ත්‍රික්කය තුළ පොල්තෙල් සාම්පල ලබා ගැනීම අද (02) වැනිදා සිට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් සිදුකරනු ලබන බව ගම්පහ දිස්ත්‍රික් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය කියයි.**

කොවිඩ් වසංගතය හමුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කොතරම් රාජකාරිමය වශයෙන් පීඩාකාරී තත්ත්වයක සිටියත් විෂ රසායනික ද්‍රව්‍ය අඩංගු පොල් තෙල් ගම්පහ දිස්ත්‍රික්කයේ වෙළෙඳ සල් තුළ තිබේ ද යන්න පරීක්ෂණ පැවැත්වීම සඳහා අද (02) සිට පොල් තෙල් සාම්පල ලබා ගැනීම සිදු කරන බව ද ගම්පහ දිස්ත්‍රික් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක එච්.බී. ගුණතිලක මහතා ඊයේ (01) උදෑසන පැවැසීය.

රේගුවෙන් සීල් කර තිබූ පොල් තෙල් බවුසර් දෙකක් දංකොටුව ප්‍රදේශයට ගෙන ගොස් සඟවා තිබිය දී පොලීසිය භාරයට ගෙන ඇති බවත්, මේ තත්ත්වය සලකා බලා මේ අයුරින් විෂ රසායනික ද්‍රව්‍යය අඩංගු පොල් තෙල් ගම්පහ දිස්ත්‍රික්කයේ වෙළඳ සල් තුළට නිකුත් වී ඇති බවට සැකයක් මතුව ඇති හෙයින් එසේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් අද (02) සිට පොල් තෙල් සාම්පල ලබා ගැනීම කරන බවත් ඒ මහතා කීය.

එසේ ලබා ගන්නා සාම්පල රජයේ රස පරීක්ෂකවරයා වෙත යවන බවත්, එම පරීක්ෂණ අනුව විෂ රසායනික ද්‍රව්‍යය අඩංගු පොල් තෙල් වෙළෙඳහල්වල තිබුණහොත් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවත් ගම්පහ දිස්ත්‍රික් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වැඩිදුරටත් කියා සිටියේය.

ඉදිරියේ එන සිංහල-හින්දු අලුත් අවුරුදු උත්සවය සඳහා කූට ව්‍යාපාරිකයන් විසින් එසේ විෂ රසායනික ද්‍රව්‍යය අඩංගු පොල් තෙල් වෙළෙඳ පොළට නිකුත් කිරීමට බොහෝදුරට ඉඩ ඇති හෙයින් එම තීරණය ගත් බවත් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා කීය.

# ෆේස් බුක් දැන්වීම් දමා ලක්ෂ 45කට ඇත්දළ කොටසක් විකුණන්න ගිහින්

## සැකකරුට ඇප

**(ගම්පහ අධිකරණ ටෝනි කරුණානායක)**

**මුහුණු පොතේ දැන්වීමක් පළකර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට රුපියල් ලක්ෂ 45කට ඇත් දළ කොටසක් විකිණීමට සූදනම් වූ සැකකරුවකු රුපියල් ලක්ෂ 05ක ශරීර ඇපයක් මත මුදහරින ලෙස ගම්පහ අතිරේක මහේස්ත්‍රාත් ආර්.එස්.එම්. මහේන්ද්‍ර රාජා මහතා ඊයේ (01) නියම කළේය.**

ගම්පහ උඩුගම්පොළ පේඩිපොළ ප්‍රදේශයේ පදිංචිකරුවකු වන ජේ.ඒ. සමුධ නවීන් ජයසූරිය නමැති සැකකරුට මෙසේ ඇප නියම කෙරුණි.

සැකකරු සන්තකයේ තිබියදී අත්අඩංගුවට ගෙන නඩු භාණ්ඩයක් ලෙස අධිකරණයට ඉදිරිපත් කෙරුණු ඇත් දළ යැයි කියන කොටස් කැබැල්ල කුමන විශේෂයේ සතෙකුගේ ද යන්න සහ එම සත්වයාගේ කුමන කොටසක්ද යන්න පිළිබඳ වාර්තාවක් ලබන මැයි මස 21 වැනිදට පෙර ලබා දෙන ලෙස රජයේ ජාතික කටයුතු භාර අධ්‍යක්ෂවරයාට නියම කළ අතර අධිකරණයට ඉදිරිපත් කෙරුණු ඇත් දළ යැයි කියන සත්ව කොටස කෞතුකාගාර අධ්‍යක්ෂක වෙත බාර දෙන ලෙස මහේස්ත්‍රාත්වරයා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට නියම කළේය.

සැකකරු මුහුණු පොතේ පළකර තිබූ දැන්වීමට අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ වැටලීම් අංශයේ නිලධාරීන් එම ඇත් දළ කොටස ලක්ෂ 45කට මිලට ගැනීමට ගැනුම්කරුවකු ලෙස සැකකරුට ජංගම දුරකතනයෙන් කතා කර ඇත. එම ඇත් දළ කොටස රැගෙන උඩුගම්පොළ ඇවිදින මංතීරුව අසලට පැමිණ සිටි සැකකරු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වනසත්ව අඩවි සහකාර එන්.එස්. නිසංසල මහතා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගනු ලැබූ බව අධිකරණයේදී සඳහන් විය. ඇප නියම වූ සැකකරුට මැයි මස 21 වැනිද නැවත අධිකරණයේ පෙනී සිටින ලෙසට නියම කෙරුණි.

# මීරිගම ලයිට් නැති ගෙවල් 730ක්

**(මීරිගම විශේෂ පුෂ්පකුමාර මල්ලවආරච්චි)**

**විවිධ හේතු නිසා විදුලි බලය ලබා ගැනීමට නොහැකිවූ නිවාස 730 ක් මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින බව සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී හෙළිදරව් විය.**

'සැමට විදුලිය' වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සිදුකළ සමීක්ෂණයකින් අනතුරුව ඒ බව හෙළිදරව් වී තිබේ.

සමෘද්ධිලාභීන් පදිංචි නිවාස 419 ක්, සමෘද්ධිය නොලබන හා සමෘද්ධි දීමනාව ලබාගැනීම සඳහා පොරොත්තු ලේඛනයේ සිටින අඩු ආදයම්ලාභී පවුල් වෙසෙන නිවාස 202 ක් මේ අතර වේ. එම දෙකොට්ඨාසයට අයත් නොවන වැඩි ආදයම් සහිත පවුල් පදිංචි නිවාස 109 ක්ද තවමත් විදුලිය ලබාගෙන නැතැයි මෙහිදී අනාවරණය විය.

විදුලිබල මණ්ඩලය මේ සම්බන්ධයෙන් කළ සොයා බැලීමේදී නිවාස 43 ක් සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් උද්ගතව ඇතැයි මීරිගම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට දැන්වීය.

විදුලිය ඉල්ලුම්කරුවන්ගේ ලිපිනයන්හි වෙනස්වීම් , විදුලිය ඉල්ලුම්කරු ඉඩම් හිමියා වන අවස්ථාවන්හිදී සමෘද්ධිලාභියා ලෙස පවුලේ වෙනත් කෙනෙකු සිටීම ආදි හේතු මත මෙම ගැටලු ඇතිවී ඇතැයි ද එම ගැටලුකාරි තත්ත්වයන් විසඳගැනීමට අවශ්‍ය ලිපිලේඛන සකස් කර දෙන බවද මීරිගම ප්‍රාදේශීය ලේකම් ඩබ්ලියු.පී. ප්‍රසාද් ඉන්දික මහතා එම කමිටුවට දැනුම් දුන්නේය. සම්බන්ධීකරණ කමිටුවේ සභාපති ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කෝකිලා ගුණවර්ධන මහත්මිය සඳහන් කළේ සියලු සමෘද්ධිලාභීන් හා පොරොත්තු ලේඛනයේ සඳහන් සියලු නිවාස සඳහා විදුලිය ලබාදීම මෙම වැඩපිළිවෙළේ අරමුණ බවයි. ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදළ නිලධාරීන්ගෙන් ඇය ඉල්ලා සිටියාය.

# බීලා ගිය දෙදෙනෙක් 50,000ක් දඩකයි

**(වාරණ ආනන්ද ඉ ජයකොඩි)**

**මත්පැන් පානය කොට වාහන පදවාගෙන ගිය බවට වරද පිළිගත් රියදුරන් දෙදෙනකුට අත්තනගල්ල අංක 02 මහේස්ත්‍රාත් තරංගා රාජපක්ෂ මහත්මිය පෙරේද (31) එක් අයෙකුට රුපියල් විසිපන් දහස බැගින් දෙදෙනාට රුපියල් පනස් දහසක දඩ නියම කර දෙදෙනාගේම රියදුරු බලපත්‍ර මාස තුනකට අත්හිටුවීමටද නියෝග කළාය.**

පී.ඩී.ජී.ඇස්. ගමගේ හා ඒ.ඇම්. නිහාල් සුමතිපාල යන දෙදෙනෙකුට එසේ දඩ නියම කෙරිණි.

පල්ලෙවෙල පොලීසියේ නඩු මෙහෙයුම් අංශයේ පොලිස් කොස්තාපල් මහින්ද කුමාර මහතා පැමිණිලි මෙහෙය විය.

පල්ලෙවෙල පොලිසියේ රථවාහන අංශය වැටලීම් සිදු කර නඩු පවරා තිබුණි.